# 5

# විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

## 5.1 සමස්ත නිරීක්ෂණ

හිතකර දේශීය හා විදේශීය වාතාවරණයන් සහ මූල්‍ය ගිණුම වෙත වූ ඉහළ ලැබීම් තුළින් ගෙවුම් තුලනය මත වූ පීඩනය ලිහිල් වීම හේතුවෙන් 2017 වසර තුළ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ක්‍රමයෙන් වර්ධනය විය. වසර තුළ දී විදේශීය ජංගම ගිණුම පසුබෑමකට ලක් වුවද, ආයෝජක විශ්වාසය වැඩිදියුණු වීම සහ දේශීය සාර්ව ආර්ථික තත්ත්වයන් වඩා ස්ථායී වීම, මූල්‍ය ගිණුම වෙත සැලකිය යුතු ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම සඳහා උපකාරී විය. වෙළඳ භාණ්ඩ අපනයනවල සිදු වූ කැපී පෙනෙන වර්ධනය අභිබවමින්, ආනයන ඉහළ යෑම, පොලී ගෙවීම් ඉහළ යෑම, සංචාරක ඉපැයීම් මන්දගාමී වීම සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල අඩු වීම හේතුවෙන් වසර තුළ දී ජංගම ගිණුමේ හිඟය පුළුල් විය. කෙසේ වුවත්, විදේශීය සෘජු ආයෝජන, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ හා කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ආයෝජන මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙත වූ අනෙකුත් ආයෝජන වශයෙන් මූල්‍ය ගිණුම වෙත වූ විදේශ විනිමය ලැබීම්, ජංගම ගිණුමේ හිඟය පියවා ගැනීමට උපකාරී වූ අතරම, දළ නිල සංචිත මට්ටම නැවත ඉහළ නංවා ගැනීමට සහ වෙළඳපොළ මත වඩාත් පදනම් වූ විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් පවත්වාගෙන යෑම සඳහා උපකාරී විය.


වෙළඳ හා ප්‍රාථමික ආදායම් ගිණුම්වල හිඟයයන් පුළුල් වීම, සංචාරක ඉපැයීම් මන්දගාමී වීම සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඩු වීම හේතුවෙන් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ජංගම ගිණුමේ හිඟය 2016 වසරේදී පැවති සියයට 2.1 ක සිට 2017 වසරේදී සියයට 2.6 ක් දක්වා පුළුල් විය. 2017 වසරේදී ඉලක්කම් දෙකක අගයකින් යුත් වර්ධනයක් වාර්තා කරමින් අපනයන ඉපැයීම් ප්‍රමාණය මෙතෙක් වාර්තා වූ ඉහළම අගය සනිටුහන් කළ නමුත් ප්‍රධාන වශයෙන්ම, ඉන්ධන, සහල් සහ රත්‍රන් ආනයනය ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේදී වාර්තා වූ සියයට 10.9 ක සිට 2017 වසරේදී සියයට 11.0 ක් දක්වා පුළුල් විය. දියුණු රටවල් සියල්ලෙහිම පාහේ ආර්ථික වර්ධනය යහපත් වීම, යුරෝපා සංගමයේ විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී. එස්. පී. ප්ලස් සහනය) නැවත ස්ථාපනය කිරීම සහ ශක්තිමත් ආයතනික හා ප්‍රතිපත්ති සහාය හේතුවෙන් අපනයන ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන් අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් දේශීය සහල් නිෂ්පාදනය ප්‍රමාණවත් නොවීම මත සහල් ආනයනය ඉහළ යෑම සහ ජල විදුලිබල උත්පාදනය පහත වැටීම හේතුවෙන් ඉන්ධන ආනයනය ඉහළ යෑමෙන්, සමස්ත ආනයන ප්‍රමාණය ඉහළ ගියේය. 2017 වසරේදී සංචාරක ඉපැයීම් වර්ධනය මධ්‍යස්ථ වීම සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පහළ යෑම ජංගම ගිණුම මත අයහපත් බලපෑමක් ඇති කළේය. ගුවන් යානා ධාවන පථය නැවත සකස් කිරීමේ කටයුතු සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මෙහෙයුම් කටයුතු අර්ධ වශයෙන් සිදු කිරීම මෙන්ම ඩෙංගු රෝග ව්‍යාප්තිය ඉහළ යෑම හේතුවෙන් වසර තුළ දී සංචාරක ක්ෂේත්‍රයේ මන්දගාමීත්වයක් වාර්තා වූ අතර, එය 2017 වසරේදී සේවා අපනයන මන්දගාමී වීමට හේතු විය. මැදපෙරදිග ආර්ථිකයන්හි අඛණ්ඩ මන්දගාමී ක්‍රියාකාරිත්වය සහ පුහුණු ශ්‍රම සංක්‍රමණවල සිදු වූ අඩු වීම හේතුවෙන් 2017 වසරේදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල අඩු වීමක් වාර්තා කළේය.

එසේ නමුත්, ඉහළ විදේශ විනිමය ගෙවීම් හේතුවෙන් 2017 වසරේ පළමු කාර්තුවේදී පීඩනයට ලක් වූ ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම, එතැන් සිට සැලකිය යුතු ලෙස යහපත් වර්ධනයක් වාර්තා කළේය. මෙතෙක් වාර්තා වී ඇති ඉහළම අගය අභිබවා යමින් විදේශීය සෘජු ආයෝජන 2017 වසරේදී කැපී පෙනෙන ලෙස වර්ධනය විය. ප්‍රධාන වශයෙන්ම වසරේ අවසාන කාර්තු තුන තුළදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජනවල දක්නට ලැබුණු කැපී පෙනෙන ඉහළ යෑම ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම කෙරෙහි හිතකර බලපෑමක් ඇති කළේය. මීට අමතරව, එකොළොස්වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සහ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම මගින් වූ ලැබීම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි වාරික දෙකක් මගින් වූ ලැබීම් සහ රජය හා පෞද්ගලික අංශය වෙත වූ අනෙකුත් විදේශ විනිමය ලැබීම් හේතුවෙන් මූල්‍ය ගිණුම තවදුරටත් වර්ධනය විය. මූල්‍ය ගිණුමෙහි මෙම වර්ධනයන් ගෙවුම් තුලනයේ සමස්ත ක්‍රියාකාරිත්වය තුළින් ද පිළිබිඹු වූ අතර අඛණ්ඩව වසර දෙකක් හිඟ යයන් වාර්තා කිරීමෙන් අනතුරුව සමස්ත ශේෂය 2017 වසරේදී එ.ජ. ඩොලර් බිලියන 2.1 ක කැපී පෙනෙන අතිරික්තයක් වාර්තා විය.

වසර තුළ දී මහ බැංකුවේ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය, විදේශ විනිමය සඳහා වන ඉල්ලුම සහ සැපයුම මත පදනම්ව රුපියලෙහි බාහිර අගය වඩා නම්‍යශීලීව තීරණය වීමට ඉඩ හැරීම කෙරෙහි යොමු විය. ශ්‍රී ලංකා මහ බැංකුව රුපියල මත වූ අවප්‍රමාණය වීමේ පීඩනයට ප්‍රතිචාර වශයෙන් වසරේ පළමු කාර්තුවේදී සැලකිය යුතු ප්‍රමාණයක විදේශ විනිමය ද්‍රවශීලතාවයක් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සපයන ලදී. මෙම සැපයීම, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් ආයෝජන ඉවත් කර ගැනීම හේතුවෙන් විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඇති වූ ද්‍රවශීලතා හිඟය හමුවේ රුපියල මත වූ අවප්‍රමාණය වීමේ පීඩනයට ප්‍රතිචාර වශයෙන් සිදු කරන ලදී. එතැන් සිට, ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ සංචිත ගොඩනැගීම සඳහා විදේශ විනිමය මිලදී ගැනීමට සීමා වෙමින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීමේ සිය උපායමාර්ගය වෙනස් කළේය. රට තුළින් ණය බර ඇති නොවන මූලාශ්‍ර මත පදනම්ව සංචිත මට්ටම ඉහළ නංවා ගැනීමට සහ 2017 වසර අවසාන වන විට රටෙහි දළ නිල සංචිත මට්ටම ආනයනික මාස 4.6 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 8.0 ක් දක්වා වැඩි කර ගැනීමට මහ බැංකුවට හැකි විය. තවදුරටත්, ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ විනිමය වෙළඳපොළේ විදේශ සංචිත ගොඩනැගීම සඳහා පමණක් මැදිහත් වීමේ උපායමාර්ගය තුළින් ඇඩි විචලනයන් වළකාලමින් විනිමය අනුපාතිකයේ හැසිරීම වඩාත් සුමට කිරීමට හැකි විය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින්, 2017 වසරේදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.0 කින් පමණක් අවප්‍රමාණය වෙමින් සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතුණි. රටෙහි විදේශීය තරගකාරිත්වයෙහි ඉහළ යෑම පිළිබිඹු කරමින් 2017 වසර අවසාන වන විට මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකද ක්‍රමයෙන් අවප්‍රමාණය වෙමින් දර්ශක අංක 100 මට්ටම දක්වා ළඟා විය.

2017 වසරේදී විදේශීය අංශය යම් ධනාත්මක වර්ධනයක් ළඟා කර ගනු ලැබුවද, වෙළඳ ශේෂය වර්ධනය කර ගැනීම මගින් ජංගම ගිණුමේ වර්ධනයක් ඇති කර ගැනීම සහ විදේශීය ආයෝජන ඉහළ නංවා ගැනීම තුළින් විදේශීය අංශයෙහි ආරක්ෂණ ගොඩනගා ගැනීම, බාහිර කම්පනයන් සඳහා රටට ඇති අවදානම අඩු කිරීමට ඉතා වැදගත් වේ. විදේශීය ජංගම ගිණුමෙහි වර්ධනය වෙළඳ හිඟය අඩු වීම මත විශාල වශයෙන් රඳා පවතින බැවින් අපනයන වර්ධනය කර ගැනීම සඳහා වූ පුළුල් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවක් ලෙස පවතී. ඒ අනුව, පිරිවැය අවම කිරීම ඉලක්ක කර ගනිමින් භාණ්ඩ අපනයන විවිධාංගීකරණය කිරීම හා ඵලදායීතාව ඉහළ නංවා ගැනීම සහ අපනයන සඳහා නව වෙළඳපොළවල් වෙත යොමු වීම අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා වැදගත් වනු ඇත. රට සතු පුහුණු මානව සම්පතින් ප්‍රතිලාභ ලබා ගනිමින් දැනට හඳුනා නොගත් නමුත් විභවතාවක් පවතින සේවා අපනයනය වර්ධනය කර ගැනීම සඳහාද ප්‍රතිපත්ති දැක්ම යොමු කළ යුතුව ඇත. විශේෂයෙන්ම 2019-2023 කාලපරිච්ඡේදයේදී, ණය සේවාකරණය ඉතා ඉහළ අගයක් ගන්නා තත්ත්වයක් තුළ ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීම සඳහා සහ

**5.1 රූප සටහන**
**ගෙවුම් තුලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.1 සංඛ්‍යා සටහන**

**ගෙවුම් තුලනයෙහි විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් මිලියන | | රුපියල් මිලියන | |
|---|---|---|---|---|
| | 2016 (අ) | 2017 (ආ) | 2016 (අ) | 2017 (ආ) |
| **ජංගම ගිණුම (ශුද්ධ)** | **-1,742** | **-2,309** | **-254,159** | **-350,695** |
| **වෙළඳ ගිණුම** | **-8,873** | **-9,619** | **-1,293,627** | **-1,466,133** |
| අපනයන | 10,310 | 11,360 | 1,500,766 | 1,732,440 |
| ආනයන | 19,183 | 20,980 | 2,794,393 | 3,198,572 |
| **සේවා (ශුද්ධ)** | **2,879** | **3,338** | **419,338** | **508,790** |
| ලැබීම් | 7,138 | 7,760 | 1,039,283 | 1,182,738 |
| ගෙවීම් | 4,259 | 4,421 | 619,945 | 673,949 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-2,202** | **-2,355** | **-319,652** | **-357,668** |
| ලැබීම් | 127 | 160 | 18,499 | 24,414 |
| ගෙවීම් | 2,329 | 2,515 | 338,151 | 382,082 |
| **ද්විතීයික ආදායම් (ශුද්ධ)** | **6,453** | **6,327** | **939,782** | **964,316** |
| ද්විතීයික ආදායම් : ලැබීම් | 7,260 | 7,175 | 1,057,281 | 1,093,607 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 7,242 | 7,164 | 1,054,489 | 1,091,972 |
| රජයේ සංක්‍රාම | 19 | 11 | 2,792 | 1,634 |
| ද්විතීයික ආදායම් : ගෙවීම් | 807 | 848 | 117,498 | 129,291 |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **25** | **11** | **3,745** | **1,667** |
| ප්‍රාග්ධන ගිණුම : ලැබීම් | 56 | 40 | 8,269 | 6,125 |
| ප්‍රාග්ධන ගිණුම : ගෙවීම් | 31 | 29 | 4,525 | 4,458 |
| **ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-1,717** | **-2,298** | **-250,414** | **-349,028** |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-2,182** | **-2,184** | **-317,181** | **-336,145** |
| **සෘජු ආයෝජන : වත්කම්** | **237** | **72** | **34,476** | **8,162** |
| **සෘජු ආයෝජන : වගකීම්** | **897** | **1,375** | **131,839** | **210,361** |
| **විවිධ ආයෝජන : වත්කම්** | **...** | **...** | **-1** | **-12** |
| ණය සුරැකුම්පත් | ... | ... | -1 | -12 |
| **විවිධ ආයෝජන : වගකීම්** | **993** | **1,772** | **144,665** | **271,168** |
| හිමිකම් | 24 | 359 | 3,684 | 54,606 |
| ණය සුරැකුම්පත් | 969 | 1,413 | 140,981 | 216,562 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන : වත්කම්** | **266** | **102** | **38,245** | **16,297** |
| මුදල් සහ තැන්පතු | 5 | 78 | 538 | 12,094 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -118 | 54 | -17,114 | 8,322 |
| අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 379 | -31 | 54,821 | -4,119 |
| **අනෙකුත් ආයෝජන : වගකීම්** | **323** | **1,981** | **47,806** | **303,543** |
| මුදල් සහ තැන්පතු | -609 | -228 | -87,671 | -33,698 |
| ණය | 793 | 1,839 | 114,419 | 280,407 |
| මහ බැංකුව | -123 | 184 | -17,234 | 28,630 |
| තැන්පතු භාරගන්නා ආයතන | -507 | 271 | -75,495 | 40,156 |
| රජය | 1,287 | 1,215 | 188,365 | 185,577 |
| අනෙකුත් අංශ | 136 | 170 | 18,783 | 26,044 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 84 | 309 | 12,466 | 47,019 |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | 55 | 61 | 8,592 | 9,815 |
| විශේෂ ගැනුම් හිමිකම් | - | - | - | - |
| **සංචිත වත්කම්** | **-472** | **2,771** | **-65,593** | **424,480** |
| මූල්‍ය රත්‍රන් | - | - | - | - |
| විශේෂ ගැනුම් හිමිකම් | -5 | 2 | -685 | 354 |
| ජා.මූ.අරමුදලේ සංචිත මට්ටම | - | - | - | - |
| අනෙකුත් සංචිත වත්කම් | -467 | 2,768 | -64,907 | 424,126 |
| මුදල් සහ තැන්පතු | -1,267 | 393 | -183,495 | 60,087 |
| සුරැකුම්පත් | 800 | 2,375 | 118,582 | 364,025 |
| **ශුද්ධ වැරදීම් හා අත්හැරීම්** | **-465** | **114** | **-66,767** | **12,883** |
| **සමස්ත ශේෂය (ඇ)** | **-500** | **2,068** | **-46,013** | **330,004** |
| **ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස** | | | | |
| වෙළඳ ගිණුම | -10.9 | -11.0 | | |
| භාණ්ඩ හා සේවා | -7.3 | -7.2 | | |
| ජංගම ගිණුම | -2.1 | -2.6 | | |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුම | -2.1 | -2.6 | | |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) සමස්ත ශේෂය ගණනය කිරීම සඳහා 5.12 සංඛ්‍යා සටහන පරිශීලනය කරන්න.

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

*විදේශ සංචිත ගොඩනගා ගැනීම සඳහා විදේශ ණය මත යැපීම සීමා කිරීමට විදේශීය සෘජු ආයෝජන වැනි දිගුකාලීන ලැබීම් ආකර්ෂණය කර ගැනීම ඉතාමත් වැදගත් වනු ඇත. උපායශීලී නොවන පොදු වත්කම් වාණිජකරණය තුළින් ලැබෙන මූල්‍ය ප්‍රවාහ අනාගත ණය සේවාකරණ ගෙවීම් සඳහා වෙන් කර තැබීම, සක්‍රීය වගකීම් කළමනාකරණ පනත නීතිගත කිරීම සහ 2019-2023 සඳහා වන මධ්‍යකාලීන ණය උපායමාර්ගය පිළියෙල කිරීම ආදියෙහි යම්කිසි ප්‍රගතියක් පෙන්නුම් කළේය. විදේශ ණය කළමනාකරණය ක්‍රමවත් කර ගැනීමට එම ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, බාහිරින් පැනනගින කම්පනයන්ට මුහුණ දිය හැකි පරිදි ආර්ථිකය වඩාත් ශක්තිමත් කිරීම සඳහා විදේශීය අංශයේ ගැටලු විසඳීමෙහිලා බහුවිද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ.*

## 5.2 විදේශ වෙළඳ ප්‍රතිපත්ති, වර්ධනයන් සහ ආයතනික සහාය

**ගෝලීය වෙළඳපොළ සමග මනා සම්බන්ධතාවයක් ඇති කර ගැනීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රයත්න, විදේශ වෙළඳාම ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම සඳහා වඩාත් පුළුල් වෙළඳ ප්‍රතිපත්ති රාමුවක් නැවත සැකසීම සහ විදේශ වෙළඳාමට පහසුකම් සැලසීමට අවශ්‍ය ආයතනික සහාය ක්‍රමවත් කිරීම හා වැඩිදියුණු කිරීම උදෙසා ක්‍රියාමාර්ග ගැනීම 2017 වසරේ විදේශ වෙළඳ ප්‍රතිපත්තිමය පරිසරය පරිවර්තනය කිරීමෙහිලා ගනු ලැබූ වැදගත් පියවර වේ.** යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් යටතේ වන බදු සහන 2017 මැයි මාසයේදී නැවත ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වූ අතර, ඒ යටතේ යුරෝපා සංගමය සඳහා තීරු බදු අයිතම 7,200 කට පමණ තීරු බදු රහිතව ප්‍රවේශය ලැබේ. වඩාත් පුළුල් වෙළඳ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම සහ සිංගප්පූරුව සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා අවසාන කිරීම, අනෙකුත් හිතකර ප්‍රවණතා විය. මීට අමතරව, දැනට සාකච්ඡා මට්ටමේ පවතින චීනය සහ ඉන්දියාව සමඟ වන වෙළඳ හා හවුල්කාර ගිවිසුම් මගින් කලාපීය සබැඳියාව තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළඳ ගිවිසුම් සඳහා වන සාකච්ඡාවලට සමගාමීව වෙළඳාම ලිහිල්කරණයත් සමඟ මතු විය හැකි සෘණාත්මක බලපෑම් අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. පාර්ලිමේන්තුව විසින් ප්‍රපාතන විරෝධී හා ප්‍රතිතෝලන බදු පනත සම්මත කර ඇත. ඊට අමතරව, ආනයන ඉහළයෑම් තුළින් වන බලපෑමට පිළියම් යෙදීම සඳහා ආරක්ෂණ පියවර ගෙන ඇත. ලෝක බැංකුව, යුරෝපා සංගමය සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ සහාය ඇතිව දේශීය ව්‍යවසායයන්ට උපකාරී වීම සඳහා

වෙළඳ ගැළපුම් පැකේජයක් සකස් කෙරෙමින් පවතී. මේ අතර, වඩා පුළුල් ජාතික අපනයන උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම සඳහාද මූලික කටයුතු සිදු කර ඇත. පාර්ශ්වකරුවන් සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව හඳුනා ගත් ඉලක්කගත අංශ හයක් සහ වෙළඳ සහයෝගිතා කාර්යයන් හතරක් ජාතික අපනයන උපායමාර්ගික සැලැස්මට ඇතුළත් කර ඇති අතර, මෙම උපායමාර්ගික සැලැස්ම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය. තවද, ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුමට (Trade Facilitation Agreement) අනුව ජාතික තනි කවුළු පද්ධතිය (National Single Window) සහ වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal) වැනි වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ කටයුතු නිර්මාණය කිරීමේ මූලාරම්භයන් 2017 වසරේදී සිදු කරන ලදී.

**2017 වසරේදී ශ්‍රී ලංකාව වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.) යටතේ ප්‍රතිලාභ ලැබීය.** ඒ අනුව, යුරෝපා සංගමය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ජපානය, රුසියානු සමූහාණ්ඩුව සහ තුර්කිය වැනි සංවර්ධිත රටවල් කිහිපයක් විසින් ලබා දෙනු ලබන ජී.එස්.පී. ක්‍රම මගින් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ හිමි විය. 2017 වසරේදී යුරෝපා සංගමයේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ ජී.එස්.පී. ක්‍රම හරහා වූ අපනයන, වරණීය ගිවිසුම් යටතේ සිදු කළ අපනයන සඳහා විශාල වශයෙන් දායක වී ඇත. ශ්‍රී ලංකා රජය විසින් 2016 ජුලි මාසයේදී ඉදිරිපත් කරන ලද යෝජනාවකට අනුව යුරෝපා සංගමය විසින් ඔවුන්ගේ ජී.එස්.පී. ප්ලස් සහනය 2017 මැයි මස 19 දින සිට ප්‍රතිස්ථාපනය කරන ලදී. සාමාන්‍ය ජී.එස්.පී. ක්‍රමයේදී තීරු බදු අයිතමවලින් සියයට 66 ක් සඳහා වරණීය ප්‍රවේශයක් අත්වන අතර, යුරෝපා ජී.එස්.පී. ප්ලස් ක්‍රමය යටතේ එම අයිතම සඳහාම සම්පූර්ණයෙන්ම තීරු බදු ඉවත් කෙරෙන අතර, එමගින් රෙදිපිළි, ඇඟලුම් සහ මුහුදු ආහාර ඇතුළුව ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන විවිධ නිෂ්පාදන රාශියක් ආවරණය කෙරෙයි. මේ අතර, ඇමෙරිකා එක්සත් ජනපද ජී.එස්.පී. සහනය 2017 දෙසැම්බර් 31 වන දින දී නිමා විය. කෙසේ වුවද, 2018 මාර්තු මස 23 වන දින ඇමෙරිකානු රජය විසින් ඔවුන්ගේ ජී.එස්.පී. වැඩසටහන 2020 දෙසැම්බර් 31 දක්වා බලපැවැත්වෙන පරිදි නැවත අනුමත කරන ලද අතර, එහිදී ජී.එස්.පී. වැඩසටහන බලාත්මක නොවූ කාලසීමාව තුළ දී සිදු කරන ලද ජී.එස්.පී. වැඩසටහනට අයත් වන ආනයන භාණ්ඩ සඳහා අය කළ බදු මුදල් ආපසු ගෙවීම සඳහා ද වගන්තියක් ඇතුළත් කර ඇත. මේ අතර, 2017 වසරේදී ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවේ අපනයන ඉහළ ගොස් ඇති අතර, කුරුඳු අපනයන ඒ සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත. සංවර්ධිත වෙළඳ හවුල්කාර රටවල් විසින් ලබා දෙනු ලබන විවිධ ජී.එස්.පී. ක්‍රම කිහිපයකින්ම ශ්‍රී ලංකාව තවදුරටත් ප්‍රතිලාභ ලබන නමුත්, අපනයන පදනම සහ නිෂ්පාදන ආවරණය සීමා සහිතවීම හේතුවෙන් එම ක්‍රම යටතේ 2017 වසරේදී භාණ්ඩ විශාල ප්‍රමාණයක් අපනයනය කිරීමට ශ්‍රී ලංකාව අපොහොසත් වී ඇත. මෙය, ජී.එස්.පී. ක්‍රම මගින් සම්පූර්ණ ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට ලංකාවට ඇති ඉඩකඩ අහුරා දමයි.

**අපනයන සඳහා ඉඩ ප්‍රස්ථා ඇති වෙළඳපොළ ඉලක්ක කරගත් නව වෙළඳ ගිවිසුම් තුළින් ගෝලීය අගය දාමයන් තුළ වඩා හොඳින් ස්ථානගත වීම සඳහා රජයේ ක්‍රියාකාරී මැදිහත්වීම 2017 වසරේදී ද අඛණ්ඩව සිදු විය.** 2016 වසරේ අගෝස්තු මස ආරම්භ වූ ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර නිදහස් වෙළඳ ගිවිසුමක් සඳහා වූ සාකච්ඡා, වට අටක් අවසන්

**5.2 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකාව වරණීය වෙළඳ ගිවිසුම් යටතේ සිදුකළ අපනයන**

| වරණීය වෙළඳ ගිවිසුම | 2016 | 2017 (අ) | | |
|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | වර්ධනය % | දායකත්වය % |
| වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.) | 3,346.0 | 3,851.2 | 15.1 | 83.1 |
| එයින් යුරෝපා සංගමය (ජී.එස්.පී. ප්ලස් සහිතව) (ආ) | 2,243.5 | 2,473.9 | 10.3 | 53.4 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 608.5 | 782.1 | 28.5 | 16.9 |
| රුසියානු සමූහාණ්ඩුව (ඇ) | 160.3 | 188.3 | 17.5 | 4.1 |
| ජපානය | 83.5 | 96.4 | 15.4 | 2.1 |
| කැනඩාව | 60.1 | 90.5 | 50.6 | 2.0 |
| ඕස්ට්‍රේලියාව | 60.9 | 81.4 | 33.7 | 1.8 |
| තුර්කිය | 60.2 | 79.8 | 32.5 | 1.7 |
| ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISLFTA) | 375.3 | 442.3 | 17.9 | 9.5 |
| ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) | 126.0 | 151.1 | 19.9 | 3.3 |
| ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) | 45.1 | 81.2 | 79.9 | 1.8 |
| පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | 51.6 | 60.3 | 16.9 | 1.3 |
| දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) | 7.5 | 41.1 | 446.2 | 0.9 |
| දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) | 3.4 | 4.5 | 32.2 | 0.1 |
| **මුළු අපනයන** | **3,955.0** | **4,631.7** | **17.1** | **100.0** |

මූලය: වාණිජ දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

(ආ) යුරෝපා සංගමය මගින් ලබාදෙන ජී.එස්.පී සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන භාණ්ඩ වලින් තීරු බදු අයිතම සියයට 66 කට වරණීය ප්‍රවේශය ලබාදෙන අතර යුරෝපා සංගමය මගින් ලබාදෙන ජී.එස්.පී. ප්ලස් සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන එම තීරු බදු අයිතම සඳහාම තීරු බදු රහිත ප්‍රවේශයක් ලබා දේ.

(ඇ) රුසියාව, බෙලාරුස් හා කසකස්ථානය ඇතුළත් වේ.

කිරීමෙන් පසු 2018 වසරේ ජනවාරි මාසයේදී මෙම ගිවිසුම සඳහා අත්සන් කරන ලදී. පුළුල් ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුමක් වන ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම සේවා වෙළඳාම, ආයෝජන, වෙළඳ ගැටලු සඳහා ප්‍රතිකර්ම, විදුලි සංදේශ, විද්‍යුත් වාණිජ්‍යය, රාජ්‍ය ප්‍රසම්පාදනය, තරගකාරිත්වය, බුද්ධිමය දේපළ අයිතිය සහ විනිවිදභාවය සඳහා වෙනම පරිච්ඡේද ඇතුළත් කර ඇත. භාණ්ඩ අයිතම සියයට 99 කටත් වඩා වැඩි ප්‍රමාණයක් සඳහා සිංගප්පූරුව විසින් දැනටමත් බදු නිදහස් වෙළඳපොළ ප්‍රවේශය ලබා දෙන බැවින් මෙම ගිවිසුම මගින් ශ්‍රී ලංකාවට ලබා ගත හැකි ප්‍රධාන ප්‍රතිලාභය වනුයේ සේවා අපනයනය සහ ශ්‍රී ලංකාව වෙත සිංගප්පූරුවෙන් ආයෝජන ආකර්ෂණය කර ගැනීමයි. විද්‍යුත් වාණිජ්‍යය පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකාවට සිංගප්පූරුව හරහා අග්නිදිග ආසියානු කලාපීය සංගමයේ රටවල් වෙත සැලකිය යුතු ලෙස ප්‍රවේශ වීමේ හැකියාව ලබා දෙයි. 2014 වසරේ සැප්තැම්බර් මාසයේදී චීනය සහ ශ්‍රී ලංකාව අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුමෙන් අනතුරුව මෙම රටවල් දෙක විසින් යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා වට හයක් පවත්වා තිබේ. චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම මගින් චීන වෙළඳපොළ සඳහා වරණීය ප්‍රවේශයක් හිමි අග්නිදිග ආසියානු කලාපීය සංගමයේ සාමාජික තරගකරුවන් සමඟ ශ්‍රී ලංකාවටද සමාන තරගකාරී තත්ත්වයක් ඇති වනු ඇතැයි අපේක්ෂා කෙරේ. භාණ්ඩ වෙළඳාමට අමතරව චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම මගින් සේවා වෙළඳාම, ආයෝජනය සහ ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාව යන ක්ෂේත්‍රද ආවරණය කරයි. චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් වන සාකච්ඡා අවසන් කර 2018 වසර තුළ දී එම ගිවිසුම අත්සන් කිරීමට අපේක්ෂිතය. මේ අතර, සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයත්, වාණිජ දෙපාර්තමේන්තුවත් එක්ව නව වරණීය වෙළඳ ගිවිසුම් පිළිබඳව අඛණ්ඩව ඇගයීම් සිදු කෙරිණි. වරණීය වෙළඳ ගිවිසුම්වලින් පැන නැගී ඇති ගැටලු විසඳීම සඳහා සමාලෝචන රැස්වීම් කිහිපයක් පැවැත්වූ අතර, ද්විපාර්ශ්වික වෙළඳ සබඳතා වැඩිදියුණු කර ගැනීම සඳහා රුසියාව සහ කටාර් වැනි රටවල් සමඟ ඒකාබද්ධ කොමිසම්ද පවත්වන ලදී. ඊට අමතරව, බංගලාදේශය, මැලේසියාව, දකුණු කොරියාව සහ තායිලන්තය සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් අත්සන් කිරීමේ හැකියාවද ශ්‍රී ලංකාව සලකා බලමින් සිටී.

**පවත්නා වෙළඳ ගිවිසුම් මගින් නව වෙළඳ අවස්ථා ඇති කිරීම සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පවතින බැවින් දැනට පවතින වෙළඳ ගිවිසුම් උපයෝජනය තවදුරටත් ක්‍රමවත් කිරීම සඳහා පියවර කිහිපයක් ගෙන ඇත.** 2000 වසරේ සිට ක්‍රියාත්මක වන ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම දෙරට අතර ද්විපාර්ශ්වික වෙළඳාම වැඩිදියුණු කිරීම සඳහා දායක වී ඇත. ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම උපයෝජන කිරීමෙන් ශ්‍රී ලංකාවට වැඩි වාසි සහගත තත්ත්වයක් පවතී. ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත කරනු ලැබූ මුළු අපනයනවලින් සියයට 64 ක් පමණ ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ප්‍රධාන වශයෙන්ම සිදු කළ අතර එම අපනයන සත්ත්ව ආහාර, පුවක්, ඉවතලන කඩදාසි, කුළුබඩු හා පරිවාරක ආවරණය සහිත තඹ රැහැන් සහ කේබල්වලින් සමන්විත විය. මෙම වරණීය කොන්දේසි යටතේ ඉන්දියාවෙන් ආනයනය කළ භාණ්ඩවල වටිනාකම ඉන්දියාවෙන් කළ මුළු ආනයනවලින් සියයට 6 ක් පමණ විය. ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර යෝජිත ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම පිළිබඳ සාකච්ඡා අඛණ්ඩව සිදු කළ අතර, 2017 දෙසැම්බර් මාසයේදී හත්වන සාකච්ඡා වටය නිම කරන ලදී. මෙම සාකච්ඡාවලදී ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් ඇති තීරු බදු නොවන ක්‍රියාමාර්ග ආශ්‍රිත ගැටලුද සමාලෝචනය කරන ලදී. මේ සම්බන්ධයෙන්, ඇඟලුම් නිෂ්පාදන, කළු ගම්මිරිස් සහ දිසිදි පොල් වැනි ඇතැම් ශ්‍රී ලාංකික අපනයන සඳහා ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාව විසින් පනවා ඇති ප්‍රමාණාත්මක සීමා ඉවත් කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා බලධාරීන් විසින් නැවතත් අවධාරණය කරනු ලැබීය. 2018 වසර තුළ දී ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුමෙහි සාකච්ඡා අවසන් කර අත්සන් කිරීමට අපේක්ෂිතය. මේ අතර 2005 වසරේ සිට ක්‍රියාත්මක වන පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමද දෙරට අතර ද්විපාර්ශ්වික වෙළඳාම ඉහළ නැංවීම සඳහා දායක විය. පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් අපනයනය කළ ප්‍රධාන නිෂ්පාදිත වූයේ බුලත්, පොල් ආශ්‍රිත නිෂ්පාදිත, ෆයිබර් ලෑලි, රබර් නිෂ්පාදිත සහ කරාබු නැටි ආදියයි. කෙසේ වුවද, පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම උපයෝජනය 2017 වසරේදී ඉහළ අගයක් ගත්තද නිෂ්පාදිත විවිධාංගීකරණය අඩු වීම, වරින් වර ප්‍රතිපත්ති වෙනස්වීම සහ ක්‍රමවේදයන්හි පැවති ප්‍රමාදවීම් වැනි තීරු බදු නොවන බාධක පාකිස්ථානය වෙත අපනයන සිදු කිරීමේදී පවතින අවහිරතා වේ.

**කලාපය තුළ වෙළඳ හා සේවා ජාල අතර සහයෝගිතාව වැඩිදියුණු කිරීමෙහිලා කලාපීය සහ බහුපාර්ශ්වීය වරණීය වෙළඳ ගිවිසුම්වල වැදගත්කම ඉහළ යමින් පවතී.** 2006 වසරේදී ක්‍රියාත්මක කරන ලද දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණය (SAFTA), වරණීය වෙළඳාම ප්‍රවර්ධනය තුළින් සාර්ක් කලාපයේ ආර්ථිකයන් අතර සබැඳියාව තවදුරටත් වර්ධනය කිරීම අරමුණු කර ගෙන ඇත. මෙය 1995 වසරේදී හඳුන්වා

5

දෙන ලද දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුමෙහි (SAPTA) වැඩිදියුණු කිරීමකි. එබැවින්, දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම, දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණය වෙත ක්‍රමයෙන් යොමු වීමට නියමිත අතර, ඒ අනුව පසුගිය කාලය තුළ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන වරණීය තීරු බදු භාවිතයන් ක්‍රමානුකූලව අඩු වී ඇත. ශ්‍රී ලංකාව විසින් දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණයෙහි වෙළඳ භාණ්ඩ සඳහා අදාළ තීරු බදු නිදහස් කිරීමේ ක්‍රියාමාර්ගය යටතේ වූ පළමු අදියර 2015 වසරේ නොවැම්බර් මාසයේදී නිම කරන ලදී. නිදහස් වෙළඳ වැඩසටහනෙහි දෙවන අදියර යටතේ 2018 වසරේ දෙසැම්බර් 31 වන විට ශ්‍රී ලංකාව සිය මූලික සංවේදී භාණ්ඩ ලැයිස්තුව සියයට 20 කින් වත් අඩු කිරීමට අපේක්ෂා කරයි. කෙසේ වෙතත්, දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණය හරහා සිදු කළ අපනයන අඛණ්ඩව අඩු අගයක පැවති අතර, එම අපනයනවලින් සියයට 80 කට වඩා සමන්විත වූයේ ගම්මිරිස් අපනයනයි. 2012 නොවැම්බර් මාසයේදී අනුමත කරන ලද සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුමෙහි (SATIS) සාමාජික රටවල බැඳීම් පිළිබඳ ජාතික උපලේඛන සකස් කිරීම අවසන් අදියරේ පවතී. ආසියා-ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) යටතේ සිදු කළ අපනයන 2017 වසරේදී ඉහළ ගිය අතර, කළු තේ, පොල් නිෂ්පාදිත සහ ඇතැම් ඇඟලුම් ප්‍රධාන අපනයන භාණ්ඩ ලෙස පැවතුණි. සිය සාමාජික රටවල් අතර කලාපීය සහයෝගිතාව ශක්තිමත් කිරීම අරමුණු කරගත් අන්තර් රාජ්‍ය සංවිධානයක් වන ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ (IORA) ප්‍රථම රාජ්‍ය නායක සමුළුව 2017 වසරේ මාර්තු මාසයේදී ඉන්දුනීසියාවේදී පවත්වන ලදී. බහුආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භය (BIMSTEC) යටතේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම්වල 17 වන සහ 18 වන සැසිවාර සහ අමාත්‍යවරුන්ගේ රැස්වීම්වල 15 වන සැසිවාරයද 2017 වසරේදී පවත්වන ලදී. මෙම රැස්වීම්වලදී ගෝවේ නගරයේදී පවත්වන්නට යෙදුණු සමුළුවේදී නායකයන් විසින් එකඟතාවයට පැමිණි විධාන සහ ක්‍රියාකාරී න්‍යාය පත්‍ර සාක්ෂාත් කර ගැනීමට දරන ප්‍රයත්න කඩිනම් කිරීමේ අවශ්‍යතාව නැවතත් අවධාරණය කරන ලදී.

5

**ලෝක වෙළඳ සංවිධානය 1995 දී ස්ථාපිත කිරීමෙන් පසුව අත්පත් කරගත් සැලකිය යුතු ජයග්‍රහණයක් වන වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම සම්බන්ධයෙන් 2017 වසරේදීද ශ්‍රී ලංකාව අඛණ්ඩව සහයෝගය පළ කළේය.** ශ්‍රී ලංකාව විසින් 2016 මැයි මාසයේදී වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම ස්ථිර කරන ලදී. එය ලෝක වෙළඳ සංවිධානයේ සාමාජික රටවල් තුනෙන් දෙකක (110) ප්‍රමාණයක් විසින් ස්ථිර කරනු ලැබීමෙන් අනතුරුව, 2017 වසරේ පෙබරවාරි මස සිට ක්‍රියාත්මක වී ඇත. 2017 වසරේ මැයි මාසයේදී ලෝක බැංකුවේ සහයෝගය ඇතිව, දේශීය සම්බන්ධීකරණය හා වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුමේ ඇතුළත් වගන්ති ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් වෙළඳ පහසුකම් සැපයීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීම අරමුණු කරගත් ජාතික වෙළඳ පහසුකම් සැලසීමේ කමිටුව සඳහා ලේකම් කාර්යාලයක් ස්ථාපිත කරන ලදී. ජාතික වෙළඳ පහසුකම් සැලසීමේ කමිටුව විසින් ජාතික තනි කවුළු පද්ධතිය සහ වෙළඳ තොරතුරු ද්වාරය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලාරම්භයන් සිදු කරන ලදී. වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුමට අනුව ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකයන්, කාණ්ඩ තුනක් යටතේ වර්ග කර ඇති වෙළඳ පහසුකම් සැලසීමේ බැඳීම් සඳහා අනුගත විය යුතුය. වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුම බලාත්මක වන දිනය වන විට ක්‍රියාවට නැංවිය යුතු ප්‍රතිපාදන 'ඒ' කාණ්ඩය යටතේද, ගිවිසුම ක්‍රියාත්මක වී පරිවර්තනීය කාලසීමාවකට පසු ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපාදන 'බී' කාණ්ඩය යටතේද, ගිවිසුමෙහි සහාය ඇතිව සහ හැකියාවන් ඉහළ නැංවීමේ වැඩසටහන් හරහා හැකියාවන් ගොඩනගා ගැනීමෙන් පසු ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපාදන 'සී' කාණ්ඩය යටතේද වර්ග කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ලෝක වෙළඳ සංවිධානය වෙත 2014 වසරේ ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ 'ඒ' කාණ්ඩයේ බැඳීම් දැනුම් දී ඇති අතර, 'බී' සහ 'සී' කාණ්ඩය යටතේ බැඳීම් සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවසන් දින 2018 වසරේ පෙබරවාරි මාසයේදී ලෝක වෙළඳ සංවිධානය වෙත දැනුම් දී ඇත. තවද, 2017 වසරේ දෙසැම්බර් මස ආර්ජන්ටිනාවේදී ලෝක වෙළඳ සංවිධානයේ 11 වන අමාත්‍ය මණ්ඩල මට්ටමේ සමුළුව පැවති අතර, එය කෘෂිකර්මය, ධීවර සහනාධාර සහ සේවා වැනි සංවේදී කරුණු පිළිබඳව අමාත්‍ය මණ්ඩල පොදු ප්‍රකාශන හෝ තීරණ පිළිබඳ එකඟතාවයකින් තොරව අවසන් විය.

**අපනයන ප්‍රවර්ධනය සඳහා ආයතනික සහාය ශක්තිමත් කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින් ප්‍රතිපත්තිමය පරිසරය සහ ආයතනික හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා රජය විසින් නව ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදී.** සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍යාංශය විසින් දේශීය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ තුළින් තරඟකාරිත්වය වැඩි කිරීම; වෙළඳපොළවලට පිවිසුම සහ වෙළඳාම පහසුකරණය; සාර්ව ආර්ථික තුලනය, ප්‍රතිපත්ති සහ ආයතනික සංගතතාවය; සහ වෙළඳ ප්‍රතිසංස්කරණ අරභයා සමාගම් සහ විවිධ ජන කණ්ඩායම් හැඩගැස්වීම යන ප්‍රධාන අංග හතරකින් යුතු නව වෙළඳ ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී. 2017 වසරේ

අගෝස්තු මාසයේදී නව වෙළඳ ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. මීට අමතරව, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාමේ තරගකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සහ උපායමාර්ගික කටයුතු සිදු කිරීම සඳහා වන ප්‍රධාන ආයතනය ලෙස සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළු ආයතන අතර සම්බන්ධතා වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදී. මෙම මූලාරම්භයන්ට අනුව ප්‍රධාන ආයතන 24 ක් අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම මගින් ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් විමර්ශනය කිරීමේ පද්ධතියක් සමඟ අදාළ සියලු කාර්යයන් ඉටු කර ගැනීම සඳහා පහසුකම් සලසන එක් ස්ථානයක් (virtual one-stop-shop) පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු සම්පාදනය කරමින් සිටී. තවද, සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාව, ව්‍යාපාර කිරීමේ පහසුව දක්වන දර්ශකයේ (Doing Bussiness Index) 110 වන ස්ථානයේ සිට 2020 වසරේදී 70 වන ස්ථානය දක්වා ඉහළ නැංවීම අරමුණු කරගත් ආයෝජන වාතාවරණය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පෙරදැක්මක් සකස් කර ඇත. 2022 වසර වන විට එ.ජ. ඩොලර් බිලියන 27 ක භාණ්ඩ හා සේවා අපනයන ඉලක්කයක් සපුරා ගැනීම සඳහා වන ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේ කටයුතු අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2017 වසරේදී අඛණ්ඩව සිදු කරන ලදී. මේ යටතේ පාර්ශ්වකරුවන්ගේ අදහස් පුළුල් ලෙස විමසීමෙන් අනතුරුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය; සුවසේවා සංචරණය; බෝට්ටු නිපදවීම; විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් උපාංග; සකස් කළ ආහාර හා පාන වර්ග; සහ කුළුබඩු හා සාන්ද්‍රික නිෂ්පාදන වැනි තවදුරටත් අපනයන ඉහළ නැංවීම සඳහා අවකාශයන් පවතින ඉලක්කගත අංශ හයක් හඳුනාගෙන ඇත. මීට අමතරව, වෙළඳ තොරතුරු හා ප්‍රවර්ධනය; ජාතික තත්ත්ව යටිතල ව්‍යුහය; කාර්ය උපාය; සහ නවෝත්පාදනය හා ව්‍යවසායකත්වය වැනි අත්‍යවශ්‍ය වෙළඳ සහයෝගිතා කාර්යයන්ද හඳුනා ගෙන ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

**2017 වසරේදී විදේශීය වෙළඳාම සඳහා වූ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අදාළ ආයතන සිය උපරිම සහයෝගය ලබා දෙන ලදී.** 2017 වසරේදී ජාතික අපනයන උපායමාර්ගික සැලැස්මට ප්‍රමුඛත්වය ලබා දෙමින් අපනයන සංවර්ධන මණ්ඩලය වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කළ අතර, අපනයන ප්‍රවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් ගණනාවක් සිදු කර ඇත. මේ අනුව, අපනයන සංවර්ධන මණ්ඩලය මගින් අපනයනකරුවන් හට නියමිත වේලාවට වෙළඳ ප්‍රවර්ධන මෙවලම් හා වෙළඳාම සම්බන්ධ විශ්වාසදායී තොරතුරු ලබා ගත හැකි විද්‍යුත් වෙළඳ තොරතුරු හා ප්‍රවර්ධන කවුළුවක් පිහිටුවීමට අපේක්ෂා කෙරේ. ප්‍රාදේශීය වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 2,000 ක් අපනයනකරුවන් බවට පත් කිරීම උදෙසා 2017 වසරේ මාර්තු මාසයේදී ජාතික වැඩසටහනක් යාපනයේදී ආරම්භ කළ අතර, කාන්තා ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා වූ වැඩසටහනක් කිලිනොච්චියේදී ආරම්භ කරන ලදී. "එක ගමක් එක නිෂ්පාදනයක්" වැඩසටහන යටතේ එකතු කළ අගයක් සහිත තෝරාගත් නිෂ්පාදිත සඳහා ගොවි සංගම් පිහිටුවීමට අපේක්ෂා කෙරේ. තවද, 2017 වසරේදී වෙළඳ ප්‍රවර්ධනය සහ වෙළඳාම සඳහා පහසුකම් සැලසීම උදෙසා පිළිගත් විදේශ වෙළඳ සල්පිල් සඳහා සහභාගි වීම, දේශීය හා විදේශීය වෙළඳ නියෝජිතයින් සඳහා පහසුකම් සැපයීම, වෙළඳාම හා සම්බන්ධව පවතින ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අපනයනකරුවන්ගේ සමුළු පැවැත්වීම සහ අපනයනකරුවන් සඳහා සම්මාන ප්‍රදානෝත්සව පැවැත්වීම මගින් ඔවුන් ඇගයීම වැනි කටයුතු තවදුරටත් සිදු කරන ලදී. වාණිජ මණ්ඩල මගින්ද වසර පුරාම අපනයන ප්‍රවර්ධනය උදෙසා ඉහළ දායකත්වයක් ලබා දුණි. මෙය, රජය සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් අතර අන්තර් සම්බන්ධතාවයක් ගොඩනැංවීම සඳහා උපකාරී විය. වාණිජ මණ්ඩල විසින් අපනයනකරුවන් සඳහා දැනුම්වත් කිරීමේ සමුළු සහ හැකියාවන් ගොඩනැංවීමේ මෙන්ම පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මේ අතර, ශ්‍රී ලංකා රේගුව විසින් බහලු පරීක්ෂාව හා භාණ්ඩ නිදහස් කිරීමේ ක්‍රියාවලිය සහ වැඩිපුර ලබාගෙන ඇති රේගු බදු නැවත ගෙවීමේ කටයුතු ක්‍රමවත් කරන ලදී. ඊට අමතරව, රේගුවේ ආසිකුඩා වර්ල්ඩ් (ASYCUDA World) පද්ධතිය සඳහා බැංකු ඇපකර කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දුන් අතර, වරාය කටයුතු සුමටව සිදු කිරීමට පහසුකම් සැලසීම සඳහා අංගන තෝරා ගැනීමේ ක්‍රියාවලිය සහ එක් අයෙකුට වඩා වැඩි පිරිසකගේ බහලු ගුදම්ගත කිරීමේ ක්‍රියාවලිය වැනි ක්‍රියාපටිපාටි ස්වයංක්‍රීය කරන ලදී.

**2018 වසර සඳහා වූ අයවැය මගින් වෙළඳාම සඳහා සහාය වන ක්‍රියාමාර්ග ගණනාවක් යෝජනා කර ඇති අතර, 2017 වසරේදී හඳුන්වා දෙන ලද වෙළඳ හා තීරු බදු ප්‍රතිපත්ති සහ නෛතික සංශෝධන තුළින් බදු ක්‍රමය තවදුරටත් තාර්කිකකරණය කිරීම හා සරල කිරීම සහ සාධාරණ වෙළඳාම ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.** 2018 වසර සඳහා වූ

අයවැය මගින් පරිසර හිතකාමීත්වය සහතික කිරීමේ වැඩසටහන් ශක්තිමත් කිරීම, තොරතුරු තාක්ෂණික සේවා අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණික ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර වෙළඳපොළවලට පිවිසීම උදෙසා ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම යටතේ දක්වා ඇති ප්‍රමුඛ අංශ වෙත සහාය ලබා දීම, නව වෙළඳ ප්‍රතිපත්තිය මගින් යෝජනා කරන ලද වෙළඳ ගැළපුම් වැඩසටහනේ කොටසක් ලෙස රුපියල් මිලියන 800 ක් වෙන් කරමින් අපනයන වෙළඳපොළ පිවිසුම් සහායක වැඩසටහනක් හඳුන්වා දීම සහ අපනයන අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා භාණ්ඩ වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා සහාය ලබා දීම යෝජනා වී ඇත. ශ්‍රී ලංකාව තුළ විදේශීය ආයෝජන, විශේෂයෙන්ම කලාපීය හා ගෝලීය අගය දාමයන් ආශ්‍රිත ආයෝජන (ගෝලීය නිෂ්පාදන හුවමාරු කර ගැනීමේ ජාලවලට ප්‍රවේශ වීම වැනි) ප්‍රවර්ධනය උදෙසා රජය මගින් බදු ක්‍රමය තුළ පවතින තීරු බදු නොවන වෙනත් බදු ක්‍රමයෙන් ඉවත් කිරීම කෙරෙහිද අවධානය යොමු කර ඇත. මීට සමගාමීව, තීරු බදු අයිතම 1,200 කට වඩා වැඩි ප්‍රමාණයක බදු අනුපාතික ඉවත් කර ඇත. අසාධාරණ වෙළඳ කටයුතු හා අනපේක්ෂිතව සිදු වන ආනයන ඉහළයෑම් තුළින් සිදුවන බලපෑම්වලින් දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගැනීම සඳහා 2018 වසරේ මාර්තු මාසයේදී 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී හා ප්‍රතිතෝලන බදු පනත සහ 2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනත බලාත්මක කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා රේගුව, වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන සකස් කිරීම සඳහා රේගු ආඥා පනත සංශෝධනය කිරීමේ කටයුතු සිදු කරමින් සිටී.

**විදේශීය වෙළඳාමේ හිතකර වර්ධන ප්‍රවණතා දක්නට ලැබුණද, ගෝලීය හා දේශීය වශයෙන් පවතින ගැටලු සහ අභියෝග එම ක්‍රියාකාරිත්වය වැඩිදියුණු වීම අඩපණ කිරීමට බලපෑවේය.** මෙතෙක් වාර්තා වූ ඉහළම අපනයන ආදායම හා විදේශීය සෘජු ආයෝජන ලැබීම් මෙන්ම නම්‍යශීලී විනිමය අනුපාතිකය හේතුවෙන් තරගකාරිත්වය ඉහළ යෑම මගින් 2017 වසරේදී විදේශීය වෙළඳාමේ වූ ඉහළ ක්‍රියාකාරිත්වය පිළිබිඹු වේ. සියලුම ප්‍රධාන ආර්ථිකයන්හි ඇති වූ වර්ධනය 2017 වසරේදී අපනයන සඳහා වූ ඉල්ලුම කැපී පෙනෙන ලෙස ඉහළ යෑම සඳහා බලපෑ අතර, යුරෝපා සංගමය වෙත මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා පනවා තිබූ තහනම සහ යුරෝපා සංගමය මගින් ලබා දෙන ජී.එස්.පී. ප්ලස් සහනය අත්හිටුවීම වැනි ප්‍රධාන බාධාවන්ට 2016 සහ 2017 වසරවලදී ශ්‍රී ලංකාව සාර්ථකව විසඳුම් ලබා දුන්නේය. තවද, නව පුළුල් නිදහස් වෙළඳ ගිවිසුමක් තුළින් සිංගප්පූරුව සමඟ වෙළඳ සබඳතා ශක්තිමත් කරගත් අතර, වෙළඳ හවුල්කරුවන් කිහිපදෙනෙකු සමඟ නව නිදහස් වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීම සඳහා සාකච්ඡා සිදු කෙරෙමින් පවතී. මේ අතර, රජයේ වසර 2025 සඳහා වූ දැක්ම, නව වෙළඳ ප්‍රතිපත්තිය, ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම සහ ආයෝජන පෙරදැක්ම තුළින් දක්වා ඇති පරිදි පාර්ශ්වකරුවන්ගේ පුළුල් උපදේශනද සහිතව සවිස්තරාත්මක දේශීය ප්‍රතිපත්ති රාමුවක් සකස් කරන ලදී. කෙසේ වුවද, තරගකාරිත්වය පහළ යෑම සඳහා හේතු වන ඉහළ නිෂ්පාදන පිරිවැය හා අවශ්‍ය පරිදි ශ්‍රම බලකාය නොමැති වීම වැනි සැපයුම් අංශයේ ඇති බාධක ඉවත් කිරීමට ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දිය යුතුය. ඊට අමතරව, බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීමෙන් විය හැකි බලපෑම හා දියුණු රටවල, විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදයේ, පවතින ආරක්ෂණවාදී ප්‍රතිපත්තිවල බලපෑම සහ ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් ලබන රටක් කරා ළඟා වන විට ජී.එස්.පී. සහන ක්‍රම ඉවත් කිරීම, පවතින අවදානම් ලෙස දැක්විය හැක. මෙම අභියෝගවලට මුහුණ දීමට වෙළඳාම සඳහා පහසුකම් සැලසීම සහ නිෂ්පාදන හුවමාරු කර ගැනීමේ ජාල වෙත පිවිසීම වැනි යෝග්‍ය පිළියම් යෙදීම වැදගත් වේ. එසේම, වෙළඳාමේ තිරසාර ප්‍රසාරණය සඳහා පර්යේෂණ සහ සංවර්ධනය මගින් වූ නවෝත්පාදන සමඟ අපනයනාභිමුඛ පරිසරයක් ඇති කිරීම ප්‍රමුඛතාවයෙහිලා සැලකිය යුතුය. එසේම, ආයෝජකයින් සඳහා හිතකර පරිසරයක් ගොඩනැගීම සඳහා ආයතනික රාමුව තාර්කිකරණය කිරීම සහ නොබැඳි විදේශීය ප්‍රතිපත්තියට සමගාමීව ස්ථාවර දේශීය ප්‍රතිපත්ති පවත්වා ගෙන යෑම වැදගත් වේ. නව වෙළඳ ගිවිසුම් තුළින් මෙන්ම වර්ධනය වූ ආර්ථික සහයෝගිතාව හරහා වෙළඳපොළ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා වන ප්‍රයත්න අඛණ්ඩව සිදු කිරීම වැදගත් වන අතර, සාර්ථකව නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා පැවැත්වීම සහ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වෙළඳ සාකච්ඡා හා වෙළඳ සබඳතා මනා අයුරින් සිදු කිරීමට අවශ්‍ය හැකියාවන් තවදුරටත් වර්ධනය කළ යුතු වේ.

## 5.3 භාණ්ඩ වෙළඳාම, වෙළඳ ශේෂය, වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දිශාව

### 5.3.1 අපනයන ක්‍රියාකාරිත්වය

**පසුගිය වසර දෙක තුළ දී අයහපත් ලෙස බලපෑමට ලක්වූ අපනයන ක්‍රියාකාරිත්වය, 2017 වසර තුළ දී මෙතෙක් වාර්තා වූ ඉහළම අගය සනිටුහන් කරමින් ශක්තිමත් ලෙස නැවත යථා තත්ත්වයට පත් විය.** යුරෝපා සංගමය මගින් ලබා දෙන ජී.එස්.පී. ප්ලස් සහනය නැවත ලබා ගැනීම, විදේශීය ඉල්ලුම යථා තත්ත්වයට පත් වීම, අපනයන ආශ්‍රිත කර්මාන්තවල


ආයෝජනය පුළුල් වීම, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, හිතකර විදේශ වෙළඳ ප්‍රතිපත්ති සමගින් ශක්තිමත් ආයතනික සහාය ලැබීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය පවත්වාගෙන යෑම අපනයන ආදායමෙහි ශක්තිමත් වර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් විය. මේ අනුව, වසරේ දෙවන භාගයේදී අඛණ්ඩව ඉලක්කම් දෙකක වර්ධනයක් වාර්තා කරමින් 2017 වසරේ අපනයන ආදායම, 2016 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 10,310 සිට එ.ජ. ඩොලර් මිලියන 11,360 ක් දක්වා සියයට 10.2 කින් වර්ධනය විය. 2017 වසරේදී අපනයන ආදායම වර්ධනය වීම සඳහා ප්‍රධාන වශයෙන්ම කාර්මික අපනයනද, අනතුරුව කෘෂිකාර්මික අපනයනද දායක විය.

**මුළු අපනයනවලින් හතරෙන් තුනක් පමණ වූ කාර්මික අපනයන ආදායම, 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 8,542 ක් දක්වා සියයට 7.6 කින් වර්ධනය විය.** මුළු අපනයනවලින් සියයට 44 ක් පමණ වන රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම ඉතිහාසයේ ප්‍රථම වරට එ.ජ. ඩොලර් බිලියන 5 ක් ඉක්මවූ අතර එය කාර්මික අපනයනවල වර්ධනය සඳහා විශාල වශයෙන් දායක විය. 2017 වසරේ පළමු භාගයේදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායමෙහි අඩු වීමක් දක්නට ලැබුණද, සමුච්චිත වශයෙන් සැලකීමේදී 2017 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 5,032 දක්වා සියයට 3.0 කින් වර්ධනය වූ අතර, 2017 වසරේ මැයි මාසයේ සිට ජී.එස්.පී. ප්ලස් සහනය නැවත ලැබීමෙන් අනතුරුව යුරෝපා වෙළඳපොළ වෙතින් වූ ඉල්ලුම වර්ධනය වීම මෙමගින් පිළිබිඹු විය. මේ අනුව, වසරේ දෙවන භාගයේදී යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයන අඛණ්ඩව ඉහළ යෑම තුළින් 2017 වසර තුළ දී ඇඟලුම් අපනයන එ.ජ. ඩොලර් මිලියන 1,982 ක් දක්වා පෙර වසරට සාපේක්ෂව සියයට 4.0 කින් වර්ධනය වූ අතර, එය මුළු ඇඟලුම් අපනයනවලින් සියයට 42 ක් පමණ විය. වසර තුළ දී ඇමෙරිකා එක්සත් ජනපදය වෙත කළ ඇඟලුම් අපනයනවලින් ලද ආදායම සියයට 1.7 කින් වර්ධනය වූ අතර, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, කැනඩාව, හොංකොං සහ මෙක්සිකෝව වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත කළ ඇඟලුම් අපනයන සියයට 3.9 කින් වර්ධනය විය. තවද, 2017 වසරේදී ඛනිජ තෙල් අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 434 ක් දක්වා සියයට 51.4 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, නැව් සඳහා භාවිත කරන ඉන්ධනවල සාමාන්‍ය මිල ගණන් සහ අපනයන පරිමා ඉහළ යෑමෙහි සංයුක්ත බලපෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි පැවති ඉහළ ඉන්ධන මිල ගණන්වලට සමගාමීව වසර තුළ දී නැව් සඳහා භාවිත කරන ඉන්ධනවල සාමාන්‍ය අපනයන මිල සියයට 28.3 කින් වර්ධනය විය. 2017 වසරේ ජූලි මාසයේදී ඉන්දියාව නැව් සඳහා භාවිත කරන ඉන්ධන මත පනවා තිබූ බදු ඉහළ නැංවීම හේතුවෙන් එම ඉන්ධන සඳහා ශ්‍රී ලංකාව වෙත වූ ඉල්ලුම ඉහළ ගිය අතර එමගින් ඉන්ධන අපනයන පරිමාවද සියයට 16.3 කින් වර්ධනය විය. ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 393 ක් දක්වා සියයට 21.3 කින් වර්ධනය වූ අතර, එළවළු, පලතුරු හා ඇට වර්ග විශේෂයෙන්ම දියරමය

5

**5.2 රූප සටහන**


**අපනයන සංයුතිය - 2017**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**5.3 රූප සටහන**

**ජී.එස්.පී./ජී.එස්.පී.ප්ලස් පහසුකම යටතේ යුරෝපා සංගමය වෙත සිදු කළ අපනයන**




මූලය: වාණිජ දෙපාර්තමේන්තුව

පොල් කිරි සහ ක්‍රීම් කළ පොල් වැනි පොල් ආශ්‍රිත නිෂ්පාදිතවල දක්නට ලැබුණු යහපත් ක්‍රියාකාරිත්වය මේ සඳහා හේතු විය. උප කාණ්ඩ සියල්ලෙහිම පාහේ, විශේෂයෙන්ම ටයර් සහ ශල්‍ය හා අනෙකුත් අත්වැසුම් අපනයනවල ඉහළ ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින්, 2017 වසරේදී රබර් නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 835 ක් දක්වා සියයට 8.8 කින් වර්ධනය විය. යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, ප්‍රවාහන උපකරණ, මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ දැව හා කඩදාසි නිෂ්පාදිත අපනයනයෙන් ලද ආදායම්ද කාර්මික අපනයනවල වර්ධනය සඳහා දායක විය. මේ අතර, සියලුම උප කාණ්ඩවල පැවති දුර්වල ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින් මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම සියයට 6.0 කින් පහළ ගියේය. මැණික් කැණීම් සිදු කරන ප්‍රදේශවල වාර්තා වූ ඉහළ වර්ෂාපතනය හේතුවෙන් මැණික් ගල් නිෂ්පාදනය අඩු වීම සහ බැකෝ බලපත්‍ර නිකුත් කිරීම තහනම් කිරීම මගින් වූ බලපෑම මෙම අඩු වීම සඳහා හේතු විය. කෙසේ වුව ද, අගය එකතු කළ මැණික් අපනයනය ඉහළ ගිය අතර ප්‍රධාන වශයෙන්ම සකස් නොකළ මැණික් අපනයන පහළ යෑම හේතුවෙන් සමස්ත මැණික් අපනයන ආදායම අඩු විය. 2017 වසරේදී පාවහන් අපනයන පහළ යෑම හේතුවෙන් සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 158 ක් දක්වා සියයට 4.4 කින් පහළ ගියේය. තවද, පිඟන් ගඩොල් හා පිඟන් භාණ්ඩ, ගෘහාශ්‍රිත උපකරණ සහ සනීපාරක්ෂක භාණ්ඩ අපනයන අඩු වීම හේතුවෙන් පිඟන් මැටි නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය.

**2017 වසරේදී කෘෂිකාර්මික අපනයන ආදායම, වසර මුළුල්ලේම පැවති වර්ධන ප්‍රවණතාව පවත්වා ගනිමින් එ.ජ. ඩොලර් මිලියන 2,767 ක් දක්වා සියයට 19.0 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය.** විශේෂයෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළෙහි තේ සඳහා පැවති හිතකර මිල ගණන් මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. තේ අපනයන පරිමා නොවෙනස්ව පැවතුණද, ගෝලීය සැපයුම, විශේෂයෙන්ම කෙන්යාව වෙතින් වූ සැපයුම අඩු වීම නිසා ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල ගණන් ඉහළ යෑමත් සමඟ සාමාන්‍ය අපනයන මිල ගණන් ආකර්ෂණීය ලෙස පැවතීම හේතුකොටගෙන 2017 වසරේදී තේ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,530 ක් දක්වා සියයට 20.5 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ අනුව, 2017 වසරේදී තේ සඳහා සාමාන්‍ය අපනයන මිල පෙර වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 4.39 හි සිට කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 5.29 ක් දක්වා සියයට 20.5 කින් වර්ධනය විය. වසරේ මුල් කාලයේදී පැවති වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් 2017 වසරේ අප්‍රේල් මාසය වන තෙක් තේ අපනයන පරිමා අඛණ්ඩව අඩු වුව ද, පහතරට තේ නිෂ්පාදනය වැඩි වීම හේතුවෙන් වසරේ දෙවන භාගයේදී තේ අපනයන පරිමා නැවත යථා තත්ත්වයට පත් විය. මේ අනුව, 2017 වසරේදී අපනයනය කළ තේ පරිමාව කිලෝග්‍රෑම් මිලියන 289 ක් දක්වා සියයට 0.1 කින් වර්ධනය විය. 2017 වසරේදී ප්‍රධාන තේ අපනයන ගමනාන්ත ලෙස තුර්කිය, රුසියාව, ඉරානය, ඉරාකය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය පැවති අතර එම රටවලින් වූ අපනයන මුළු තේ අපනයනයෙන් සියයට 48 ක් පමණ විය. තවද, 2017 වසරේදී කුරුඳු, කරාබුනැටි සහ ගම්මිරිස් අපනයනවල දක්නට ලැබුණු ඉහළ ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින් කුළුබඩු අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 406 ක් දක්වා සියයට 28.1 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. 2017 වසරේදී අපනයන පරිමා ඉහළ යෑම සහ සාමාන්‍ය මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් කුරුඳු අපනයන ආදායම සියයට 27.4 කින් වර්ධනය විය. වසර තුළ දී කරාබුනැටි සහ ගම්මිරිස් සඳහා සාමාන්‍ය මිල ගණන්වල අඩු වීමක් පැවතුණ ද, අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් එම අපනයනවලින් ලද ආදායම් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ අතර, යුරෝපා සංගමය වෙත මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම 2016 වසරේ ජූනි මාසයේ සිට ඉවත් කිරීම සහ ජී.එස්.පී. ප්ලස් සහනය නැවත ලබා ගැනීම නිසා ඇති වූ යහපත් ප්‍රවණතාව පිළිබිඹු කරමින් 2017 වසරේදී මුහුදු ආහාර අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 241 ක් දක්වා සියයට 41.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. යුරෝපා සංගමය වෙත සිදු කළ මුහුදු ආහාර අපනයන ආදායම වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 67 ක් දක්වා සියයට 112.3 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. මීට අමතරව, ඇමෙරිකා එක්සත් ජනපදය, වියට්නාමය, තායිලන්තය, හොංකොං සහ තායිවානය වැනි අනෙකුත් රටවල් වෙතින් ශ්‍රී ලංකාවේ මුහුදු ආහාර සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම ද, මුහුදු ආහාර අපනයනවල ඉහළ වර්ධනය සඳහා හිතකර ලෙස දායක විය. තවද, 2017 වසරේදී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 139 ක් දක්වා සියයට 21.6 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, බුලත් (සියයට 168.2), පලතුරු (සියයට 19.6) සහ පුවක් (සියයට 10.6) අපනයන ආදායම් ඉහළ යෑම මේ සඳහා හේතු විය. මීට අමතරව, රබර්, සකස් නොකළ දුම්කොළ සහ එළවළු අපනයන ආදායම්ද, කෘෂිකාර්මික අපනයන ඉහළ යෑම සඳහා දායක විය. මේ අතර, 2017 වසරේදී පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන වර්ධනය වුව ද, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත අපනයනවල දක්නට ලැබුණු දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් පොල්

**5.3 සංඛ්‍යා සටහන**

**අපනයන සංයුතිය[1]**

| කාණ්ඩය | 2016 වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | 2016 දායකත්වය % | 2017 (අ) වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | 2017 (අ) දායකත්වය % | වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස් වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | **2,326.1** | **22.6** | **2,767.2** | **24.4** | **441.1** | **19.0** | **42.0** |
| තේ | 1,269.0 | 12.3 | 1,529.8 | 13.5 | 260.8 | 20.5 | 24.8 |
| රබර් | 32.7 | 0.3 | 38.9 | 0.3 | 6.3 | 19.1 | 0.6 |
| පොල් | 366.0 | 3.5 | 347.9 | 3.1 | -18.1 | -4.9 | -1.7 |
| කුළුබඩු | 317.1 | 3.1 | 406.2 | 3.6 | 89.2 | 28.1 | 8.5 |
| එළවළු | 26.5 | 0.3 | 28.5 | 0.3 | 2.0 | 7.5 | 0.2 |
| සකස් නොකළ දුම්කොළ | 31.2 | 0.3 | 36.5 | 0.3 | 5.3 | 17.1 | 0.5 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 114.1 | 1.1 | 138.7 | 1.2 | 24.6 | 21.6 | 2.3 |
| මුහුදු ආහාර | 169.6 | 1.6 | 240.6 | 2.1 | 71.0 | 41.9 | 6.8 |
| **කාර්මික අපනයන** | **7,940.1** | **77.0** | **8,541.9** | **75.2** | **601.8** | **7.6** | **57.3** |
| රෙදිපිළි හා ඇඟලුම් | 4,884.1 | 47.4 | 5,031.9 | 44.3 | 147.9 | 3.0 | 14.1 |
| රබර් නිෂ්පාදිත | 767.9 | 7.4 | 835.4 | 7.4 | 67.5 | 8.8 | 6.4 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 286.9 | 2.8 | 434.3 | 3.8 | 147.5 | 51.4 | 14.0 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 273.9 | 2.7 | 257.5 | 2.3 | -16.4 | -6.0 | -1.6 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 323.7 | 3.1 | 392.7 | 3.5 | 69.0 | 21.3 | 6.6 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 317.6 | 3.1 | 370.8 | 3.3 | 53.2 | 16.7 | 5.1 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 42.4 | 0.4 | 48.8 | 0.4 | 6.5 | 15.3 | 0.6 |
| ප්‍රවාහන උපකරණ | 131.5 | 1.3 | 162.3 | 1.4 | 30.8 | 23.4 | 2.9 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 165.6 | 1.6 | 158.4 | 1.4 | -7.2 | -4.4 | -0.7 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 34.4 | 0.3 | 33.7 | 0.3 | -0.7 | -1.9 | -0.1 |
| අනෙකුත් කාර්මික අපනයන | 712.2 | 6.9 | 816.1 | 7.2 | 103.8 | 14.6 | 9.9 |
| **ඛනිජමය අපනයන** | **29.0** | **0.3** | **34.5** | **0.3** | **5.5** | **19.0** | **0.5** |
| **වර්ග නොකළ අපනයන** | **14.5** | **0.1** | **16.9** | **0.1** | **2.3** | **16.0** | **0.2** |
| **මුළු අපනයන (ආ) (ඇ)** | **10,309.7** | **100.0** | **11,360.4** | **100.0** | **1,050.7** | **10.2** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය (ඈ)** | **145.60** | | **152.46** | | | | |

(අ) තාවකාලික
(ආ) ප්‍රති අපනයන ඇතුළත් නොවේ.
(ඇ) ගළපන ලද
(ඈ) විනිමය අනුපාතය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 348 ක් දක්වා සියයට 4.9 කින් පහළ ගියේය. වසර තුළ දී දිසිදි පොල්, පොල් තෙල් සහ කොප්පරා වැනි පොල් මද ආශ්‍රිත නිෂ්පාදිතවල සාමාන්‍ය අපනයන මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් පොල් නිෂ්පාදනය අඩු වීම නිසා අපනයන පරිමා අඩු විය. කෙසේ වුවද, පොල් කෙඳි සහ පොල් ගෙඩි අපනයන ඉහළ යෑම නිසා පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයනවලින් ලද ආදායම එ.ජ. ඩොලර් මිලියන 158 ක් දක්වා සියයට 5.5 කින් වර්ධනය විය.

**මුළු අපනයන ආදායමෙන් සියයට 0.3 ක් පමණක් වූ ඛනිජ අපනයන ආදායම 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 34 ක් දක්වා සියයට 19.0 කින් වර්ධනය විය.** මෙම වර්ධනය සඳහා පාෂාණ හා ගල් අපනයන ද, අනතුරුව ලෝපස්, ලෝබොර හා අළු සහ අගනා ලෝහ අපනයනද දායක විය.

1. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වන සංශෝධනයට අනුව වෙළඳ දත්ත සකස් කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව සකස් කළ අපනයන ක්‍රියාකාරිත්වය පිළිබඳ දත්ත සංඛ්‍යාලේඛන පරිශිෂ්ටයෙහි 68 සහ 69 වන සංඛ්‍යා සටහන්වල දැක්වේ.

### 5.3.2 ආනයන ක්‍රියාකාරිත්වය


**ආනයන වියදම 2016 වසරේදී වාර්තා කළ සුළු ඉහළ යෑම සහ 2015 වසරේදී වූ පහළ යෑම හා සැසඳීමේදී 2017 වසරේදී සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, අයහපත් කාලගුණික තත්ත්වයන්ගේ පසු බලපෑම සහ ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම ඉන් පිළිබිඹු විය.** මෙතෙක් වාර්තා වූ ඉහළම අගය සනිටුහන් කරමින් 2017 වසරේදී ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 20,980 ක් දක්වා සියයට 9.4 කින් ඉහළ ගිය අතර ඉන්ධන ආනයනය ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, ඉන්ධන නොවන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 17,552 ක් දක්වා සියයට 5.1 කින් ඉහළ ගියේය.

**ආනයන වියදම ඉහළ යෑම සඳහා අන්තර් භාණ්ඩ ආනයනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.** මුළු ආනයන වියදමෙන් සියයට 55 ක් පමණ වන අන්තර් භාණ්ඩ ආනයන වියදම, 2017 වසරේදී පසුගිය වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 11,436 ක් දක්වා සියයට 15.9 කින් ඉහළ ගියේය.

බොර තෙල්, පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත සහ ගල්අඟුරු යන සියලුම උප කාණ්ඩවල ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් වසර තුළ දී ඉන්ධන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 3,428 ක් දක්වා සියයට 38.2 කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම රට තුළ පැවති වියළි කාලගුණික තත්ත්වය හමුවේ ඉන්ධන සඳහා දේශීය විදුලිබල උත්පාදන අංශයෙන් වූ ඉහළ ඉල්ලුම නිසා ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය සියයට 45.9 කින් ඉහළ යෑම ඉන්ධන ආනයනය ඉහළ යෑම සඳහා ඉහළම දායකත්වයක් ලබා දුණි. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තෙල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම ද, පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන වියදම ඉහළ යෑම කෙරෙහි බලපෑවේය. ගල් අඟුරු ආනයන වියදම සියයට 32.9 කින් ඉහළ ගිය අතර ආනයන පරිමා අඩු වුවද, ඉහළ මිල ගණන් හේතුවෙන් බොරතෙල් ආනයන වියදම ද සියයට 18.1 කින් ඉහළ ගියේය. ඛනිජ තෙල් අපනයන රටවල සංවිධානය (ඔපෙක්) මගින් සැපයුම සීමා කිරීම මෙන්ම ගෝලීය ආර්ථික වර්ධනය නැවත සවිමත් වීමත් සමඟ ඇති වූ අධික ඉල්ලුම හේතුවෙන් 2017 වසරේදී ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තෙල් මිල ගණන් ඉහළ ගියේය. ඒ අනුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් ආනයනය කළ බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල 2016 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් 46.30 සිට 2017 වසරේදී එ.ජ. ඩොලර් 57.79 ක් දක්වා සියයට 24.8 කින් ඉහළ ගියේය. මේ අතර රත්‍රන් ආනයනය ඉහළ යෑම හේතුවෙන් දියමන්ති, වටිනා ගල් සහ ලෝහ ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. රත්‍රන් ආනයනය මත පනවා තිබූ වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද 2016 වසරේ ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කිරීම හේතුවෙන් මෙම වසර තුළ දී රත්‍රන් ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 650 ක් දක්වා සියයට 73.7 කින් ඉහළ ගියේය. එසේ වුවත්, දේශීය ස්වර්ණාභරණ නිෂ්පාදනයේ හෝ ආභරණ අපනයනවල සැලකිය යුතු ඉහළ යෑමක් සිදු වී නොමැති අතර ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර රත්‍රන් ආනයන මත පවතින බදු අතර වෙනස්කම් තුළින් අයථා ලෙස ලාභ ඉපැයීම් සිදු වෙමින් පවතින බව එමගින් පෙන්නුම් කෙරේ. යකඩ සහ වානේ ආනයනය ඉහළ යෑම පිළිබිඹු කරමින් 2017 වසරේදී මූල ලෝහ ආනයන වියදම ද එ.ජ. ඩොලර් මිලියන 629 ක් දක්වා සියයට 37.8 කින් ඉහළ ගියේය. තිරිඟු සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන් පහළ ගිය ද, ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේදී තිරිඟු හා ඉරිඟු ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 357 ක් දක්වා සියයට 43.1 කින් ඉහළ ගියේය. මීට අමතරව, 2017 වසරේදී ආහාර සැකසුම් ආනයන වියදම ද ඉහළ ගිය අතර, දේශීය පොල් තෙල් නිෂ්පාදනය පහළ යෑම හේතුවෙන් පාම් තෙල් සඳහා ඇති වූ අධික ඉල්ලුම සහ පාම් තෙල් ආනයනය මත පනවා තිබූ බදු අඩු කිරීම හේතුවෙන් පාම් තෙල් ආනයනය සියයට 75.6 කින් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, වසර තුළ දී කෘෂිකාර්මික යෙදවුම්, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ද ඉහළ ගියේය.

**5.4 රූප සටහන**

**ආනයන සංයුතිය - 2017**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**ආනයන වියදම මත ඇති වූ පීඩනය තරමක් දුරට හෝ සමනය කරමින් පොහොර, රසායනික නිෂ්පාදිත සහ ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම මෙම වසර තුළ දී පහළ යෑමක් වාර්තා කළේය.** 2017 වසරේදී පොහොර ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 103 ක් දක්වා සියයට 24.9 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, විශේෂයෙන්ම යූරියා සහ අනෙකුත් නයිට්‍රජන් අඩංගු පොහොර ආනයන පරිමා පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර උප කාණ්ඩ සියල්ලෙහිම පාහේ ආනයන අඩුවීම හේතුවෙන් රසායනික නිෂ්පාදිත ආනයන වියදම සියයට 2.5 කින් පහත වැටුණු අතර සිමෙන්ති ක්ලින්කර ආනයනවල පහළ යෑමක් වාර්තා වීම හේතුවෙන් ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම සියයට 4.9 කින් පහත වැටුණි.

**2017 වසරේදී ආහාර හා පාන වර්ග ආනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 4,503 ක් දක්වා සියයට 4.3 කින් ඉහළ ගියේය.** ප්‍රධාන වශයෙන්ම සහල් ආනයනය ඉහළ යෑම හේතුවෙන් ආහාර හා පාන වර්ග ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,841 ක්

### 5.4 සංඛ්‍යා සටහන
### ආනයන සංයුතිය[2]

| කාණ්ඩය | 2016 | | 2017 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස්වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % (ආ) | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **4,319.0** | **22.5** | **4,502.5** | **21.5** | **183.6** | **4.3** | **10.2** |
| ආහාර හා පාන වර්ග | 1,627.4 | 8.5 | 1,841.1 | 8.8 | 213.6 | 13.1 | 11.9 |
| සහල් | 12.8 | 0.1 | 300.9 | 1.4 | 288.1 | 2,244.7 | 16.0 |
| සීනි හා රසකැවිලි | 344.6 | 1.8 | 258.0 | 1.2 | -86.6 | -25.1 | -4.8 |
| කිරි නිෂ්පාදිත | 249.3 | 1.3 | 315.8 | 1.5 | 66.5 | 26.7 | 3.7 |
| පරිප්පු | 139.4 | 0.7 | 114.4 | 0.5 | -25.0 | -17.9 | -1.4 |
| වෙනත් | 881.3 | 4.6 | 851.9 | 4.1 | -29.4 | -3.3 | -1.6 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 2,691.5 | 14.0 | 2,661.5 | 12.7 | -30.0 | -1.1 | -1.7 |
| රථවාහන | 794.8 | 4.1 | 772.7 | 3.7 | -22.1 | -2.8 | -1.2 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 525.8 | 2.7 | 520.0 | 2.5 | -5.8 | -1.1 | -0.3 |
| ගෘහ උපකරණ | 270.7 | 1.4 | 258.2 | 1.2 | -12.6 | -4.6 | -0.7 |
| රෙදිපිළි හා උපාංග | 365.8 | 1.9 | 369.0 | 1.8 | 3.2 | 0.9 | 0.2 |
| වෙනත් | 734.4 | 3.8 | 741.6 | 3.5 | 7.3 | 1.0 | 0.4 |
| **අන්තර් භාණ්ඩ** | **9,870.0** | **51.5** | **11,435.8** | **54.5** | **1,565.8** | **15.9** | **87.1** |
| ඉන්ධන | 2,481.0 | 12.9 | 3,427.9 | 16.3 | 946.8 | 38.2 | 52.7 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,704.9 | 14.1 | 2,724.2 | 13.0 | 19.3 | 0.7 | 1.1 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ | 514.4 | 2.7 | 772.4 | 3.7 | 258.0 | 50.1 | 14.4 |
| රසායනික නිෂ්පාදිත | 856.3 | 4.5 | 834.5 | 4.0 | -21.8 | -2.5 | -1.2 |
| තිරිඟු හා ඉරිඟු | 249.2 | 1.3 | 356.6 | 1.7 | 107.4 | 43.1 | 6.0 |
| පොහොර | 136.9 | 0.7 | 102.8 | 0.5 | -34.0 | -24.9 | -1.9 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 2,927.3 | 15.3 | 3,217.3 | 15.3 | 290.1 | 9.9 | 16.1 |
| **ආයෝජන භාණ්ඩ** | **4,980.8** (ආ) | **26.0** | **4,894.7** | **23.3** | **-86.1** | **-1.7** | **-4.8** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,568.7 | 8.2 | 1,591.4 | 7.6 | 22.7 | 1.4 | 1.3 |
| ප්‍රවාහන උපකරණ | 662.9 (ආ) | 3.5 | 674.9 | 3.2 | 12.0 | 1.8 | 0.7 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,740.7 | 14.3 | 2,620.6 | 12.5 | -120.1 | -4.4 | -6.7 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 8.5 | … | 7.8 | … | -0.7 | -7.8 | … |
| **වර්ග නොකළ ආනයන** | **13.1** | **0.1** | **146.8** | **0.7** | **133.7** | **1,024.6** | **7.4** |
| **මුළු ආනයන (ඇ) (ඈ)** | **19,182.8** (ආ) | **100.0** | **20,979.8** | **100.0** | **1,797.0** | **9.4** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය (ඉ)** | **145.60** | | **152.46** | | | | |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ප්‍රති ආනයන ඇතුළත් නොවේ.
(ඈ) ගළපන ලද
(ඉ) විනිමය අනුපාතය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5

දක්වා සියයට 13.1 කින් ඉහළ ගියේය. සහල් ආනයන මිල ගණන් සාමාන්‍ය වශයෙන් පහළ ගිය ද, සහල් ආනයන වියදම 2016 වසරේදී වූ එ.ජ. ඩොලර් මිලියන 13 ට සාපේක්ෂව 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 301 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. වගා කන්න දෙකෙහිදීම පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් දේශීය වෙළඳපොළෙහි පැවති සහල් හිඟය සපුරා ගැනීම සඳහා සහල් මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඩු කිරීමේ බලපෑම, සහල් ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑම තුළින් පිළිබිඹු විය. ඒ අනුව, සහල් ආනයන පරිමාව 2016 වසරේදී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 30 සිට 2017 වසරේදී කිලෝග්‍රෑම් මිලියන 748 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, 2017 වසරේදී කිරිපිටි සඳහා වූ ඉහළ වියදම හේතුවෙන් කිරි නිෂ්පාදිත ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 316 ක් දක්වා සියයට 26.7 කින් ඉහළ ගියේය. කිරිපිටි ආනයන පරිමාව සුළු වශයෙන් පහළ ගිය ද, ගෝලීය වෙළඳපොළේ කිරිපිටි මිල ගණන් ඉහළ මට්ටමක පැවති නිසා කිරිපිටි ආනයන මිල ගණන් ඉහළ යෑම, කිරිපිටි ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 294 ක් දක්වා සියයට 27.6 කින් සැලකිය යුතු ලෙස ඉහළ යෑම සඳහා හේතු විය. මීට අමතරව, වසර තුළ දී පලතුරු සහ තෙල් හා මේද ආනයන වියදම පිළිවෙළින් සියයට 14.9 කින් සහ සියයට 28.1 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, සාමාන්‍ය ආනයන මිල ගණන් සහ පරිමා යන දෙකම පහත වැටීමේ බලපෑම හේතුවෙන් සීනි ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 256 ක් දක්වා සියයට 25.2 කින් පහත වැටුණි. තවද, 2017 වසරේදී කුළුබඩු, මුහුදු ආහාර සහ පාන වර්ග ආනයන සඳහා වූ වියදම ද පහළ ගියේය.

2. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වන සංශෝධනයට අනුව වෙළඳ දත්ත සකස් කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව සකස් කළ ආනයන ක්‍රියාකාරිත්වය පිළිබඳ දත්ත සංඛ්‍යාලේඛන පරිශිෂ්ටයෙහි 81 සහ 82 වන සංඛ්‍යා සටහන්වල දැක්වේ.

**5.5 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන ආනයනවල පරිමාවන්**

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 2013 | 2014 | 2015 | 2016 | 2017 (අ) |
|---|---|---|---|---|---|
| **සහල්** | **23** | **600** | **286** | **30** | **748** |
| පළමු කාර්තුව | 9 | 6 | 176 | 6 | 259 |
| දෙවන කාර්තුව | 6 | 102 | 91 | 9 | 79 |
| තෙවන කාර්තුව | 4 | 145 | 9 | 6 | 160 |
| සිව්වන කාර්තුව | 4 | 348 | 9 | 8 | 250 |
| **තිරිඟු (ආ)** | **895** | **1,179** | **1,208** | **948** | **1,250** |
| පළමු කාර්තුව | 197 | 271 | 242 | 171 | 291 |
| දෙවන කාර්තුව | 326 | 324 | 342 | 326 | 334 |
| තෙවන කාර්තුව | 170 | 291 | 373 | 271 | 359 |
| සිව්වන කාර්තුව | 201 | 292 | 251 | 179 | 265 |
| **සීනි** | **548** | **520** | **624** | **651** | **498** |
| පළමු කාර්තුව | 126 | 131 | 169 | 147 | 108 |
| දෙවන කාර්තුව | 175 | 162 | 161 | 144 | 158 |
| තෙවන කාර්තුව | 118 | 152 | 156 | 179 | 101 |
| සිව්වන කාර්තුව | 129 | 75 | 137 | 181 | 132 |
| **බොරතෙල් (ආ)** | **1,743** | **1,824** | **1,763** | **1,685** | **1,591** |
| පළමු කාර්තුව | 482 | 548 | 369 | 372 | 282 |
| දෙවන කාර්තුව | 545 | 365 | 355 | 456 | 376 |
| තෙවන කාර්තුව | 315 | 462 | 472 | 384 | 464 |
| සිව්වන කාර්තුව | 401 | 449 | 567 | 473 | 469 |
| **පිරිපහදු කළ ඛනිජ තෙල් (ආ)** | **2,907** | **3,385** | **3,321** | **3,885** | **4,895** |
| පළමු කාර්තුව | 673 | 970 | 799 | 830 | 1,275 |
| දෙවන කාර්තුව | 756 | 762 | 952 | 1,163 | 1,123 |
| තෙවන කාර්තුව | 791 | 1,006 | 744 | 749 | 1,336 |
| සිව්වන කාර්තුව | 687 | 647 | 826 | 1,142 | 1,161 |
| **පොහොර** | **600** | **765** | **873** | **527** | **399** |
| පළමු කාර්තුව | 61 | 202 | 163 | 139 | 78 |
| දෙවන කාර්තුව | 139 | 190 | 244 | 135 | 73 |
| තෙවන කාර්තුව | 187 | 95 | 189 | 126 | 129 |
| සිව්වන කාර්තුව | 214 | 277 | 277 | 127 | 119 |

(අ) තාවකාලික
(ආ) ගළපන ලද

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම
සීමාසහිත සෙරෙන්ඩිබ් ෆ්ලාර් මිල්ස් පුද්ගලික සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 වසරේදී **ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 2,661 ක් දක්වා සියයට 1.1 කින් පහත වැටුණු අතර මෙම කාණ්ඩය යටතේ වූ බොහෝ ආනයන පහළ යෑම මේ සඳහා හේතු විය.** මෝටර් බයිසිකල් ආනයනය ඉහළ ගිය ද, ප්‍රධාන වශයෙන්ම මෝටර් කාර් ආනයනයේ වාර්තා වූ සියයට 16.2 ක පහළ යෑම හේතුවෙන් පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 773 ක් දක්වා සියයට 2.8 කින් පහළ ගියේය. සියලුම උප කාණ්ඩවල විශේෂයෙන්ම ටයර් සහ ටියුබ් ආනයනය අඩු වීම හේතුවෙන් 2017 වසරේදී රබර් නිෂ්පාදිත ආනයන වියදම ද එ.ජ. ඩොලර් මිලියන 94 ක් දක්වා සියයට 15.8 කින් පහත වැටුණි. මීට අමතරව, වසර තුළ දී ගෘහ උපකරණ (සියයට 4.6), ආලේප වර්ග හා සේදුම් ද්‍රව්‍ය (සියයට 10.8) සහ බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත (සියයට 1.1) සඳහා වූ ආනයන වියදම්ද පහත වැටුණි. මීට වෙනස්ව යමින්, 2017 වසරේදී විදුලි සංදේශ උපාංග, ගෘහ හා දැව උපකරණ සහ රෙදිපිළි හා උපාංග ආනයන වියදම ඉහළ ගියේය.


**යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයනවල පහළ යෑම පිළිබිඹු කරමින් 2017 වසරේදී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.** මුළු ආනයන වියදමෙන් සියයට 23 ක් පමණ වන ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 4,895 ක් දක්වා සියයට 1.7 කින් පහත වැටුණි. කෘෂිකාර්මික හා රෙදිපිළි කර්මාන්තය ආශ්‍රිත යන්ත්‍ර, විද්‍යුත් මෝටර් හා විදුලිජනක කට්ටල, යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොටස් සහ ටර්බයින ආනයන සඳහා වූ වියදම්වල සැලකිය යුතු පහළ යෑම පිළිබිඹු කරමින් යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 2,621 ක් දක්වා සියයට 4.4 කින් පහත වැටුණි. කෙසේ වුවද, 2017 වසරේදී ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,591 ක් දක්වා සියයට 1.4 කින් ඉහළ ගිය අතර යකඩ හා වානේ ආනයන ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර ප්‍රවාහන උපකරණ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 675 ක් දක්වා සියයට 1.8 කින් ඉහළ ගියේය.

### 5.3.3 වෙළඳ ශේෂය

**අපනයන ආදායමෙහි ඉහළ යෑම ඉක්මවා ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේදී වෙළඳ ගිණුමෙහි හිඟය පුළුල් විය.** අයහපත් කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම නිසා ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් වසරේ මුල් භාගයේදී වෙළඳ හිඟය

**5.5 රූප සටහන**

**අපනයන, ආනයන සහ වෙළඳ ශේෂය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5

විශේෂ සටහන 4

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය අනුව ජාත්‍යන්තර වෙළඳ දත්ත සැකසීම

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ දත්ත වාර්තා කිරීම, වෙළඳ නිෂ්පාදන වර්ගීකරණය කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් නාමකරණ සහ අංක වර්ගීකරණ ක්‍රමවේදයක් වන සංයෝජිත වර්ගීකරණ සංකේත (HS Code) මත පදනම් වේ. සංයෝජිත වර්ගීකරණ සංකේත මගින් රටක ප්‍රධාන අපනයන සහ ආනයන අයිතම අයත් වන කාණ්ඩවලට අදාළව දත්ත වර්ගීකරණය කරනු ලැබේ. මෙම ක්‍රමය මගින් අංක හයක මට්ටම දක්වා වෙළඳ දත්ත ජාත්‍යන්තර වශයෙන් සංසන්දනය කිරීමට හැකි වන අතර, රටෙහි අවශ්‍යතා මත පදනම්ව අංක හයේ මට්ටමින් ඔබ්බට සංඛ්‍යාති තොරතුරු හඳුන්වා දීමට සංයෝජිත වර්ගීකරණ සම්මුතිය මගින් රටවල්වලට අවශ්‍ය නම්‍යශීලීත්වය ලබා දී ඇත.[1] ශ්‍රී ලංකා මහ බැංකුවද සංයෝජිත වර්ගීකරණ සංකේත භාවිතයෙන් ජාත්‍යන්තර වෙළඳ දත්ත සැකසීම සහ ප්‍රකාශනය සිදු කරනු ලබන අතර, සංයෝජිත වර්ගීකරණ සම්මුතිය මත පදනම්ව මහ බැංකුව විසින් ශ්‍රී ලංකා රේගුව මගින් ප්‍රකාශිත 'ජාතික ආනයන තීරු බදු ලේඛනය - 2010' පදනම් කර ගනිමින් 2011 වසරේදී ශ්‍රී ලංකාවේ වෙළඳ පැස නැවත වර්ගීකරණය කොට ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව මාසිකව වෙළඳ දත්ත සැකසීම සඳහා ශ්‍රී ලංකා රේගුව වෙතින් ආනයන හා අපනයන දත්ත ලබා ගනී. වෙළඳ දත්ත සැකසීමේ ක්‍රියාවලියේදී, මහ බැංකුව විසින් ප්‍රධාන අපනයන සහ ආනයන අයිතම කිහිපයකට අදාළව සුදුසු පරිදි ගැළපීම් සිදු කරනු ලබයි. මෙම ගැළපීම් වෙළඳ දත්ත ඉහළ නිරවද්‍යතාවයකින් සැකසීම සඳහා උපකාරී වන අතර, එය රටෙහි වෙළඳ ක්‍රියාකාරිත්වය නිසි පරිදි ඇගයීම සඳහා ප්‍රයෝජනවත් වේ. කෙසේ වුවද, වර්තමාන වෙළඳ දත්ත වර්ගීකරණ ක්‍රමය මගින් ශ්‍රී ලංකාවේ විදේශීය වෙළඳාමේ ප්‍රවණතා සහ ක්‍රියාකාරිත්වය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි වුවද, විශේෂයෙන්ම, දත්ත ජාත්‍යන්තර වශයෙන් සංසන්දනය කිරීමේ දී ඇතැම් සීමා පවතී. ශ්‍රී ලංකාව සඳහා ඉහළ ඉඩ ප්‍රස්ථා පවතින වෙළඳපොළ ගවේෂණය කිරීම, අපනයන පදනම පුළුල් කිරීම සහ ප්‍රධාන ගෝලීය අගයදාම තුළ ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම වැනි ප්‍රතිපත්ති ගණනාවක් සක්‍රීය ලෙස අනුගමනය කෙරෙන මෙවැනි අවස්ථාවකදී ජාත්‍යන්තරව පිළිගත් මනා පරිචයන්ට සහ සම්මතයන්ට අනුකූලව සකස් කරන ලද ගුණාත්මකභාවයකින් යුත් දත්ත සැකසීම වැදගත් අවශ්‍යතාවක් වේ.

1 අංක හයක මට්ටම දක්වා පමණක් වෙළඳ දත්ත සංයෝජිත අතර, ඉන් ඔබ්බට රටරටවලට විශේෂිත වූ වර්ගීකරණ සඳහා ඉඩ සලසා ඇත.

### සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය

සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට අනුව සකස් කරන ලද භාණ්ඩ වෙළඳාම පිළිබඳ දත්ත වර්ගීකරණය, රටවල් අතර වෙළඳ දත්ත සංසන්දනය කිරීම සඳහා පුළුල් ලෙස භාවිත කෙරේ. මේ අනුව, ජාත්‍යන්තර සම්මතයන්ට අනුගත වීමේ වැදගත්කම හඳුනා ගෙන වෙළඳ දත්ත වර්ගීකරණය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් නිර්දේශ කළ ජාත්‍යන්තරව පිළිගත් සම්මත ක්‍රමවේදයක් වන 'සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය'ට (Standard International Trade Classification) අනුව වෙළඳ දත්ත සැකසීම මහ බැංකුව විසින් ආරම්භ කොට ඇත. එමගින් රටෙහි වෙළඳ දත්ත ජාත්‍යන්තරව සංසන්දනය කිරීමේ හැකියාව ලැබෙන අතර, වෙළඳ භාණ්ඩ මට්ටමින් ජාත්‍යන්තර වෙළඳාමේ නවතම ප්‍රවණතා පිළිබඳව බොහෝ දුරට නිවැරදි තොරතුරු සපයනු ලැබේ. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි නිතර සංශෝධන සිදු නොවීම හේතුවෙන් එය ජාත්‍යන්තර භාණ්ඩ වෙළඳාමේ දිගුකාලීන ප්‍රවණතා අධ්‍යයනය සඳහා යොදා ගත හැකිය. එමනිසා, සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය වඩාත් විද්‍යාත්මක සහ ප්‍රබල විශ්ලේෂණ සඳහා පහසුකම් සපයන අතර, මෙම දත්ත ප්‍රතිපත්ති සම්පාදකයන් හට මෙන්ම පර්යේෂකයන්ටද ප්‍රයෝජනවත් වේ.

### සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ ව්‍යුහය

සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණ ක්‍රමය ප්‍රථම වරට 1950 වසරේදී හඳුන්වා දුන් අතර, වෙළඳ පරිමාව ඉහළ යෑම සහ භූගෝලීය හා වෙළඳ භාණ්ඩ රටාවල සිදු වූ වෙනස්කම් මෙන්ම, තාක්ෂණික වෙනස්කම් හේතුවෙන් එම වර්ගීකරණයෙහි සංශෝධන කිහිපයක් සිදු කරන ලදි. 2006 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද සිව් වැනි සංශෝධනය (සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය - සිව්වන සංශෝධනය) වෙළඳ දත්ත ජාත්‍යන්තර වශයෙන් සංසන්දනය කිරීම සහ විශ්ලේෂණාත්මක අගයන් තහවුරු කිරීම උදෙසා දැනට බොහෝ රටවල් භාවිත කරයි.

සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය මත පදනම්ව පුළුල් ආර්ථික විශ්ලේෂණයක් සඳහා පහසුකම් සැලසීමට වෙළඳ නිෂ්පාදිත, එහි ද්‍රව්‍යමය හා භෞතික ගුණාංග මත පමණක් නොව සැකසීමේ පියවර හා ආර්ථික ක්‍රියාකාරිත්වය අනුවද වර්ග කෙරේ. එක්සත් ජාතීන්ගේ උපදෙස් මාලාව අනුව, සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වැනි සංශෝධනය තනි අංකයක් සහිත කේතයකින් හඳුන්වන අංශ 10 කින් ද, අංක දෙකක් සහිත කේතයකින් හඳුන්වන කාණ්ඩ 67 කින් ද, අංක තුනක් සහිත කේතයකින් හඳුන්වන සමූහ 262 කින් ද, අංක හතරක් සහිත

5

කේතයකින් හඳුන්වන උප සමූහ 1,023 කින් ද, අංක පහක් සහිත කේතයකින් හඳුන්වන මූලික ශීර්ෂ 2,970 කින් ද සමන්විත වේ. එමනිසා, වෙළඳ පැසක් තුළ ඇති අයිතම ඉදිරිපත් කිරීමේදී සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය, ධූරාවලි ව්‍යුහයක් අනුගමනය කරයි.

සියලුම වෙළඳ අයිතම සහ එහි ධූරාවලි ව්‍යුහය සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වැනි සංශෝධනයට අනුව වර්ගීකරණය කරනු ලබන ආකාරය සංඛ්‍යා සටහන වි.ස. 4.1 මගින් නිරූපණය කෙරේ.

**සංඛ්‍යා සටහන වි.ස. 4.1**
**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය සිව්වන සංශෝධනයේ වර්ගීකරණ ක්‍රමය**

| අංශයේ අංකය | අංශය | භාණ්ඩ සංඛ්‍යාව | සමූහ සංඛ්‍යාව | උප සමූහ සංඛ්‍යාව | මූලික ශීර්ෂ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 0 | ආහාර හා සජීවී සතුන් | 10 | 36 | 132 | 335 |
| 1 | පාන වර්ග හා දුම්කොළ | 2 | 4 | 11 | 21 |
| 2 | ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය | 9 | 36 | 115 | 239 |
| 3 | ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 4 | 11 | 22 | 32 |
| 4 | සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි | 3 | 4 | 21 | 41 |
| 5 | රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 9 | 34 | 132 | 467 |
| 6 | ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ | 9 | 52 | 229 | 767 |
| 7 | යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහන උපකරණ | 9 | 50 | 217 | 642 |
| 8 | විවිධ නිෂ්පාදන උපාංග | 8 | 31 | 140 | 420 |
| 9 | සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු | 4 | 4 | 4 | 6 |
| **මුළු භාණ්ඩ, සමූහ, උප සමූහ සහ මූලික ශීර්ෂ (අයිතම)** | | **67** | **262** | **1,023** | **2,970** |

මූලය: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය - සිව්වන සංශෝධනය, (2006), එක්සත් ජාතීන්ගේ සංවිධානය

මෙම වර්ගීකරණ ක්‍රමවේදය පැහැදිලි කිරීම සඳහා උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික අපනයන අයිතමයක් වන 'තේ' සඳහා වන ධූරාවලි ව්‍යුහය සංඛ්‍යා සටහන වි.ස.4.2 හි දක්වා ඇත. මෙම ව්‍යුහය අනුව, තේ, ආහාර හා සජීවී සතුන් යටතේ හතරවන මට්ටමේ (තේ, රසකාරක මිශ්‍ර කළ හෝ නොකළ) උප සමූහයට අයත් වේ. පස්වන මට්ටමේදී එම අයිතමය මූලික මාතෘකා හතරක් යටතේ තවදුරටත් එම නිෂ්පාදිත විවිධ ස්වරූප යටතේ වර්ග කර ඇත. කෙසේ වුවද, දැනට පවතින වෙළඳ වර්ගීකරණයෙහි තේ අපනයන, කෘෂිකාර්මික අපනයන යටතේ වර්ග කර ඇත.

**සංඛ්‍යා සටහන වි.ස. 4.2**
**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වන සංශෝධනය අනුව තේ සඳහා ධූරාවලි ව්‍යුහය**

| මට්ටම | කේතය | විස්තරය |
|---|---|---|
| අංශය | 0 | ආහාර හා සජීවී සතුන් |
| භාණ්ඩය | 07 | කෝපි, තේ, කොකෝවා, කුළුබඩු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත |
| සමූහය | 074 | තේ හා එවැනි පාන වර්ග |
| උප සමූහය | 074.1 | තේ, රසකාරක මිශ්‍ර කළ හෝ නොකළ |
| මූලික ශීර්ෂය | 074.11 | හරිත තේ (පැසවීම නොකළ), ආසන්නම ඇසුරුම්වල කිලෝග්‍රෑම් 3 කට නොවැඩි, රසකාරක මිශ්‍ර කළ හෝ නොකළ |
| | 074.12 | වෙනත් හරිත තේ (පැසවීම නොකළ), රසකාරක මිශ්‍ර කළ හෝ නොකළ |
| | 074.13 | කළු තේ (පැසවීම කළ) සහ අර්ධ වශයෙන් පැසවීම කළ තේ, ආසන්නම ඇසුරුම්වල කිලෝග්‍රෑම් 3 කට නොවැඩි, රසකාරක මිශ්‍ර කළ හෝ නොකළ |
| | 074.14 | වෙනත් කළු තේ (පැසවීම කළ) සහ වෙනත් අර්ධ වශයෙන් පැසවීම කළ තේ, රසකාරක මිශ්‍ර කළ හෝ නොකළ |

මූලය: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය - සිව්වන සංශෝධනය, (2006), එක්සත් ජාතීන්ගේ සංවිධානය

### වෙළඳ දත්ත සංසන්දනය

වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන වර්ගීකරණයට අනුව මට්ටම් හතරක් යටතේ වෙළඳ දත්ත වර්ග කර ඇති අතර, සෑම අයිතමයක්ම ප්‍රධාන භාණ්ඩයක්, උප භාණ්ඩයක්, අයිතමයක් හා උප අයිතමයක් යටතේ දක්වා ඇත. මේ අනුව, එකතු කළ අගය මට්ටම් පදනම්ව අපනයන අයිතම 8,000 ක් පමණ කෘෂිකාර්මික අපනයන, කාර්මික අපනයන, ඛනිජමය අපනයන සහ වර්ග නොකළ අපනයන යන ප්‍රධාන භාණ්ඩ යටතේ වර්ග කර ඇත. ප්‍රාථමික ස්වරූප හෝ සාපේක්ෂව පහළ මට්ටමක එකතු කළ අගයක් සහිත අපනයන අයිතම


5

කෘෂිකාර්මික හෝ ඛනිජමය අපනයන යටතේ වර්ග කර ඇති අතර, සැලකිය යුතු ඉහළ මට්ටමක එකතු කළ අගයන් සහිත අයිතම, කාර්මික අපනයන යටතේ වර්ග කර ඇත. එමෙන්ම, ආනයන අයිතම 13,000 ක් පමණ පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ, ආයෝජන භාණ්ඩ හා වර්ග නොකළ ආනයන යන ප්‍රධාන කාණ්ඩ යටතේ වර්ග කර ඇති අතර, මූලික වශයෙන් දැනට පවතින තීරු බදු ව්‍යුහය මත පදනම් ව මෙම වර්ගීකරණ සිදු කොට ඇත. පාරිභෝගික භාණ්ඩ අධික ලෙස ආනයනය කිරීම සීමා කිරීම් සඳහා සාමාන්‍යයෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන මත ඉහළ තීරු බදු පනවා ඇති අතර, ආයෝජන භාණ්ඩ හා අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ මත ශුන්‍ය හෝ අඩු තීරු බදු අනුපාතික පනවා ඇත. ප්‍රධාන වශයෙන්ම අන්තර් භාණ්ඩ මත මධ්‍යස්ථ මට්ටමේ තීරු බදු පනවා ඇත. මීට අමතරව, ආනයනය කරන නිමි භාණ්ඩ, පාරිභෝගික භාණ්ඩ යටතේ හෝ ආයෝජන භාණ්ඩ යටතේ වර්ග කර ඇත (උදා: බස්රථ ආයෝජන භාණ්ඩ යටතේ වර්ග කර ඇති අතර, මෝටර් රථ පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇත). එසේම, අතරමැදි කාර්යයන් සඳහා ආනයනය කරනු ලබන රෙදිපිළි හා ඛනිජ තෙල් වැනි භාණ්ඩ අන්තර් භාණ්ඩ යටතේ වර්ග කර ඇත. තවද, අර්ධ වශයෙන් සකස් කර ආනයනය කරනු ලබන අයිතම ඒවායේ එකතු කළ අගය මට්ටම මත වර්ගීකරණය කර ඇති අතර, ඒ අනුව සාපේක්ෂව අඩු එකතු කළ අගයක් සහිත අයිතම පාරිභෝගික භාණ්ඩ යටතේද, සාපේක්ෂව ඉහළ එකතු කළ අගයක් සහිත අයිතම අන්තර් භාණ්ඩ යටතේද වර්ග කර ඇත. ආර්ථිකයෙහි විවිධ පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය උදෙසා සහ ප්‍රතිපත්ති සම්පාදන කටයුතු සඳහා අදාළ විශ්ලේෂණ සිදු කිරීමට මහ බැංකුව වෙළඳ දත්ත ඉදිරිපත් කිරීමේදී මෙම වර්ගීකරණය යොදා ගනී.

කෙසේ වුවද, සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට අනුව අයිතම ඒවායේ ද්‍රව්‍යමය හා භෞතික ගුණාංග, සැකසුම් අවස්ථා, වෙළඳපොළ ක්‍රියාකාරිත්වය හා එම නිෂ්පාදිතවල භාවිතයන්, ගෝලීය වෙළඳාමේදී එම වෙළඳ භාණ්ඩවල වැදගත්කම සහ තාක්ෂණික වෙනස්කම් පදනම් කර ගනිමින් ප්‍රධාන වශයෙන් අංශ දහයකට වර්ගීකරණය කරනු ලබයි. ඒ අනුව, දැනට සංයෝජිත වර්ගීකරණ සංකේත භාවිතයෙන් සකස් කර ඇති වෙළඳ දත්ත, සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය භාවිතයෙන් ජාත්‍යන්තරව සංසන්දනය කිරීමට ඉඩ සැලසෙන පරිදි ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ දත්ත නැවත වර්ගීකරණය කළ හැකිය.

රූප සටහන වි.ස. 4.1 මගින් දැනට පවතින වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය අතර ඇති සම්බන්ධතාව ඉදිරිපත් කර ඇත.

### රූප සටහන වි.ස. 4.1
### මහ බැංකුව විසින් භාවිත කරන වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය අතර සම්බන්ධතාව




මෙම වර්ගීකරණ ක්‍රම දෙක සඳහා වූ ක්‍රමවේදයන්හි වෙනස්කම් තිබුණද සමස්ත අපනයන සහ ආනයන සංඛ්‍යාති, සකස් කිරීමේ අවසන් අදියරේදී අගය සමාන වනු ඇත. එමනිසා, මෙලෙස නැවත වර්ගීකරණය කිරීම හේතුවෙන් වටිනා තොරතුරු කිසිවක් මගහැරීම හෝ අත්හැරීම සිදු නොවේ. සම්මත ජාත්‍යන්තර වර්ගීකරණය අනුව සකස් කළ දත්ත ශ්‍රී ලංකා මහ බැංකුවේ 2017 වාර්ෂික වාර්තාවෙහි අන්තර්ගත වේ (සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටයෙහි - අංක 68, 69, 81 සහ 82 සංඛ්‍යා සටහන්). සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය විශ්ලේෂණාත්මක මෙවලමක් ලෙස සලකනු ලබන අතර, සංයෝජිත වර්ගීකරණ කේත ක්‍රමය දේශීය ප්‍රතිපත්ති අරමුණු සඳහා වෙළඳ දත්ත සැකසීමට සහ බෙදා හැරීමට අවශ්‍ය වන හෙයින් ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ක්‍රම දෙක මත පදනම්ව වෙළඳ දත්ත සැකසීම සිදු කිරීමට අදහස් කරන අතර, එම දත්ත ප්‍රධාන ප්‍රකාශන සහ දත්ත පදනම් තුළ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මූලාශ්‍රය:
සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය - සිව්වන සංශෝධනය (2006), එක්සත් ජාතීන්ගේ සංවිධානය

5

සැලකිය යුතු ලෙස පුළුල් විය. කෙසේ වුවද, ජී.එස්.පී. ප්ලස් පහසුකම නැවත ස්ථාපනය කිරීමේ යහපත් බලපෑම පිළිබිඹු කරමින් අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් වසරේ දෙවන භාගයේදී වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වීම මන්දගාමී විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 8,873 ක් වූ වෙළඳ හිඟය 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 9,619 ක් දක්වා පුළුල් විය. වෙළඳ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේදී වූ සියයට 10.9 ට සාපේක්ෂව 2017 වසරේදී සියයට 11.0 ක් දක්වා පුළුල් විය.

### 5.3.4 වෙළඳ මිල අනුපාතය

**ආනයන මිල දර්ශකයට සාපේක්ෂව වඩා ඉහළ අනුපාතයකින් අපනයන මිල දර්ශකය ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේදී ශ්‍රී ලංකාවේ වෙළඳ මිල අනුපාතය වර්ධනය විය.** 2017 වසර තුළදී ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් අපනයන මිල දර්ශකය, දර්ශක අංක 96.4 ක් දක්වා සියයට 2.4 කින් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය, දර්ශක අංක 91.3 ක් දක්වා සියයට 1.2 ක පහළ අනුපාතයකින් ඉහළ ගියේය. මෙම ප්‍රවණතා සමග

**5.6 සංඛ්‍යා සටහන**

**වෙළඳ දර්ශක (අ)**

2010 = 100


| කාණ්ඩය | වටිනාකම් දර්ශකය | | | පරිමා දර්ශකය | | | ඒකක වටිනාකම් දර්ශකය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017(ආ) | වර්ධනය% | 2016 | 2017 (ආ) | වර්ධනය% | 2016 | 2017(ආ) | වර්ධනය% |
| අපනයන | | | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **100.9** | **120.0** | **19.0** | **90.8** | **96.5** | **6.3** | **111.2** | **124.3** | **11.9** |
| තේ | 88.1 | 106.2 | 20.5 | 86.2 | 87.4 | 1.3 | 102.2 | 121.6 | 18.9 |
| රබර් | 18.9 | 22.5 | 19.1 | 27.2 | 31.4 | 15.5 | 69.4 | 71.6 | 3.1 |
| පොල් | 220.9 | 210.0 | -4.9 | 174.1 | 154.5 | -11.3 | 126.9 | 136.0 | 7.1 |
| කුළුබඩු | 153.0 | 196.1 | 28.1 | 100.3 | 132.2 | 31.8 | 152.6 | 148.3 | -2.8 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 159.7 | 194.2 | 21.6 | 149.6 | 169.8 | 13.5 | 106.8 | 114.4 | 7.1 |
| **කාර්මික අපනයන** | **130.3** | **140.2** | **7.6** | **144.9** | **156.3** | **7.9** | **89.9** | **89.7** | **-0.3** |
| රෙදිපිළි හා ඇඟලුම් | 145.6 | 150.0 | 3.0 | 127.1 | 129.8 | 2.1 | 114.6 | 115.6 | 0.9 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 109.0 | 165.0 | 51.4 | 185.8 | 228.5 | 23.0 | 58.6 | 72.2 | 23.1 |
| රබර් නිෂ්පාදිත | 137.9 | 150.1 | 8.8 | 104.2 | 109.4 | 5.0 | 132.4 | 137.2 | 3.6 |
| **ඛනිජමය අපනයන** | **119.7** | **142.4** | **19.0** | **88.9** | **105.6** | **18.8** | **134.6** | **134.8** | **0.2** |
| **මුළු අපනයන** | **119.6** | **131.8** | **10.2** | **127.0** | **136.7** | **7.6** | **94.1** | **96.4** | **2.4** |
| ආනයන | | | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **174.5** | **182.0** | **4.3** | **156.5** | **167.4** | **6.9** | **111.5** | **108.7** | **-2.5** |
| ආහාර හා පාන වර්ග | 123.0 | 139.2 | 13.1 | 124.1 | 146.7 | 18.2 | 99.1 | 94.8 | -4.3 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 233.7 | 231.1 | -1.1 | 193.8 | 191.0 | -1.4 | 120.6 | 121.0 | 0.3 |
| **අන්තර් භාණ්ඩ** | **122.6** | **142.1** | **15.9** | **142.5** | **158.6** | **11.3** | **86.0** | **89.6** | **4.1** |
| ඉන්ධන | 81.6 | 112.7 | 38.2 | 129.5 | 150.7 | 16.4 | 63.0 | 74.8 | 18.7 |
| පොහොර | 57.0 | 42.8 | -24.9 | 68.6 | 53.7 | -21.7 | 83.1 | 79.7 | -4.1 |
| රසායනික නිෂ්පාදිත | 164.7 | 160.5 | -2.5 | 163.4 | 161.6 | -1.1 | 100.8 | 99.3 | -1.5 |
| තිරිඟු සහ ඉරිඟු | 93.9 | 134.4 | 43.1 | 92.7 | 134.0 | 44.5 | 101.3 | 100.3 | -1.0 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 149.5 | 150.6 | 0.7 | 138.2 | 137.6 | -0.4 | 108.2 | 109.4 | 1.1 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 146.1 | 149.6 | 2.4 | 155.7 | 160.5 | 3.1 | 93.8 | 93.2 | -0.7 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ | 136.2 | 204.6 | 50.1 | 155.0 | 232.2 | 49.8 | 87.9 | 88.1 | 0.2 |
| **ආයෝජන භාණ්ඩ** | **180.8 (ඇ)** | **177.7** | **-1.7** | **208.9 (ඇ)** | **208.7** | **-0.1** | **86.5 (ඇ)** | **85.1** | **-1.6** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 190.9 | 193.7 | 1.4 | 206.2 | 220.1 | 6.8 | 92.6 | 88.0 | -5.0 |
| ප්‍රවාහන උපකරණ | 111.9 (ඇ) | 113.9 | 1.8 | 110.9 (ඇ) | 112.8 | 1.8 | 100.9 (ඇ) | 101.0 | … |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 204.9 | 195.9 | -4.4 | 253.9 | 244.2 | -3.8 | 80.7 | 80.2 | -0.6 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 254.0 | 234.1 | -7.8 | 262.0 | 224.6 | -14.3 | 96.9 | 104.2 | 7.6 |
| **මුළු ආනයන** | **143.1 (ඇ)** | **156.5** | **9.4** | **158.5 (ඇ)** | **171.3** | **8.1** | **90.2 (ඇ)** | **91.3** | **1.2** |
| **වෙළඳ මිල අනුපාතය** | | | | | | | **104.3 (ඇ)** | **105.5** | **1.2** |

(අ) එ.ජ. ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ලංකා අයි.ඕ.සී සමාගම
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**5.6 රූප සටහන**

**වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2016 වසරේදී දර්ශක අංක 104.3 ක්ව පැවති වෙළඳ මිල අනුපාතය 2017 වසරේදී දර්ශක අංක 105.5 ක් දක්වා සියයට 1.2 කින් වර්ධනය විය.

**කෘෂිකාර්මික අපනයනවල මිල ගණන් සියයට 11.9 කින් ඉහළ යෑම හේතුවෙන් සමස්ත අපනයන මිල දර්ශකය ඉහළ ගියේය.** 2017 වසර තුළ තේ සඳහා වූ අපනයන මිල ගණන් සියයට 18.9 කින් ඉහළ ගිය අතර, පොල් සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත යන කාණ්ඩ දෙක සඳහා වූ අපනයන මිල දර්ශක දෙකම සියයට 7.1 කින් ඉහළ ගියේය. කෙසේ වුව ද, කුළුබඩු සඳහා වූ අපනයන මිල දර්ශකයෙහි අඩු වීමක් වාර්තා විය. මේ අතර, ප්‍රධාන වශයෙන්ම ප්‍රවාහන උපකරණ, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සඳහා වූ අපනයන මිල දර්ශක පහළ යෑම හේතුවෙන් 2017 වසර තුළ කාර්මික අපනයන මිල දර්ශකය සියයට 0.3 කින් සුළු වශයෙන් අඩු විය. කෙසේ වුව ද, ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා වූ මිල දර්ශකය සියයට 23.1 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, ඒ සමඟ රබර් නිෂ්පාදිත (සියයට 3.6), පිඟන් මැටි නිෂ්පාදිත (සියයට 1.8) සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ (සියයට 1.8) සඳහා වූ අපනයන මිල දර්ශකද ඉහළ ගියේය. 2017 වසරේ පළමු භාගය තුළ රෙදිපිළි හා ඇඟලුම්වලට අදාළ අපනයන මිල දර්ශකය සියයට 1.6 කින් පහත වැටුණද වසර අවසානය වනවිට සියයට 0.9 ක සුළු වර්ධනයක් වාර්තා විය.

**2017 වසර තුළ, ආනයන මිල දර්ශකයේ ඉහළ යෑම සඳහා අන්තර් භාණ්ඩ හේතු වූ අතර, පාරිභෝගික භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ ආනයන මිල දර්ශක පසුගිය වසරට සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි.** 2017 වසරේදී අන්තර් භාණ්ඩවලට අදාළ ආනයන මිල දර්ශකය සියයට 4.1 කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ඉන්ධන සඳහා වූ ආනයන මිල දර්ශකය සියයට 18.7 කින් වර්ධනය වීමයි. තවද, 2017 වසරේදී රථවාහන හා යන්ත්‍රසූත්‍ර කොටස්, සකස් නොකළ දුම්කොළ සහ මූල ලෝහ ඇතුළු අන්තර් භාණ්ඩ කාණ්ඩය තුළ ඇති ඇතැම් උප කාණ්ඩ සඳහා වූ ආනයන මිල දර්ශක ඉහළ ගියේය. මෙයට වෙනස්ව යමින්, ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ආනයන මිල දර්ශකය සුළු වශයෙන් ඉහළ ගිය ද, ආහාර හා පාන වර්ගවල මිල ගණන් පහළ යෑම පිළිබිඹු කරමින් පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ආනයන මිල දර්ශකය සියයට 2.5 කින් පහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළ, ආහාර හා පාන වර්ග කාණ්ඩය යටතේ වර්ග කර ඇති සහල්, කුළුබඩු, එළවළු, පාන වර්ග හා සීනි සඳහා වූ ආනයන මිල දර්ශක පහළ ගිය අතර, කිරි නිෂ්පාදිත සඳහා වූ මිල දර්ශකයෙහි කැපී පෙනෙන වර්ධනයක් වාර්තා විය. 2017 වසරේදී ගොඩනැගිලි ද්‍රව්‍ය සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ සඳහා වූ මිල ගණන්වල පහළ යෑමක් පිළිබිඹු කරමින් ආයෝජන භාණ්ඩ සඳහා වූ ආනයන මිල දර්ශකය සියයට 1.6 කින් පහළ ගියේය.

### 5.3.5 වෙළඳ දිශාව


**2017 වසරේදී ද ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වෙළඳ හවුල්කරුවා ලෙස ඉන්දියාවද ඉන් අනතුරුව චීනය සහ ඇමෙරිකා එක්සත් ජනපදයද පැවති අතර මෙම රටවල් තුන සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය සමස්ත විදේශීය වෙළඳාමෙන් සියයට 40 ක් පමණ විය.** 2017 වසරේදී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 5 ඉක්මවූ අතර එය සමස්ත විදේශීය වෙළඳාම සඳහා සියයට 16.1 කින් දායක විය. චීනය සහ ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය පිළිවෙළින් එ.ජ. ඩොලර් බිලියන 4 සහ එ.ජ. ඩොලර් බිලියන 3 ඉක්මවීය. මීට අමතරව, 2017 වසරේදී එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව, එක්සත් රාජධානිය සහ ජපානය වැනි රටවල් සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවීය. 2017 වසරේදී ඉන්දියාව, සිංගප්පූරුව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජපානය සහ ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව ඉහළ ගිය අතර, චීනය සහ එක්සත් රාජධානිය සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය පහළ ගියේය. පසුගිය වසරවල විදේශීය වෙළඳාමෙහි දක්නට ලැබුණු ප්‍රවණතා තවදුරටත් පවත්වා ගනිමින්, විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය

වැනි බටහිර රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත ලෙස පැවති අතර, විශේෂයෙන්ම ඉන්දියාව සහ චීනය වැනි ආසියානු රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභව බවට පත් විය.

**මුළු අපනයන ආදායමෙන් සියයට 25.6 ක් පමණ වාර්තා කරමින් 2017 වසරේදී ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ප්‍රධාන ගැනුම්කරු ලෙස තවදුරටත් පැවති අතර, අනතුරුව එක්සත් රාජධානිය (සියයට 9.1) සහ ඉන්දියාව (සියයට 6.1) පැවතුණි.** 2017 වසරේදී ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ මුළු අපනයනවල වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 2,909 ක් දක්වා සියයට 3.5 කින් ඉහළ ගිය අතර, ඇඟලුම්, රබර් නිෂ්පාදිත සහ මුහුදු ආහාර, ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ මුළු අපනයනවලින් සියයට 85 ක් පමණ විය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ඇඟලුම් අපනයන ගමනාන්තය වන ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ ඇඟලුම් අපනයනවලින් ලැබුණු ආදායම එ.ජ. ඩොලර් මිලියන 2,140 ක් වූ අතර එය මුළු ඇඟලුම් අපනයනවලින් සියයට 45.2 ක් විය. දෙවැනි විශාලතම අපනයන ගමනාන්තය වන එක්සත් රාජධානිය වෙත 2017 වසරේදී සිදු කළ අපනයනවලින් ලද ආදායම සුළු වශයෙන් අඩු වූ අතර, ඒ සඳහා ඇඟලුම්, පොල් ආශ්‍රිත නිෂ්පාදිත සහ රබර් ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම පහළ යෑම ප්‍රධාන වශයෙන්ම හේතු විය. කෙසේ වුව ද, 2017 වසර තුළ එක්සත් රාජධානිය වෙත සිදු කළ මුහුදු ආහාර, සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් සහ තේ අපනයනයෙන් ලැබූ ආදායම ඉහළ ගියේය. ශ්‍රී ලංකාවේ තෙවැනි විශාලතම අපනයන ගමනාන්තය වන ඉන්දියාව වෙත සිදු කළ අපනයන 2017 වසරේදී සියයට 24.8 කින් වර්ධනය වූ අතර ඛනිජ තෙල් නිෂ්පාදිත සහ කුළුබඩු අපනයන ආදායම්වල වූ කැපී පෙනෙන වර්ධනය ඒ සඳහා හේතු විය. මීට අමතරව, 2017 වසරේදී ඉන්දියාව වෙතින් ලද අපනයන ආදායම ඉහළ යෑම සඳහා මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, සත්ත්ව ආහාර සහ ඇඟලුම් අපනයන ඉහළ යෑම දායක විය. තවද, ජර්මනිය සහ ඉතාලිය ශ්‍රී ලංකාවේ සිව්වැනි සහ පස්වැනි විශාලතම අපනයන ගමනාන්ත ලෙස පැවති අතර, 2017 වසරේදී එම රටවල් වෙතින් ලද අපනයන ආදායම පිළිවෙළින් සියයට 8.1 කින් සහ සියයට 21.9 කින් ඉහළ ගියේය. ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ඇඟලුම් අපනයනය ඉහළ යෑමයි. ජී.එස්.පී. ප්ලස් පහසුකම ප්‍රතිස්ථාපනය වීමත් සමඟ 2017 වසරේදී ඉතාලිය,


5

**5.7 රූප සටහන**
**අපනයන වෙළඳ දිශාව**



මූලය: ශ්‍රී ලංකා රේගුව

**5.8 රූප සටහන**
**ආනයන වෙළඳ දිශාව**



මූලය: ශ්‍රී ලංකා රේගුව

නෙදර්ලන්තය, ස්වීඩනය, ජර්මනිය සහ ඩෙන්මාර්කය වෙතින් වූ ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් යුරෝපා සංගමය වෙත සිදු කළ මුළු ඇඟලුම් අපනයනවලින් ලැබුණු ආදායම සියයට 4.0 කින් ඉහළ යෑම හේතුවෙන් යුරෝපා සංගමය වෙතින් ලැබුණු මුළු අපනයන ආදායම ඉහළ ගියේය. යුරෝපා සංගමය වෙතින් ලැබුණු මුළු අපනයන ආදායමෙන් සියයට 60 කට පමණ දායක වෙමින් ඇඟලුම්, එම කලාපය වෙත අපනයනය කරන ප්‍රධාන අපනයන අයිතමය ලෙස අඛණ්ඩව පැවතුණි. මීට අමතරව, යුරෝපා සංගමය වෙත මුහුදු ආහාර අපනයන සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීමත්, ජී.එස්.පී. ප්ලස් පහසුකම ප්‍රතිස්ථාපනය වීමත් හේතුවෙන් යුරෝපා සංගමය වෙතින් ලැබුණු මුළු අපනයන ආදායමෙන් සියයට 2.0 කට දායක වූ මුහුදු ආහාර අපනයන ආදායම 2017 වසරේදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මැදපෙරදිග සහ රුසියාව ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් 2017 වසරේදී එම රටවල් වෙත ශ්‍රී ලංකාවේ තේ අපනයනය කිරීමෙන් ලද ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. මේ අනුව, 2017 වසරේදී තුර්කිය, ඉරාකය සහ රුසියාව වෙත සිදු කළ තේ අපනයන මගින් ලැබුණු ආදායම සමස්ත තේ අපනයන ආදායමෙන් සියයට 32.3 ක් විය. 2017 වසරේදී ශ්‍රී ලංකාව අපනයනය කළ මුළු තේවලින් සියයට 44.5 ක් මැදපෙරදිග කලාපය වෙතද සියයට 11.4 ක් රුසියාවටද අපනයනය කෙරිණ.

**මුළු ආනයන වියදමෙන් සියයට 21.6 කට කැපී පෙනෙන ලෙස දායක වෙමින් 2017 වසරේදී ඉන්දියාව නැවතත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන මූලාශ්‍රය බවට පත් විය.** 2017 වසරේදී ඉන්දියාවෙන් ආනයනය කළ භාණ්ඩ සඳහා වූ වියදම එ.ජ. ඩොලර් මිලියන 4,527 ක් දක්වා සියයට 18.7 කින් ඉහළ ගිය අතර බනිජ තෙල් නිෂ්පාදිත, සහල්, මූල ලෝහ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන ඒ සඳහා හේතු විය. මේ අතර, 2017 වසරේදී දෙවැනි විශාලතම ආනයන ප්‍රභවය වන චීනය සමස්ත ආනයන වියදමෙන් සියයට 18.9 ක දායකත්වයක් දැක් වූ අතර චීනය වෙත සිදු කළ ආනයන එ.ජ. ඩොලර් මිලියන 3,955 ක් දක්වා සියයට 1.0 ක සුළු පහළ යෑමක් වාර්තා කළේය. චීනයෙන් ආනයනය කළ ප්‍රවාහන උපකරණ, බනිජ තෙල් නිෂ්පාදිත, පොහොර, මූල ලෝහ, රසායනික නිෂ්පාදිත සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ සඳහා වූ වියදම් අඩු වීම මෙම පහළ යෑම සඳහා හේතු විය. කෙසේ වුවද, මෙම වසර තුළ චීනය වෙතින් රෙදිපිළි හා රෙදිපිළි උපාංග, විදුලි සන්දේශ උපකරණ සහ රථවාහන හා යන්ත්‍රසූත්‍ර කොටස් ආනයනය සඳහා දැරූ වියදම ඉහළ ගියේය. මුළු ආනයන වියදමෙන් සියයට 8.1 කට දායක වෙමින් 2017 වසරේදී එක්සත් අරාබි එමීර් රාජ්‍යය තෙවැනි විශාලතම ආනයන මූලාශ්‍රය වූ අතර, බනිජ තෙල් නිෂ්පාදිත සහ දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ එරටින් ගෙන්වූ ප්‍රධාන ආනයන විය. සිංගප්පූරුව සිව්වැනි විශාලතම මූලාශ්‍රය බවට පත් වූ අතර බනිජ තෙල් නිෂ්පාදිත, දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ මෙන්ම විදුලි සන්දේශ මෙවලම් සිංගප්පූරුවෙන් ආනයනය කෙරිණ. ප්‍රවාහන උපකරණ, මූල ලෝහ, රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය සඳහා වූ වියදම් ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේදී ජපානයෙන් ආනයනය කළ භාණ්ඩ සඳහා වූ වියදම සියයට 9.3 කින් ඉහළ ගිය අතර, ජපානය පස්වැනි විශාලතම ආනයන මූලාශ්‍රය බවට පත් විය. කෙසේ වුවද, 2016 වසරේදී හඳුන්වා දුන් සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග හේතුවෙන් 2017 වසරේදී ජපානයෙන් ආනයනය කරනු ලැබූ ප්‍රධාන ආනයන කාණ්ඩය වන රථවාහන ආනයන කැපී පෙනෙන ලෙස පහළ ගියේය.

## 5.4 ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

### 5.4.1 සේවා වෙළඳාම

**2017 වසර තුළ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින් සේවා වෙළඳාම අඛණ්ඩව විදේශීය ජංගම ගිණුම සඳහා දායක විය.** වසර තුළ දී සංචාරක ඉපැයීම්වල මධ්‍යස්ථ වර්ධනය සහ ප්‍රවාහන සහ පරිගණක සේවාවන්හි හිතකර වර්ධනය, සේවා අපනයන ඉපැයීම් 2016 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 7,138 සමඟ සැසඳීමේදී 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 7,760 ක් දක්වා සියයට 8.7 කින් වර්ධනය වීම සඳහා දායක විය. සේවා ආනයන සඳහා වැඩි වන ඉල්ලුම හේතුවෙන් වසර තුළ දී සේවා ගිණුමෙහි ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 4,421 ක් දක්වා සියයට 3.8 කින් ඉහළ ගියේය. ඒ අනුව, ගෙවුම් තුලනයෙහි සේවා ගිණුම 2016 වසරේ වූ එ.ජ. ඩොලර් මිලියන 2,879 ක අතිරික්තයට සාපේක්ෂව 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 3,338 ක අතිරික්තයක් වාර්තා කළේය.

#### ප්‍රවාහන සේවා

**ප්‍රවාහන සේවා අංශයෙහි අඛණ්ඩ වර්ධනය, 2017 වසරේදී සේවා ගිණුමෙහි වර්ධනය සඳහා දායක විය.** මගී ගාස්තු, නැව් කුලී සහ වරාය හා ගුවන් තොටුපොළ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් වූ ලැබීම් ඉහළ යෑම, ප්‍රවාහන සේවා අංශය වෙත වූ දළ ලැබීම් පෙර වසර හා සැසඳීමේදී සියයට 5.6 ක වර්ධනයක් සහිතව එ.ජ. ඩොලර් මිලියන 2,376 ක මට්ටමට ළඟා වීමට උපකාරී විය. නැව් සහ ගුවන් ගමන් සේවා මත වූ ගෙවීම් ඉහළ යෑම

5

### 5.7 සංඛ්‍යා සටහන
### ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2016 (අ) | | | 2017 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **භාණ්ඩ හා සේවා** | **17,448** | **23,442** | **-5,994** | **19,120** | **25,401** | **-6,281** |
| **භාණ්ඩ** | **10,310** | **19,183** | **-8,873** | **11,360** | **20,980** | **-9,619** |
| වෙළඳ භාණ්ඩ | 10,310 | 18,809 | -8,499 | 11,360 | 20,330 | -8,970 |
| මූල්‍ය නොවන රත්‍රන් | - | 374 | -374 | - | 650 | -650 |
| **සේවා** | **7,138** | **4,259** | **2,879** | **7,760** | **4,421** | **3,338** |
| ප්‍රවාහන | 2,250 | 1,618 | 632 | 2,376 | 1,688 | 688 |
| මුහුදු ප්‍රවාහන | 1,059 | 779 | 281 | 1,096 | 790 | 306 |
| නැව් කුලී | 1,059 | 779 | 281 | 1,096 | 790 | 306 |
| ගුවන් ප්‍රවාහන | 1,191 | 840 | 351 | 1,280 | 898 | 382 |
| මගී ගාස්තු | 1,073 | 753 | 320 | 1,158 | 810 | 348 |
| ගුවන් කුලී | 118 | 87 | 31 | 122 | 88 | 34 |
| සංචාරක (ඇ) | 3,518 | 1,542 | 1,977 | 3,925 | 1,599 | 2,326 |
| ඉදිකිරීම් | 63 | 29 | 34 | 69 | 32 | 37 |
| රක්ෂණ සහ විශ්‍රාම වැටුප් | 121 | 89 | 32 | 123 | 94 | 29 |
| මූල්‍ය සේවා | 252 | 403 | -151 | 263 | 415 | -152 |
| විදුලි සන්දේශ සහ පරිගණක සේවා | 858 | 443 | 416 | 926 | 455 | 471 |
| විදුලි සන්දේශ | 134 | 105 | 29 | 140 | 110 | 30 |
| පරිගණක සේවා | 724 | 337 | 387 | 786 | 345 | 440 |
| වෙනත් ව්‍යාපාරික සේවා | 42 | 67 | -25 | 44 | 69 | -25 |
| රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන) | 33 | 68 | -35 | 34 | 69 | -35 |
| **ප්‍රාථමික ආදායම්** | **127** | **2,329** | **-2,202** | **160** | **2,515** | **-2,355** |
| සේවක වැටුප් | 20 | 88 | -67 | 26 | 96 | -70 |
| ආයෝජන ආදායම් | 107 | 2,241 | -2,134 | 134 | 2,418 | -2,285 |
| සෘජු ආයෝජන | 15 | 949 | -935 | 14 | 934 | -920 |
| ලාභාංශ | 15 | 500 | -485 | 14 | 431 | -417 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | - | 450 | -450 | - | 503 | -503 |
| විවිධ ආයෝජන | - | 829 | -829 | - | 952 | -952 |
| හිමිකම් | - | 73 | -73 | - | 80 | -80 |
| පොලී ආදායම් | - | 756 | -756 | - | 873 | -873 |
| කෙටි කාලීන | - | 1 | -1 | - | 6 | -6 |
| දිගු කාලීන | - | 755 | -755 | - | 866 | -866 |
| අනෙකුත් ආයෝජන | 45 | 462 | -418 | 55 | 532 | -477 |
| සංචිත වත්කම් | 47 | - | 47 | 64 | - | 64 |
| **ද්විතීයික ආදායම්** | **7,260** | **807** | **6,453** | **7,175** | **848** | **6,327** |
| රජය | 19 | - | 19 | 11 | - | 11 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 7,242 | 807 | 6,434 | 7,164 | 848 | 6,316 |
| **ජංගම ගිණුම** | **24,835** | **26,578** | **-1,742** | **26,455** | **28,764** | **-2,309** |
| **ප්‍රාග්ධන ගිණුම** | **56** | **31** | **25** | **40** | **29** | **11** |
| ප්‍රාග්ධන සංක්‍රාම | 56 | 31 | 25 | 40 | 29 | 11 |
| රජය | 35 | - | 35 | 20 | - | 20 |
| සංස්ථා සහ කුටුම්බ | 21 | 31 | -10 | 20 | 29 | -9 |
| **ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම** | **24,892** | **26,609** | **-1,717** | **26,495** | **28,793** | **-2,298** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අනේවාසිකයන්ට සැපයූ මගී සේවාවන්, ප්‍රවාහන සේවාවන්හි ඇතුළත්ය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5

හේතුවෙන් වරාය හා ගුවන්තොටුපොළ ආශ්‍රිත සේවා ගෙවීම් ඉහළ යෑම පිළිබිඹු කරමින් ප්‍රවාහන සේවා මත වූ ගෙවීම්ද වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 1,688 ක් දක්වා සියයට 4.3 කින් වර්ධනය විය. ඒ අනුව, ප්‍රවාහන අංශය මත වූ ශුද්ධ ලැබීම් 2016 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 632 සමඟ සැසඳීමේදී 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 688 ක් දක්වා වර්ධනය විය.

**2017 වසරේදී, මගී ගාස්තු ආශ්‍රිත ලැබීම් සේවා ගිණුමෙහි වර්ධනය සඳහා හිතකර ලෙස දායක විය.** ඒ අනුව, වසර තුළ දී මගී ගාස්තු ආශ්‍රිත ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 1,158 ක් දක්වා සියයට 8.0 කින් වර්ධනය විය. 2017 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ දී ධාවන පථය අලුත්වැඩියා කිරීමේ කටයුතු හේතුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි මෙහෙයුම් කටයුතු අර්ධ වශයෙන් සිදු කිරීම මත මෙරටට පැමිණි සංචාරකයින් ප්‍රමාණය පහළ ගිය අතර, එය මගී ගාස්තු ආශ්‍රිත ලැබීම් වසරේ පළමු කාර්තුව තුළ දී මධ්‍යස්ථ මට්ටමක පැවතීමට හේතු විය. කෙසේ වුවද, වසරේ අවසාන භාගය වනවිට මගී ගාස්තු ආශ්‍රිත ලැබීම් ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීමක් දැකිය හැකි විය. වසර තුළ දී ගුවන් ගමන් ගාස්තු ඉහළ නැංවීම සහ ශ්‍රී ලංකාව වෙත පැමිණෙන මගීන් සංඛ්‍යාව ඉහළ යෑම මගී ගාස්තු ආශ්‍රිත ලැබීම්හි සතුටුදායක වර්ධනය සඳහා හේතු විය. ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් ශ්‍රී ලංකාවේ ගුවන් සේවා ඉතිහාසයේ ඉහළම ගමනාන්තයන් සංඛ්‍යාවක් කරා ළඟා වෙමින් ඔවුන් විසින් සේවා සපයනු ලබන ගුවන් ගමනාන්ත සංඛ්‍යාව පුළුල් කිරීම මගින් මගී ගාස්තු මත වූ ලැබීම් ඉහළ යෑම ද මේ සඳහා හේතු විය. මෙම නව ගුවන් ගමනාන්ත අතරට ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර සහ ඉන්දියාවේ නගර කිහිපයක් ඇතුළත්ය. තවද, ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් එහි මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ අදහසින් නව ඉන්ධන කාර්යක්ෂම ගුවන් යානා පහක් 2017 වසරේදී අත්පත් කර ගන්නා ලදී. කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා උපයෝගී කර ගන්නා ලද මෙම ක්‍රියාමාර්ග සමඟ කලාපය තුළ සිය මෙහෙයුම් කටයුතු පුළුල් කිරීම සහ ගුවන් ගමන් වාර සංඛ්‍යාව ඉහළ නැංවීම තුළින් මැදිකාලීනව ගුවන් ප්‍රවාහන උප අංශයෙහි ආදායම් උත්පාදන හැකියාව වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**කොළඹ වරායෙහි භාණ්ඩ, බහලු සහ ප්‍රතිනැව්ගත කිරීම් හැසිරවීම් පරිමාව ඉහළ යෑම හේතුවෙන් කුලී ගාස්තු ලැබීම් 2017 වසරේදී වර්ධනය විය.** ඒ අනුව, වරාය හා ගුවන් තොටුපොළ ආශ්‍රිත කටයුතු සඳහා වූ කුලී ගාස්තු මගින් දළ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 1,217 ක් දක්වා සියයට 3.4 කින් වර්ධනය විය. වසර

තුළ දී, කොළඹ වරාය සිය ඉතිහාසය තුළ ප්‍රථම වරට බහලු ඒකක මිලියන 6 කට වැඩි ප්‍රමාණයක් හසුරුවමින් නාවික සේවා අංශයෙහි වර්ධනය සඳහා දායකවිය. කොළඹ වරායෙහි බහලු සහ භාණ්ඩ හැසිරවීමේ ධාරිතාවය පුළුල් කිරීම නාවික ක්ෂේත්‍රයෙහි වර්ධන ප්‍රවණතාවය කෙරෙහි අඛණ්ඩව දායක විය. මේ අතර, වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCTAD) විසින් ප්‍රකාශිත "Liner Shipping Connectivity Index - 2017" හි 15 වැනි ස්ථානයට පත් වීමත් සමඟ, 2017 වසරේදී ඉන්දියාව අභිබවා යමින් දකුණු ආසියානු කලාපයේ සමුද්‍ර ප්‍රවාහනය අනුව හොඳම සබඳතාවයක් පවත්වාගෙන යන රට බවට ශ්‍රී ලංකාව පත් විය.

### විදේශ ගමන් සහ සංචාරක සේවා


**2017 වසරේදී සංචාරක පැමිණීම්වල මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා වුවද සංචාරක කර්මාන්තය, රට තුළට විදේශ විනිමය ලබා දෙන තෙවන විශාලම අංශය ලෙස පැවතුණි.** 2017 වසරේදී 2,116,407 ක් වූ මෙතෙක් වාර්තා කළ ඉහළම සංචාරක පැමිණීම් සංඛ්‍යාවක් සනිටුහන් කළද සංචාරක පැමිණීම්හි වර්ධනය පෙර වසරට සාපේක්ෂව සියයට 3.2 ක මධ්‍යස්ථ අගයක පැවතුණි. ගුවන් පථය අලුත්වැඩියාව සහ නවීකරණ කටයුතු නිසා ගුවන් තොටුපළ මෙහෙයුම් කටයුතු සම්පූර්ණ ලෙස සිදු නොවීම හේතුවෙන් 2017 වසරේ අප්‍රේල් මාසය තෙක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ තුළ ගුවන් ගමන් වාර අවලංගු වීම් සහ ප්‍රමාද වීම් සිදුවීම මෙන්ම 2017 වසරේ මැද භාගයේදී ඩෙංගු රෝග ව්‍යාප්තිය ඉහළ යෑම සංචාරක කර්මාන්තයේ මන්දගාමී ක්‍රියාකාරිත්වය සඳහා යම් අයුරකින් හේතු විය. කෙසේ වුවද, සංචාරක පැමිණීම් යළි යම්තාක් දුරකට යථා තත්ත්වයට පත්වීම පෙන්නුම් කරමින් 2017 දෙසැම්බර් මාසයේදී මෙතෙක් වාර්තා වූ ඉහළම මාසික සංචාරක පැමිණීම් සංඛ්‍යාව වාර්තා විය.

**2017 වසරේදී, මැද පෙරදිග හැර අනෙකුත් ප්‍රධාන කලාප සියල්ලකින්ම වූ සංචාරක පැමිණීම් වර්ධනය විය.** බටහිර යුරෝපය මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 32.2 ක් නියෝජනය කරමින් සංචාරක කලාප අතුරින් තවදුරටත් ශ්‍රී ලංකාවේ විශාලතම සංචාරක ප්‍රභවය ලෙස පැවති අතර, මෙම කලාපයෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 680,901 ක් දක්වා සියයට 5.8 කින් වර්ධනය විය. ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම සංචාරක ප්‍රභවය වන දකුණු ආසියාව වෙතින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සියයට 0.9 කින් සුළු වශයෙන් වර්ධනය වුවද, එම කලාපය වෙතින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මුළු සංචාරකයින්ගේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 2016 වසරේදී වාර්තා වූ සියයට 25.0 ට සාපේක්ෂව 2017 වසරේදී සියයට 24.5 ක් දක්වා අඩු විය. නැගෙනහිර ආසියාවෙන් පැමිණි සංචාරකයින්ගේ ප්‍රතිශතය 2010 වසරේ සිට අඛණ්ඩව වර්ධනය වෙමින් 2017 වසරේදී මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 21.0 ක් වූ අතර ඉන්දුනීසියාව සහ පිලිපීනය යන රටවල්වලින් පැමිණි සංචාරකයින් හේතුවෙන් සියයට 4.5 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. 2017 වසරේදී ඉන්දියාවෙන් වූ සංචාරක පැමිණීම් 384,628 ක් සමඟ සංචාරක පැමිණීම්වල වර්ධනයට ඉහළම දායකත්වයක් ලබා දෙමින් ප්‍රමුඛතම සංචාරක මූලාශ්‍රය ලෙස සිය ආධිපත්‍යය තවදුරටත් පවත්වා ගත් අතර චීනයෙන් වූ සංචාරක පැමිණීම්වල සුළු අඩු වීමක් වාර්තා වුවද, චීනය දෙවනුවද, අනතුරුව පිළිවෙළින් එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශයද විශාලතම සංචාරක

5

**5.9 රූප සටහන**


**රටවල් අනුව සංචාරක පැමිණීම් - 2017**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**5.10 රූප සටහන**

**සංචාරක පැමිණීම් සහ ඉපැයීම්**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ප්‍රභව ලෙස පැවතුණි. 2017 වසරේදී මෙම රටවල් පහෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව ශ්‍රී ලංකාවට පැමිණි මුළු සංචාරකයින්ගෙන් සියයට 51.2 ක් විය. මේ අතර, 2017 වසරේදී ශ්‍රී ලංකාවේ සත්වැනි විශාලතම සංචාරක ප්‍රභවය වන මාලදිවයින වෙතින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව පහළ ගියේය. සංචාරකයින් පැමිණීමේ අරමුණ සැලකීමේදී බහුතරයක් (සියයට 83.9 ක්) විවේකය ගත කිරීම සඳහා මෙරටට පැමිණ ඇත. මේ අතර, 2017 වසරේදී ව්‍යාපාර කටයුතු සඳහා පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සියයට 2.9 ක් වූ අතර, ඥාති මිත්‍රාදීන් මුණ ගැසීම, ආගමික හා සංස්කෘතික කටයුතු, සෞඛ්‍ය, අධ්‍යාපනය හා ක්‍රීඩා කටයුතු වැනි අනෙකුත් අරමුණු සඳහා පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 13.2 ක් විය.

**සංචාරක පැමිණීම් සංඛ්‍යාව අපේක්ෂිත ප්‍රමාණයට වඩා පහළ ගිය ද, සංචාරකයෙකු මෙරට ගත කරන කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේදී සංචාරක ඉපැයීම් හිතකර මට්ටමක පැවතුණි.** සංචාරක ඉපැයීම් 2016 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,518 ට සාපේක්ෂව 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 3,925 ක් දක්වා සියයට 11.6 කින් වර්ධනය විය. සංචාරකයින්ගේ වියදම් සහ සංචාරකයෙකු මෙරට ගත කරන කාලය පිළිබඳව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද නවතම වාර්ෂික සමීක්ෂණයට අනුව, සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම 2016 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් 168.2 සිට 2017 වසරේදී එ.ජ. ඩොලර් 170.1 ක් දක්වා ඉහළ ගොස් ඇත. තවද, සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය 2016 වසර සඳහා ඇස්තමේන්තු කළ දින 10.2 ට සාපේක්ෂව 2017 වසරේදී දින 10.9 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ඉලක්කගත ප්‍රවර්ධන වැඩසටහන් සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම සඳහා අඛණ්ඩව ආයෝජන සිදු කිරීමත් සමඟ සංචාරක ඉපැයීම් මැදිකාලීනව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, 2017 වසරේදී සංචාරක සේවා සඳහා වූ ගෙවීම්ද එ.ජ. ඩොලර් මිලියන 1,599 ක් දක්වා සියයට 3.7 කින් ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙම වර්ධනයන් සමඟ විදේශ ගමන් හා සංචාරක සේවා උප අංශය සඳහා 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 2,326 ක අතිරික්තයක් වාර්තා කළේය.

**2017 වසරේදී සංචාරක අංශය සඳහා වූ ආයෝජන තවදුරටත් පුළුල් විය.** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2010 වසරේදී සංචාරක කර්මාන්තය තුළ ආයෝජනය කිරීමට අපේක්ෂා කරන, ඒ සඳහා හැකියාවක් ඇති ආයෝජකයින්ට සහාය වීම සඳහා මධ්‍යගත ප්‍රවර්ධන සහ පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයක්, එනම් විවිධ කාර්යයන් එක් ස්ථානයකදී ඉටු කර ගැනීම සඳහා වූ ඒකකය (One Stop Unit) පිහිටුවීමෙන් පසු මේ දක්වා කාලය තුළ එම ආයතනයට ව්‍යාපෘති යෝජනා 639 ක් ලැබී ඇත. මෙම ව්‍යාපෘති යෝජනා අතරින්, 2017 වසර අවසානය වන විට කාමර පහසුකම් 29,946 ක් සහිතව ආයෝජන වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 5,191 ක් වූ හෝටල් ව්‍යාපෘති 539 ක් අනුමත කර ඇත. 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 314 ක ආයෝජන වටිනාකමක් සහිත නව හෝටල් ව්‍යාපෘති 95 ක් සඳහා යෝජනා ඉදිරිපත් වී ඇත. 2016 වසරේදී අනුමත වූ එ.ජ. ඩොලර් මිලියන 126 ක වටිනාකමකින් යුත් හෝටල් ව්‍යාපෘති 41 සමඟ සැසඳීමේදී 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 380 ක වටිනාකමකින් යුත්, කාමර 2,393 කින් සමන්විත හෝටල් ව්‍යාපෘති 45 ක් සඳහා අවසන් අනුමැතිය ලබා දී ඇත. වසර තුළ දී ෂැන්ග්‍රිලා - කොළඹ සහ මූවන් පික් ඇතුළු ජාත්‍යන්තර හෝටල් කිහිපයක් සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කළ අතර, හයට්, ෂෙරටන්, අයිටීසී සහ නෙක්ස්ට් වැනි ප්‍රධාන හෝටල් ව්‍යාපෘති කිහිපයක් සිය ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු කළේය. තවද, 2017 වසරේදී අති සුඛෝපභෝගී බංගලා, නිවාඩු නිකේතන, සංචාරක සත්කාර නිවාස, පෞරාණික නිවාස, බංගලා සහ කුලී පදනම මත ලබා දෙන මහල් නිවාස ආදී වූ සංචාරක ක්ෂේත්‍රයේ අතිරේක ආයතන සංඛ්‍යාව 1,693 ක් දක්වා 135 කින් ඉහළ ගිය අතර, කාමර ධාරිතාව 12,509 ක් දක්වා කාමර 974 කින් වර්ධනය විය.

**2017 වසරේදී පළාත් මට්ටමේ සංචාරක සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ ආයෝජනද තවදුරටත් පුළුල් විය.** ශ්‍රී ලංකාවේ මෙතෙක් අරඹා ඇති විශාලතම සංචාරක ව්‍යාපෘතිය ලෙස සැලකෙන දෙද්දුව වැනි ඒකාබද්ධ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිවල ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කොට ඇත. මීට අමතරව, ඉරණවිල, අකුරල, කල්පිටිය - කලාප 02 සහ කුච්චවේලි යන ප්‍රදේශවල ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘති සඳහා සුදුසු ස්ථාන හඳුනාගෙන ඇත. තවද, ඇල්ල, ආරුගම්බොක්ක, කල්පිටිය, නුවරඑළිය, බේරුවල, හික්කඩුව සහ පින්නවල යන ප්‍රදේශවල සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ඇති සුවිශේෂත්වය සැලකිල්ලට ගනිමින් සංචාරක සංවර්ධන අධිකාරිය විසින් එම ප්‍රදේශ සඳහා වෙනම සංචාරක සංවර්ධන ගුරු සැලසුම් සකස් කරමින් පවතී.

**ශ්‍රී ලංකාව තුළ සංචාරක කර්මාන්තය සඳහා පවතින ශක්‍යතාවයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා 2017 වසරේදී ප්‍රතිපත්තිමය මූලපිරීම් සහ ක්‍රියාවන් කිහිපයක් ක්‍රියාවට නංවන ලදී.** 2025 සංචාරක දැක්ම සඳහා පහසුකම් සැලසීම සහ සංචාරක කර්මාන්තය පිළිබඳ

**5.8 සංඛ්‍යා සටහන**

**සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2013 | 2014 | 2015 | 2016 | 2017 (අ) | වාර්ෂික වෙනස්වීම (%) 2017 |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් (සංඛ්‍යාව) | 1,274,593 | 1,527,153 | 1,798,380 | 2,050,832 | 2,116,407 | 3.2 |
| පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින් ගණන | | | | | | |
| විනෝදාස්වාදය | 915,208 | 1,037,644 | 1,198,240 | 1,710,027 | 1,776,503 | 3.9 |
| ව්‍යාපාර | 67,946 | 20,270 | 23,323 | 37,121 | 60,940 | 64.2 |
| වෙනත් | 291,439 | 469,239 | 576,817 | 303,684 | 278,964 | -8.1 |
| සංචාරකයින් ගත කළ රාත්‍රී ගණන (දහස්) | 10,909 | 15,119 | 18,163 | 20,918 | 23,068 | 10.3 |
| කාමර උපයෝජන අනුපාතය (%) | 71.7 | 74.3 | 74.5 | 74.8 | 73.3 | -2.0 |
| දළ සංචාරක ලැබීම් (රු. මිලියන) | 221,720 | 317,479 | 405,492 | 512,373 | 598,143 | 16.7 |
| ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.) | 173,954 | 207,889 | 225,476 | 249,837 | 282,622 | 13.1 |
| මුළු සේවා නියුක්තිය (සංඛ්‍යාව) (ආ) | 270,150 | 299,890 | 319,436 | 335,659 | 359,215 | 7.0 |
| සෘජු සේවා නියුක්තිය | 112,550 | 129,790 | 135,930 | 146,115 | 156,369 | 7.0 |
| වක්‍ර සේවා නියුක්තිය | 157,600 | 170,100 | 183,506 | 189,544 | 202,846 | 7.0 |

(අ) තාවකාලික
(ආ) ඇස්තමේන්තු

මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා 2017-2020 නව සංචාරක උපායමාර්ගික සැලැස්ම හඳුන්වා දෙන ලදී. ඒ අනුව, 2020 වසර වන විට වාර්ෂික සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7 ක් දක්වා ඉහළ නැංවීම, ආශ්‍රිත කර්මාන්තවල රැකියා අවස්ථා 600,000 ලබා දීම සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම එ.ජ. ඩොලර් 210 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. තවද, සුවසේවා සංචරණය, 2018 වසරේදී ක්‍රියාවට නැංවීමට බලාපොරොත්තු වන ජාතික අපනයන උපායමාර්ගික සැලැස්මෙහි ඉලක්කගත අංශ හය තුළ හඳුනා ගෙන ඇත. මෙම ප්‍රතිපත්ති මුලපිරීම්වල ඇතැම් නිර්දේශ දැනටමත් සලකා බලා ඇති අතර අවශ්‍ය අරමුදල් 2018 අයවැය මගින් වෙන්කොට ඇත. 2017 වසරේදීද සංචාරක කර්මාන්තයේ අවිධිමත් අංශයේ ආයතන, විධිමත් අංශය තුළට අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර ආයතන පරික්ෂා කිරීමේ, ලියාපදිංචි කිරීමේ සහ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ජංගම සේවා ක්‍රියාත්මක කිරීමද සංචාරකයින්ට ආහාර ගැනීමට සුදුසු ස්ථාන ලියාපදිංචි කිරීමද අඛණ්ඩව සිදු විය. මේ අතර, 2017 වසරේදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සංචාරක සල්පිල්, ප්‍රචාරණ හා ප්‍රවර්ධන වැඩසටහන් ඇතුළත්ව එම හඳුනා ගත් වෙළඳපොළ 32 ක රටරටවලට ආවේණික වූ ප්‍රවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. 2017 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, සිංගප්පූරු සහයෝගිතා ආයතනය සහ තමසෙක් ජාත්‍යන්තර පදනම සමග හවුල්කාරිත්වයක් ගොඩනගා ගත් අතර ඩිජිටල් ක්‍රම උපයෝගී කර ගනිමින් සිංගප්පූරුවේ සංචාරක ව්‍යාපාරය තුළ අලෙවිකරණය සහ ප්‍රවර්ධනය සිදු කරන ආකාරය පිළිබඳ අත්දැකීම් හුවමාරු කර ගැනීම ඉන් අපේක්ෂා කෙරේ. මේ අතර, කොළඹ වරායේදී 37,000 ක පමණ මගීන්ගෙන් යුත් මගී නෞකා 12 ක් පිළිගෙන සත්කාරක කටයුතු සිදු කරන ලදී. සංචාරක ප්‍රවර්ධන වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව බ්ලූම්බර්ග් (Bloomberg), නැෂනල් ජියෝග්‍රැෆික් (National Geographic) සහ වෝග් (Vogue) වැනි ලොව ප්‍රකට සඟරා සහ සංවිධානවලින් සංචාරක ව්‍යාපාරය සම්බන්ධව පිළිගත් නිර්දේශයන්ට සහ සම්මානයට පාත්‍ර වුණි. විශේෂයෙන්ම, 2017 වසරේදී ආසියානු ලෝක සංචාරක සම්මාන උළෙලේදී ශ්‍රී ලංකාව “ආසියාවේ ප්‍රමුඛතම සංචාරක ගමනාන්තය” ලෙස තෝරා ගැනුණි. තවද, 2018 වසරේදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින්, එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය සහ ඕස්ට්‍රේලියාව ඇතුළු තෝරාගත් රටවල ශ්‍රී ලංකාවේ අඛණ්ඩ නියෝජනය පවත්වාගෙන යෑම සඳහා ගමනාන්ත නියෝජනය කිරීමේ සමාගම් ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ.

**සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ විදේශ විනිමය උපයන ප්‍රමුඛ අංශයක් වුව ද, ශ්‍රී ලංකාව තවමත් ගෝලීය වෙළඳපොළ තුළ පූර්ණ විභවතාව ළඟා කර ගෙන නොමැත.** 2016 සහ 2017 වසරවලදී ශ්‍රී ලංකාව මිලියන දෙකකට අධික සංචාරකයින් සංඛ්‍යාවක් ආකර්ෂණය කරගත් නමුත්, සිංගප්පූරුව, තායිවානය සහ හොංකොං වැනි ශ්‍රී ලංකාවට සාපේක්ෂව ප්‍රමාණයෙන් කුඩා අග්නිදිග ආසියානු කලාපයේ රටවල් වසරකට මිලියන 10 කට වඩා වැඩි සංචාරකයින් සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගනී. මේ අනුව, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තුළ පූර්ණ විභවතාව

5

ළඟා කර ගැනීම සඳහා 2017-2020 නව සංචාරක උපායමාර්ගික සැලැස්ම යටතේ හඳුන්වා දෙන ලද ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම කඩිනම් කිරීම අත්‍යාවශ්‍ය වේ. සංචාරක උපායමාර්ගික සැලැස්ම යටතේ හඳුන්වා දෙන ලද තිරසාර සංචාරක ඉලක්ක කරා 2020 වන විට ළඟා වීම සඳහා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයක් හරහා රජය හා සංචාරක ව්‍යාපාරයේ පාර්ශ්වකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැඟීම අවශ්‍ය වේ. මීට අමතරව, සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය උපයන්නෙකු බවට පත් කිරීමට මගී නෞකා සංචාර, තල්මසුන් සහ ඩොල්ෆින් මසුන් නැරඹීම, කිමිදීම හා කොරල් නැරඹීම, සරුංගලයක් ආධාරයෙන් මුහුද මත ලිස්සා යෑම (Kite Surfing) වැනි ජලය ආශ්‍රිත සංචාරක ක්‍රියාකාරකම් මෙන්ම වන්දනා ගමන්, කෑම පිසීම, කුරුල්ලන් නැරඹීම, විවාහ උත්සව, චිත්‍රපට නැරඹීම සහ රැස්වීම්, දිරිගැන්වීම් සමුළු, ප්‍රදර්ශන (MICE) යන අංශවලද සංචාරක ශක්‍යතාව සොයා බැලීම අවශ්‍ය වේ.

### විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා

**සේවා අපනයනයෙහි ප්‍රධාන වර්ධන සාධකයක් වශයෙන්, විදුලි සන්දේශ, පරිගණක හා තොරතුරු සේවා ඉපැයීම් 2017 වසරේදී ස්ථිර වර්ධන ප්‍රවණතාවක් පෙන්වීය.** විදුලි සන්දේශ, පරිගණක හා තොරතුරු සේවා අපනයන ඉපැයීම් 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 926 ක් වූ අතර, එය 2016 වසරට සාපේක්ෂව සියයට 7.8 ක වර්ධනයකි. විදුලි සන්දේශ උප අංශයෙහි මුළු ඉපැයීම් ප්‍රමාණය 2016 වසරේ එ.ජ. ඩොලර් මිලියන 134 සිට 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 140 ක් දක්වා මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම අධිවේගී දත්ත සේවා සපයන අන්තර්ජාලය මත පදනම් වූ සන්නිවේදන පහසුකම් භාවිතය වර්ධනය වීම හේතු වී ඇත. මේ අතර, ජාත්‍යන්තර සෘජු දුරකථන ඇමතුම් සේවාවන්හි භාවිතය සැලකිය යුතු ලෙස අඩු වීම මෙම අංශයෙහි ඉපැයීම් වර්ධනය යම්තාක් දුරකට සීමා වීමට හේතු විය. 2017 වසරේදී ශ්‍රී ලංකාවේ විදුලි සන්දේශ අංශය විසින් පස්වන පරම්පරාවේ තාක්ෂණය (5G) භාවිත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. එම පස්වන පරම්පරාවේ තාක්ෂණය, ස්වයංක්‍රිය ප්‍රවාහන සේවා, රොබෝ තාක්ෂණය යොදා ගනිමින් කර්මාන්ත ස්වයංක්‍රීයකරණය, ඩිජිටල් ව්‍යාපාර විසඳුම් වැනි අන්තර්ජාලය උපයෝගී කර ගනිමින්, පරිගණක උපාංග, එදිනෙදා භාවිත කරන මෙවලම් සඳහා යොදා ගැනෙන අති නවීන තාක්ෂණික යෙදවුම් භාවිතය පහසු කෙරෙනු ඇත. තවද, කලාපයේ ඩිජිටල් මධ්‍යස්ථානය බවට පත් වීමේ පියවරක් වශයෙන් දකුණු ආසියාවේ ප්‍රථම නවීන සබ්මැරීන රැහැන් මධ්‍යස්ථානය ගාල්ල වරායේ ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත. මෙම වර්ධනයන්, වැඩිදියුණු කරන ලද ගෝලීය සම්බන්ධතා හරහා මැදිකාලීනව විදුලි සන්දේශ කර්මාන්තයේ ආදායම් උත්පාදන හැකියාව වැඩිදියුණු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**පරිගණක සහ තොරතුරු සේවා උප අංශයෙහිද 2017 වසරේදී වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි.** ඒ අනුව, වසර තුළ දී පරිගණක සහ තොරතුරු සේවාවල දළ ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 786 ක් දක්වා සියයට 8.5 කින් වර්ධනය විය. ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO) සහ දැනුම පදනම් කර ගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (KPO) ඇතුළත් මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවාවල (ITES) සීඝ්‍ර වර්ධනය මෙම අංශයෙහි හිතකර වර්ධනය සඳහා තවදුරටත් ආයක විය. මූල්‍යමය වශයෙන් ඇති ආකර්ෂණීයභාවය, පුද්ගල කුසලතා සහ ශ්‍රම සැපයුම සහ ව්‍යාපාර පරිසරය යන ප්‍රධාන කාණ්ඩ තුනක් ආශ්‍රයෙන් රටවල් 55 ක් යොදා ගනිමින් ව්‍යාපාර ක්‍රියාවලි විදේශ මූලාශ්‍ර වෙත පැවරීම සම්බන්ධව A.T. Kearney ආයතනය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ "ගෝලීය සේවා ස්ථාන දර්ශකය" අනුව 2016 වසරේ ශ්‍රේණිගත කිරීමට සාපේක්ෂව ස්ථාන තුනක් ඉදිරියට පැමිණෙමින් 2017 වසරේදී ශ්‍රී ලංකාව එහි එකොළොස්වන ස්ථානයට පත් විය. කලාපයේ අනෙකුත් රටවල් අභිබවා ශ්‍රී ලංකාව ව්‍යාපාර ක්‍රියාවලි විදේශ මූලාශ්‍ර වෙත පැවරීම සඳහා වඩා ආකර්ෂණීය රටක් බවට පත් කිරීම සඳහා අඩු ශ්‍රම පිරිවැය සහ දිගුකාලීන බදු විරාමයන් හේතු වී ඇති බව මෙම අධ්‍යයනය තුළින් අවධාරණය කර ඇත. තවද, මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවා කර්මාන්තයේ පූර්ණ හැකියාවන්වලින් ප්‍රතිඵල ලබා ගැනීමේ අදහස ඇතිව තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ නව ව්‍යාපාර සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා මූල්‍ය පහසුකම් සැපයීම සඳහා "IT Initiative" නමින් අරමුදලක් පිහිටුවීම සඳහා රජය විසින් 2018 වසර සඳහා වූ අයවැය මගින් යෝජනා කර ඇත.

### 5.4.2 ප්‍රාථමික ආදායම

**සෘජු ආයෝජන ව්‍යාපාර විසින් ප්‍රතිආයෝජනය කරන ලද ඉපැයීම් ඉහළ යෑම හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජය ලබා ගත් ව්‍යාපෘති ණය සඳහා පොලී ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් මෑත වසරවලදී නිරීක්ෂණය කළ අයුරින්ම ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් විය.** මේ අනුව, 2016 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 2,202 ක් වූ ප්‍රාථමික

5

ආදායම් ගිණුමේ හිඟය 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 2,355 ක් දක්වා පුළුල් විය. ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම් ඉහළ ගිය ද සෘජු ආයෝජන ව්‍යාපාර විසින් ප්‍රතිආයෝජනය කරන ලද ඉපැයීම් ඉහළ යෑම හිතකර ප්‍රවණතාවක් ලෙස සැලකිය හැකි වන්නේ එම ප්‍රමාණයම මූල්‍ය ගිණුමේ සෘජු ආයෝජන ඉහළ යෑමක් වශයෙන් සටහන් වන බැවිනි. 2017 වසරේදී සෘජු ආයෝජන ව්‍යාපාර ඉපැයූ ලාභ පෙර වසරේ පැවති මට්ටමේ පැවතුණද, සෘජු ආයෝජන ව්‍යාපාර වසර තුළ දී අඩු ලාභාංශ ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කරමින් ඉපැයීම්වලින් වැඩි ප්‍රමාණයක් ප්‍රතිආයෝජනය කිරීමට පෙළඹුණි. 2016 වසරේ කූපන ගෙවීම්වලට අමතරව, 2016 වසරේ ජූලි මාසයේදී සහ 2017 වසරේ මැයි මාසයේදී රජය විසින් නිකුත් කළ නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා ද කූපන ගෙවීම හේතුවෙන් 2017 වසරේදී කූපන ගෙවීම් ඉහළ යෑමෙන් විවිධ ආයෝජන වෙනුවෙන් වූ පොලී ගෙවීම් වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, ලංකා බැංකුව විසින් ලබා ගනු ලැබූ එ.ජ. ඩොලර් මිලියන 500 ක වටිනාකමකින් යුත් ජාත්‍යන්තර බැඳුම්කරය පියවීමත් සමඟ බැංකු අංශය නිකුත් කළ ජාත්‍යන්තර බැඳුම්කර සඳහා වූ කූපන ගෙවීම් පහළ ගියේය. නව විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් සඳහා සහ ව්‍යාපෘති ණය සඳහා පොලී ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් රජය ලබා ගත් විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් ඉහළ ගියේය. පසුගිය වසර සමඟ සැසඳීමේදී, වාණිජ බැංකුවල දිගුකාලීන වගකීම් අඩු වීම හේතුවෙන් වාණිජ බැංකු විසින් වසර තුළ දී සිදු කළ පොලී ගෙවීම් පහළ ගියේය. කෙසේ නමුත්, ප්‍රාථමික ආදායම් ගිණුම වෙත වූ ලැබීම් ඉහළ යෑම හේතුවෙන් ප්‍රාථමික ගිණුමේ හිඟය පුළුල් වීම තරමක් දුරට සීමා විය. 2016 වසර සමඟ සැසඳීමේදී 2017 වසරේදී දළ නිල සංචිත මට්ටම ඉහළ යෑම පිළිබිඹු කරමින් වසර තුළ දී සංචිත වත්කම් ආයෝජනය මත වූ ඉපැයීම් ඉහළ ගියේය. 2017 වසර තුළ දී ගෝලීය පොලී අනුපාතික ඉහළ යෑම පිළිබිඹු කරමින් බැංකු අංශයේ විදේශීය වත්කම් වෙනුවෙන් වූ ආදායම් ඉහළ යෑමද මේ සඳහා දායක විය.

### 5.4.3 ද්විතීයික ආදායම

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වය හේතුවෙන් පෞද්ගලික හා රජයේ සංක්‍රාමවලින් සමන්විත ද්විතීයික ආදායම් ගිණුම 2017 වසර තුළ දී මන්දගාමී තත්ත්වයක පැවතුණි.** ද්විතීයික ආදායම් ගිණුමේ ලැබීම් සඳහා වැඩි දායකත්වයක් සපයන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2016 වසරේදී වාර්තා කළ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 7,164 ක් දක්වා සියයට 1.1 කින් අඩු විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල දක්නට ලැබුණු මෙම අඩු වීමේ ප්‍රවණතාවය සඳහා ලෝක ආර්ථිකයේ මන්දගාමීත්වය සහ මැදපෙරදිග රටවල පවතින භූ-දේශපාලනික අස්ථාවරත්වය මෙන්ම ඛනිජ තෙල් මිල පහළ යෑම හේතුවෙන් විදේශ රැකියා සපයන ප්‍රධාන රටවල ආදායම පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දත්ත අනුව, සියලුම පුහුණු කාණ්ඩයන් යටතේ විදේශ රැකියා සඳහා ශ්‍රම සංක්‍රමණය අඩු වී ඇති අතර, ඒ හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව 2017 වසර තුළ දී සමස්ත ශ්‍රම සංක්‍රමණය සියයට 12.6 කින් කැපී පෙනෙන ලෙස අඩු වී ඇත. විදේශ රැකියා සඳහා ශ්‍රම සංක්‍රමණය පහළ යෑම කෙරෙහි දේශීය ශ්‍රම වෙළඳපොලේ රැකියා අවස්ථා බහුල වීම හා ගෘහ සේවිකාවන් සහ නුපුහුණු කාණ්ඩ යටතේ ශ්‍රම සංක්‍රමණය අධෛර්යමත් කිරීමට රජය විසින් ගනු ලැබූ ඇතැම් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ප්‍රධාන වශයෙන් හේතු විය. පවුල් පසුබිම් වාර්තා සැපයීම සහ අවම වයස් සීමාවන් පැනවීම මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අතරට ඇතුළත් වූ අතර එය ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ විදේශ සේවා නියුක්තිය පහළ යාම සඳහා බලපෑවේය. තවද, ශ්‍රී ලාංකිකයන් නීත්‍යානුකූල නොවන ලෙස විදේශගත වීම සහ නියමිත වීසා කාලසීමාව ඉක්මවා සිටින්නන්ගේ සංඛ්‍යාව ඉහළ යෑම, බොහෝ විදේශීය සේවා යෝජකයින් ඉල්ලා සිටින පුහුණු ශ්‍රමිකයින්ගේ හිඟතාවය සහ සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ, විශේෂයෙන්ම ගෘහ සේවිකාවන් ඇතුළු නුපුහුණු ශ්‍රමික කාණ්ඩයේ, භාෂා හැසිරවීමේ හැකියාව ප්‍රමාණවත් නොවීම යනාදී බාධාවන් හේතුවෙන් ශ්‍රී ලාංකිකයන් සඳහා වූ විදේශ රැකියා අවස්ථාවන් වසර තුළ දී සීමා වූ අතර, එය ශ්‍රම සංක්‍රමණය පහත වැටීමට හේතු විය. මේ අතර, වසර තුළ දී රජයේ සංක්‍රාම ලැබීම්ද අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 වසර තුළ දී ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 7,175 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව සියයට 1.2 ක අඩු වීමකි.

## 5.5 ජංගම ගිණුමේ ශේෂය

**වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වීම, ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම් ඉහළ යෑම, සංචාරක ඉපැයීම් මන්දගාමී වීම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල පහත වැටීම 2017 වසර තුළ දී විදේශීය ජංගම ගිණුම වෙත අහිතකර බලපෑම් ඇති කළේය.** 2017 වසරේ මාර්තු මස සිට අපනයන ආදායම ක්‍රමයෙන් වර්ධනය

5

වුවද, ආනයන වියදමේ සැලකිය යුතු ඉහළ යෑම පියවීම සඳහා ඉහළ ගිය අපනයන ආදායම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙළඳ ශේෂය සැලකිය යුතු ලෙස පිරිහුණි. ප්‍රධාන වශයෙන් කාලගුණික හේතු නිසා ඉහළ ගිය සහල් සහ ඉන්ධන වැනි ආනයන හේතු කොට ගෙන ආනයන වියදම වර්ධනය විය. 2017 වසරේදී ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ යෑම සඳහා රත්‍රන් සහ මූල ලෝහ ආනයනය ඉහළ යෑමද හේතු විය. මේ අතර, වසර තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලෙස ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ලැබීම් අඩු වූ අතර, ඍජු ආයෝජන ව්‍යාපාර විසින් ප්‍රතිආයෝජනය කළ ඉපැයීම් ඉහළ යෑම සහ පොලී ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් විය. කෙසේ වෙතත්, සංචාරක ඉපැයීම්, ප්‍රවාහන සහ පරිගණක සේවා යන උප අංශවල වර්ධනය විදේශීය ජංගම ගිණුමේ හිඟය තරමක් දුරට අඩු කිරීමට දායක විය. මෙම ප්‍රවණතා හමුවේ, ජංගම ගිණුමේ හිඟය 2016 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,742 සිට 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 2,309 ක් දක්වා ඉහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සැලකීමේදී 2016 වසරේදී සියයට 2.1 ක් වූ ජංගම ගිණුමේ හිඟය 2017 වසරේදී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2.6 ක් විය.

5

## 5.6 ප්‍රාග්ධන ගිණුමේ ශේෂය


**2017 වසරේදී ප්‍රාග්ධන සංක්‍රාම ආකාරයෙන් වූ ලැබීම් අඩු වීමත් සමඟ, ප්‍රාග්ධන ගිණුමේ ක්‍රියාකාරිත්වය තවදුරටත් මන්දගාමී විය.** පෙර වසර සමඟ සැසඳීමේදී 2017 වසරේදී රජයට මෙන්ම පෞද්ගලික අංශය වෙත ලැබුණු ප්‍රාග්ධන සංක්‍රාමවල සුළු අඩු වීමක් වාර්තා විය. ඒ අනුව ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තය, 2016 වසරේදී පැවති එ.ජ. ඩොලර් මිලියන 25 සමඟ සැසඳීමේදී 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 11 ක් විය.

## 5.7 මූල්‍ය ගිණුම

**2016 වසර හා සැසඳීමේදී 2017 වසර තුළ දී මූල්‍ය ගිණුමේ ශුද්ධ විදේශීය වගකීම් වෙනස්වීම් මෙන්ම ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම්ද සැලකිය යුතු ලෙස වැඩි විය.** 2017 වසරේදී මූල්‍ය ගිණුමෙහි ගෙවීම්වලට සාපේක්ෂව ලැබීම් ඉහළ යෑම හේතුවෙන් වසර තුළ දී ශුද්ධ විදේශීය වගකීම් වෙනස්වීම් සැලකිය යුතු ලෙස වැඩි විය. තවද, වසර තුළ දී දළ නිල සංචිත සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම්ද කැපී පෙනෙන ලෙස වැඩි විය. 2016 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 2,213 ක් ලෙස වාර්තා වූ ශුද්ධ විදේශීය වගකීම් වෙනස්වීම 2017 වසරේදී එ.ජ.

**5.11 රූප සටහන**

**මූල්‍ය ගිණුම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඩොලර් මිලියන 5,128 ක ශුද්ධ වෙනස් වීමක් වාර්තා කළ අතර, 2017 වසරේදී ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම්, 2016 වසරේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 31 හා සැසඳීමේදී එ.ජ. ඩොලර් මිලියන 2,944 ක් විය. එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව මගින් පොලී අනුපාත තවදුරටත් ඉහළ නංවනු ඇතැයි අපේක්ෂා කිරීම හමුවේ 2016 වසරේ අවසාන කාර්තුවේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් සැලකිය යුතු ලෙස විදේශීය ආයෝජන ඉවත් කර ගැනීමක් සිදු වූ අතර, එය 2017 වසරේ පළමු කාර්තුව තුළ දී ද අඛණ්ඩව සිදු විය. මෙම තත්ත්වය හමුවේ ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ විනිමය වෙළඳපොළ වෙත අඛණ්ඩව මැදිහත් වීමට අවශ්‍ය වූ අතර, මේ හේතුවෙන් 2017 වසරේ පළමු කාර්තුව තුළ දී දළ නිල සංචිත ශීඝ්‍ර ලෙස අඩු විය. මීට අමතරව, ඉන්දියානු සංචිත බැංකුව සමඟ ඇති කරගත් එ.ජ. ඩොලර් මිලියන 400 ක විදේශ විනිමය හුවමාරු ගිවිසුමද 2017 පළමු කාර්තුව තුළ දී කල් පිරුණි. සාර්ව ආර්ථික ස්ථායීතාවය ඉහළ යෑම සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම අඛණ්ඩව ක්‍රියාත්මක වීම හමුවේ 2017 වසරේදී තවත් වාරික දෙකක් අනුමත වීම හේතුවෙන් ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ යෑමත් සමඟ රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන රටින් පිටතට ගලා යෑම කැපී පෙනෙන ලෙස වෙනස් වී ඇත. 2017 වසරේ දෙවන කාර්තුවේ සිට මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. හම්බන්තොට වරාය ව්‍යාපෘතිය, කොළඹ වරාය නගර ව්‍යාපෘතිය, විදුලි සංදේශ අංශය සහ අනෙකුත් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ලැබුණු විදේශීය ආයෝජන තුළින් සවිමත් වූ විදේශීය ඍජු ආයෝජන මෙතෙක් ලැබුණු ඉහළම වාර්ෂික අගය

### 5.9.අ සංඛ්‍යා සටහන
### මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| **මූල්‍ය ගිණුම** | **31** | **2,213** | **2,944** | **5,128** |
| **සෘජු ආයෝජන** | **237** | **897** | **72** | **1,375** |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | 235 | 710 | 68 | 535 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් නොවන හිමිකම් | 235 | 260 | 68 | 32 |
| සෘජු ආයෝජකයන් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | 235 | 260 | 68 | 32 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | - | 450 | - | 503 |
| ණය උපකරණ | 2 | 187 | 4 | 840 |
| සෘජු ආයෝජකයන් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | 2 | 187 | 4 | 840 |
| **විවිධ ආයෝජන** | **...** | **993** | **...** | **1,772** |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | - | 24 | - | 359 |
| ණය සුරැකුම්පත් | ... | 969 | ... | 1,413 |
| තැන්පතු භාරගන්නා ආයතන | ... | - | ... | -500 |
| දිගු කාලීන | ... | - | ... | -500 |
| රජය | - | 969 | - | 1,913 |
| කෙටි කාලීන (භාණ්ඩාගාර බිල්පත්) | - | 36 | - | 81 |
| දිගු කාලීන | - | 932 | - | 1,832 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | -361 | - | 360 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | - | -207 | - | -28 |
| ස්වෛරීත්ව බැඳුම්කර | - | 1,500 | - | 1,500 |
| මූල්‍ය ව්‍යුත්පන්න | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන** | **266** | **323** | **102** | **1,981** |
| මුදල් සහ තැන්පතු | 5 | -609 | 78 | -228 |
| මහ බැංකුව | - | -701 | - | -402 |
| කෙටි කාලීන | - | -1 | - | -2 |
| දිගු කාලීන | - | -700 | - | -400 |
| තැන්පතු භාරගන්නා ආයතන | 5 | 92 | 78 | 173 |
| කෙටි කාලීන | -4 | 92 | 11 | 173 |
| දිගු කාලීන | 9 | - | 67 | - |
| **පිටු අංක 173 හා සම්බන්ධයි** | | | | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **විදේශීය සෘජු ආයෝජන** | | | | |
| හිමිකම් | | 260 | | 32 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | | 450 | | 503 |
| අන්තර් සමාගම් ණය | | 276 | | 959 |
| අන්තර් සමාගම් ණය ආපසු ගෙවීම් | | -88 | | -119 |
| **මුළු විදේශීය සෘජු ආයෝජන (1)** | | **897** | | **1,375** |
| ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ලබා දුන් ණය (2) | | 181 | | 538 |
| **ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ලබා දුන් ණයද ඇතුළුව මුළු විදේශීය සෘජු ආයෝජන (1+2) (ඇ)** | | **1,078** | | **1,913** |
| **කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ මුළු ශුද්ධ ලැබීම්** | | **19** | | **279** |
| සෘජු ආයෝජන | | -5 | | -80 |
| විවිධ ආයෝජන | | 24 | | 359 |
| **රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත්හි ශුද්ධ විදේශීය ආයෝජන (භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර)** | | **-324** | | **441** |
| විදේශීය මිල දී ගැනීම් | | 1,238 | | 1,667 |
| විදේශීය විකුණුම් | | 1,562 | | 1,226 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ ඇස්තමේන්තුවලින් වෙනස් වනුයේ ආවරණ සහ ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙනි.

වාර්තා කළ අතර, එමගින් මූල්‍ය ගිණුම තවදුරටත් ශක්තිමත් විය. මීට අමතරව, එ.ජ. ඩොලර් බිලියන 1.5 ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සහ එ.ජ. ඩොලර් බිලියන 1 ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් ලැබීම් තුළින්ද මූල්‍ය ගිණුම ශක්තිමත් විය. වසර තුළ දී, පෞද්ගලික අංශයේ සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ විදේශීය ණය ලබා ගැනීම් මෙන්ම ණය ආපසු ගෙවීම්ද ඉහළ ගියේය. තවද, බැංකු අංශයෙහි විදේශීය ණය හා වෙළඳ ණය සහ අත්තිකාරම් ආකාරයෙන් වන විදේශීය වගකීම් ඉහළ යෑමක් වාර්තා වූ අතර, ලංකා බැංකුව එ.ජ. ඩොලර් මිලියන 500 ක ජාත්‍යන්තර බැඳුම්කරයක් 2017 වසර තුළ දී පියවන ලදී. මෙම සාධනීය තත්ත්වයන් සහ 2017 වසරේ මාර්තු මස සිට ශ්‍රී ලංකා මහ බැංකුව විදේශීය විනිමය වෙළඳපොළෙන් සැලකිය යුතු ප්‍රමාණයක ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම, දළ නිල සංචිත ප්‍රමාණය 2017 වසරේ අවසානය වන විට කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීමට හේතු විය.

## 5.7.1 සෘජු ආයෝජන

**ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වලින් ලබාගත් විදේශීය ණයද ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන ලැබීම්, 2017 වසරේදී ඉතිහාසයේ ඉහළම අගය වාර්තා කළේය.** ඒ අනුව, ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබා ගත් විදේශීය ණයද ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන ලැබීම් ප්‍රමාණය 2016 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,078 හා සැසඳීමේදී, 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 1,913 ක් විය. ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබා ගත් ණය ඉවත් කළ පසු විදේශීය සෘජු ආයෝජන, 2017 වසරේදී සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරමින් 2016 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 897 සිට එ.ජ. ඩොලර් මිලියන 1,375 ක් දක්වා ඉහළ ගියේය. වසර තුළ දී ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබා ගත් ණය ඉවත් කළ පසු විදේශීය සෘජු ආයෝජන, හිමිකම් කොටස් වෙත වූ ශුද්ධ ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 32 කින් ද, ප්‍රතිආයෝජනය කළ ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 503 කින් ද, ශුද්ධ අන්තර් සමාගම් ණය එ.ජ. ඩොලර් මිලියන 840 කින් ද සමන්විත විය. තවද, ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් විසින් එම සමාගම් හා සම්බන්ධතාවයක් නොමැති පාර්ශ්වයන්ගෙන් ලබාගත් විදේශීය ණය ප්‍රමාණය, 2016 වසරේදී ලබාගත් එ.ජ. ඩොලර් මිලියන 181 හා සැසඳීමේදී, 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 538 ක් විය. හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සහ කොළඹ වරාය නගර ව්‍යාපෘතිය වෙත වූ ලැබීම් විදේශීය සෘජු ආයෝජන ලැබීම් අතරින් ප්‍රධාන විය. රටට අවශ්‍යව

පවතින ණය නොවන විදේශීය විනිමය ලැබීම් හරහා විදේශීය අංශයේ තිරසාර වර්ධනයක් ඇති කිරීමට උපකාරී වන අන්දමින්, 2018 වසර සඳහා සහ ඉන් ඉදිරියට මෙම ව්‍යාපෘති දෙක වෙනුවෙන් විදේශීය සෘජු ආයෝජන විශාල වශයෙන් ආකර්ෂණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආංශිකමය වශයෙන් ගත් කල, ප්‍රධාන විදේශීය ආයෝජන ලැබීම්, වරාය, නිවාස හා දේපළ සංවර්ධන, විදුලි සන්දේශ සහ හෝටල් යනාදී අංශයන් වෙත ලැබුණි. මීට අමතරව, වසර තුළ නිෂ්පාදන අංශය වෙත මධ්‍යස්ථ ප්‍රමාණයක විදේශ සෘජු ආයෝජන ලැබුණි. ආයෝජන රට වෙත ලැබුණු ආසන්නතම රට අනුව ගත් කල, 2017 වසරේ විදේශීය සෘජු ආයෝජන සිදු කළ ප්‍රධාන රටවල් පහ වූයේ චීනය, හොංකොං, ඉන්දියාව, මැලේසියාව, සහ සිංගප්පූරුවයි. මේ අතර, ශ්‍රී ලාංකික සමාගම් විසින් විදේශීය රටවල සිදු කළ සෘජු ආයෝජන ශුද්ධ වත්කම් අත්කර ගැනීම් 2016 වසරේ වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 237 හා සැසඳීමේදී, 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 72 ක් විය. 2017 වසරේ දක්නට ලැබුණු සාමාන්‍ය තත්ත්වයට වඩා 2016 වසරේ විදේශීය සෘජු ආයෝජන ගෙවීම් සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, ඒ සඳහා ශ්‍රී ලාංකික ඇඟලුම් කර්මාන්තය විසින් සිදු කරන ලද විදේශ ආයෝජන ප්‍රධාන වශයෙන් හේතු විය.

5

### 5.7.2 විවිධ ආයෝජන

#### හිමිකම්

**විදේශීය සෘජු ආයෝජන වශයෙන් වූ ලැබීම් හැරුණු විට කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ලැබීම් පිළිබිඹු කෙරෙන හිමිකම් කොටස් වෙත වූ විවිධ ආයෝජන, 2017 වසරේදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** හිමිකම් මත සිදු කෙරෙන විවිධ ආයෝජන, ශ්‍රී ලාංකීය ව්‍යාපාරයක මුළු කොටස් ප්‍රමාණයෙන් සියයට 10 කට වඩා අඩු තනි විදේශීය ආයෝජනයන් වශයෙන් සැලකෙන අතර, සෘජු ආයෝජන ගනුදෙනු හැර කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජනවලින් සමන්විත වේ. ඒ අනුව, හිමිකම් කොටස් ආකාරයෙන් ලද විවිධ ආයෝජන 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 359 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. මේ තුළ, ද්විතීයික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 202 ක ශුද්ධ ලැබීම් සහ එ.ජ. ඩොලර් මිලියන 157 ක ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ ලැබීම් අන්තර්ගත වේ. මෙය, 2016 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 24 ක මධ්‍යස්ථ මට්ටමේ කොටස් හිමිකම් ආකාරයෙන් වූ විවිධ ආයෝජන ශුද්ධ ලැබීම් සමඟ සැසඳීමේදී තියුණු ඉහළ යෑමකි. 2017 වසරේ මාර්තු මස සිට, රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන තුළින්ද පිළිබිඹු වූ ආයෝජකයින්ගේ අපේක්ෂාවන්හි හිතකර වෙනස, විදේශීය සෘජු ආයෝජන සහ විවිධ හිමිකම් ආයෝජන වශයෙන් වූ විදේශීය ආයෝජනවල හිතකර වර්ධනය සඳහාද දායක විය.

#### ණය සුරැකුම්පත්

**ණය සුරැකුම්පත්වල සිදු වූ විදේශීය ආයෝජන, 2017 වසරේ මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධානතම ලැබීම් වේ.** 2017 වසරේදී ශ්‍රී ලංකාව එ.ජ. ඩොලර් බිලියන 1.5 ක් වූ එකොළොස් වන ස්වෛරීත්ව බැඳුම්කරය සාර්ථකව නිකුත් කළ අතර, භාණ්ඩාගාර බැඳුම්කර වෙතද කැපී පෙනෙන ප්‍රමාණයක විදේශීය ආයෝජන ලැබුණි. ගෝලීය පොලී අනුපාත ඉහළ යන කාලපරිච්ඡේදයකදී, සියයට 6.20 ක් වැනි තරගකාරී කූපන අනුපාතිකයක් යටතේ වසර 10 ක කල් පිරීමේ කාලයක් සහිතව නිකුත් කරන ලද එකොළොස් වන ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව තුළින්, ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික මූලිකාංග පිළිබඳ ආයෝජකයින් තුළ පැවති අඛණ්ඩ විශ්වාසය පිළිබිඹු විය. භාණ්ඩාගාර බැඳුම්කර වෙත වූ විදේශීය ආයෝජන 2016 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 361 ක ශුද්ධ ගෙවීම් හා සැසඳීමේදී, 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 360 ක කැපී පෙනෙන ශුද්ධ ලැබීම් ප්‍රමාණයක් වාර්තා වීම තුළින් මෙම තත්ත්වය තවදුරටත් තහවුරු විය. සමස්තයක් ලෙස, භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන, 2017 වසරේ පළමු කාර්තුව තුළ දී එ.ජ. ඩොලර් මිලියන 415 ක ශුද්ධ ගෙවීමක්ව තිබියදීත්, 2017 වසර සඳහා එ.ජ. ඩොලර් මිලියන 413 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. ලංකා බැංකුව මගින් නිකුත් කළ එ.ජ. ඩොලර් මිලියන 500 ක වටිනාකමකින් යුතු වසර 5 ක් සඳහා වූ ජාත්‍යන්තර බැඳුම්කරය කල්පිරීම, 2017 වසර තුළ දී ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් වූ ප්‍රධානතම ගෙවීම විය. මේ අතර, තැන්පතු භාර ගන්නා ආයතන සුරැකුම්පත් ආකාරයෙන් රඳවාගත් වත්කම්ද 2017 වසරේදී සාපේක්ෂව ගත් කල නොවෙනස්ව පැවතුණි.

### 5.7.3 වෙනත් ආයෝජන

#### මුදල් සහ තැන්පතු

**2017 වසර තුළ දී මුදල් සහ තැන්පතු වගකීම් අඩු වූ අතර, මුදල් සහ තැන්පතු වත්කම් ඉහළ ගියේය.** ඉන්දියානු සංචිත බැංකුව සමඟ පැවති ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු ගිවිසුමෙහි නොපියවා ඉතිරිව පැවති එ.ජ. ඩොලර් මිලියන 400 ක් වූ ප්‍රමාණය කල්පිරීමත් සමඟ මහ බැංකුවේ මුදල් සහ තැන්පතු

### 5.9.ආ සංඛ්‍යා සටහන
### මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| අනෙකුත් ආයෝජන (පිටු අංක 171 හා සම්බන්ධයි) | | | | |
| ණය | - | 793 | - | 1,839 |
| මහ බැංකුව | - | -123 | - | 184 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | - | -123 | - | 184 |
| සමීපස්ථ ණය පහසුකම | - | -455 | - | -235 |
| විස්තීර්ණ ණය පහසුකම | - | 332 | - | 419 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | -507 | - | 271 |
| කෙටි කාලීන | - | -608 | - | -280 |
| දිගු කාලීන | - | 100 | - | 551 |
| රජය | - | 1,287 | - | 1,215 |
| දිගු කාලීන | - | 1,287 | - | 1,215 |
| අනෙකුත් අංශ (ඇ) | - | 136 | - | 170 |
| දිගු කාලීන | - | 136 | - | 170 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -118 | 84 | 54 | 309 |
| තැන්පතු භාරගන්නා ආයතන | -3 | - | 17 | - |
| කෙටි කාලීන | -3 | - | 17 | - |
| අනෙකුත් අංශ (ඈ) | -115 | 84 | 38 | 309 |
| කෙටි කාලීන | -115 | 84 | 38 | 309 |
| අනෙකුත් ලැබිය යුතු / ගෙවිය යුතු ගිණුම් | 379 | 55 | -31 | 61 |
| මහ බැංකුව | - | 55 | - | 61 |
| කෙටි කාලීන (ඉ) | - | 55 | - | 61 |
| තැන්පතු භාරගන්නා ආයතන | 379 | - | -31 | - |
| කෙටි කාලීන | 379 | - | -31 | - |
| විශේෂ ගැනුම් හිමිකම් | | - | | - |
| **සංචිත වත්කම්** | **-472** | | **2,771** | |
| මූල්‍ය රත්‍රන් | - | | - | |
| විශේෂ ගැනුම් හිමිකම් | -5 | | 2 | |
| ජා. මූ. අරමුදලේ සංචිත මට්ටම | - | | - | |
| අනෙකුත් සංචිත වත්කම් | -467 | | 2,768 | |
| මුදල් සහ තැන්පතු | -1,267 | | 393 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | -1,365 | | 859 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | 98 | | -465 | |
| සුරැකුම්පත් | 800 | | 2,375 | |
| ණය සුරැකුම්පත් | 800 | | 2,375 | |
| දිගු කාලීන | 800 | | 2,375 | |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-2,182** | | **-2,184** | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **රජයේ දිගු කාලීන ණය (ශුද්ධ)** | | **1,287** | | **1,215** |
| ලැබීම් (ණය මුදා හැරීම්) | | 2,163 | | 2,535 |
| ව්‍යාපෘති ණය | | 1,278 | | 1,535 |
| විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම | | 700 | | 1,000 |
| වැඩසටහන් ණය | | 185 | | - |
| ගෙවීම් | | 876 | | 1,320 |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික අංශයේ සමාගම් ඇතුළත් වේ.

(ඈ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්වල වෙළඳ ණය ඇතුළත් වේ.

(ඉ) ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල ශුද්ධ ගනුදෙනු ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වගකීම් අඩු විය. මේ අතර, තැන්පතු භාර ගන්නා ආයතනයන්හි වගකීම් සහ වත්කම් යන දෙවර්ගයම 2017 වසරේදී ඉහළ ගියේය. ඒ අනුව, තැන්පතු භාර ගන්නා ආයතනයන්හි මුදල් සහ තැන්පතු වගකීම් එ.ජ. ඩොලර් මිලියන 173 කින් වැඩි වූ අතර, වත්කම් ස්වරූපයෙන් වූ මුදල් සහ තැන්පතු එ.ජ. ඩොලර් මිලියන 78 කින් වැඩි විය.

#### විදේශීය ණය

2017 වසරේදී **රජය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ පෞද්ගලික අංශය වෙත වූ ඉහළ ණය ලැබීම හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වූ මුළු විදේශීය ණය ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** රජය වෙත වූ විදේශීය ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 2,535 ක් වූ අතර, එය වාරික දෙකකින් ලබා ගත් එ.ජ. ඩොලර් බිලියන එකක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමින් සහ ඉතිරිය දිගුකාලීන ව්‍යාපෘති ණය ලැබීම්වලින් සමන්විත විය. 2017 වසරේදී රජයේ ව්‍යාපෘති සඳහා වූ ප්‍රධාන ණය ලැබීම් තුළ දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ 1, 2 සහ 4 වන කොටස්, පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතියෙහි 3 වන අදියර, ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන - 3 වන වාරිකය, හම්බන්තොට කේන්ද්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, දෙවන සෞඛ්‍ය අංශය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, මහ කොළඹ සම්ප්‍රේෂණ සහ බෙදා හැරීම් අලාභ අඩු කිරීමේ ව්‍යාපෘතිය, ජල සම්පාදන සහ සනීපාරක්ෂාව වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සහ වෙරළ ආරක්ෂාව සහ ජලසම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන අතිරේක මූල්‍යනය යනාදිය සඳහා වූ ණය ලැබීම් ඇතුළත් විය. මේ අතර, ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ එ.ජ. ඩොලර් මිලියන 419 ක වටිනාකමකින් යුත් වාරික දෙකක් රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා ගන්නා ලදී. පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත වූ විදේශීය ණය සලකා බැලීමේදී 2017 වසරේදී පෞද්ගලික අංශය වෙත එ.ජ. ඩොලර් මිලියන 535 ක් ලැබුණු අතර රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත එ.ජ. ඩොලර් මිලියන 182 ක ණය ලැබීම් වාර්තා විය.

2017 වසරේදී **සියලුම අංශ විසින් සිදු කරන ලද විදේශීය ණය ආපසු ගෙවීම් සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතුණි.** 2017 වසරේදී රජය විසින් ආපසු ගෙවූ මුළු විදේශීය ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 1,320 ක් වූ අතර එයින් එ.ජ. ඩොලර් මිලියන 280 ක් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමෙහි ණය ආපසු ගෙවීම්ද, ඉතිරිය දිගුකාලීන ව්‍යාපෘති ණය ආපසු ගෙවීම්ද විය. 2009-2012 කාලපරිච්ඡේදයේදී ලබා ගත් ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකම මහ බැංකුව

5

### 5.10 සංඛ්‍යා සටහන
### 2017 වසර තුළ විදේශ ණය මගින් මූල්‍යනය කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන්

| දායකයා සහ ව්‍යාපෘතිය | ලැබුණු ණය මුදල එ.ජ. ඩොලර් මිලියන |
|---|---|
| **රජයේ ව්‍යාපෘතීන් මුළු එකතුව** | **1,535** |
| එයින්; | |
| **චීන අපනයන - ආනයන බැංකුව** | **491** |
| එයින්; | |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 1 කොටස | 147 |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 4 කොටස | 107 |
| පිටත වටරවුම් අධිවේගි මාර්ග ව්‍යාපෘතිය - 3 වන අදියර | 79 |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 2 කොටස | 62 |
| හම්බන්තොට කේන්ද්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 59 |
| මහ කුරුණෑගල ජල සම්පාදන හා මලාපවාහන ව්‍යාපෘතිය | 18 |
| **ආසියානු සංවර්ධන බැංකුව** | **360** |
| එයින්; | |
| ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන - 3 වන වාරිකය | 91 |
| පිවිතුරු බලශක්තිය සහ ප්‍රවේශය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 38 |
| කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ණය පෙළ | 38 |
| ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන - 2 වන වාරිකය | 30 |
| අධ්‍යාපනික සංවර්ධන වැඩසටහන | 29 |
| **ජාත්‍යන්තර සංවර්ධන සංගමය** | **207** |
| එයින්; | |
| දෙවන සෞඛ්‍ය අංශය ප්‍රවර්ධන කිරීමේ ව්‍යාපෘතිය | 62 |
| ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 35 |
| වේලි ආරක්ෂාව සහ ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන අතිරේක මූල්‍යනය | 25 |
| දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම කළමනාකරණ හැකියාවන් වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 20 |
| නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය - A කොටස | 19 |
| **ජපානය** | **156** |
| එයින්; | |
| මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් අලාභ අඩු කිරීමේ ව්‍යාපෘතිය | 52 |
| කැලණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 48 |
| ජාතික මාර්ග පද්ධතියෙහි ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 18 |
| **ඉන්දියාව** | **62** |
| එයින්; | |
| උතුරු පළාත් දුම්රිය සේවාව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | 35 |
| මුහුදු තීරය ආරක්ෂා කිරීමේ නැව් දෙකක් ප්‍රසම්පාදනය කිරීම. | 17 |
| **ඩොයිෂ් බැංකුව (Deutsche Bank AG)** | **35** |
| වානේ පාලම් 537 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 35 |
| **කැල්යොන් ක්‍රෙඩිට් ඇග්‍රිකොල් (Calyon Credit Agricole)** | **28** |
| එයින්; | |
| මහ මාතලේ ජල සැපයුම් ව්‍යාපෘතිය | 15 |
| **ස්පාඤ්ඤය** | **25** |
| එයින්; | |
| ගුවන් පාලම් තුනක් සම්පාදනය කිරීම | 17 |
| **රජය සතු වාණිජ ව්‍යවසායයන්වල මුළු එකතුව** | **182** |
| ශ්‍රීලන්කන් ගුවන් සේවය | 125 |
| හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය - 2 වන අදියර | 57 |

මූලය: ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

5

විසින් 2017 වසරේ ජුනි මාසයේදී සම්පූර්ණයෙන්ම පියවන ලදී. මේ අතර, 2017 වසරේදී තැන්පතු භාර ගන්නා ආයතන වෙත එ.ජ. ඩොලර් මිලියන 271 ක ශුද්ධ ණය ලැබීමක් වාර්තා විය. වසර තුළ දී පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් ගෙවන ලද විදේශීය ණය ප්‍රමාණය පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 362 ක් සහ එ.ජ. ඩොලර් මිලියන 186 ක් විය.

**සමස්තයක් ලෙස, මූල්‍ය ගිණුම වෙත වූ ණය ලැබීම්, ණය ආපසු ගෙවීම්වලට වඩා වැඩි වූ අතර, මේ අනුව, 2016 වසර සමඟ සැසඳීමේදී 2017 වසරේදී ශුද්ධ විදේශීය ණය ලැබීම් ඉහළ මට්ටමක පැවතුණි.** 2016 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 793 ක ශුද්ධ විදේශීය ණය ලැබීම් සමඟ සැසඳීමේදී 2017 වසරේදී මූල්‍ය ගිණුම වෙත වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 1,839 ක් විය. මෙසේ ඉහළ ගිය ණය ලැබීම් තුළ රජය, ශ්‍රී ලංකා මහ බැංකුව, තැන්පතු භාර ගන්නා ආයතන සහ පෞද්ගලික අංශය වෙත වූ ශුද්ධ ණය ලැබීම් පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 1,215 කින්, එ.ජ. ඩොලර් මිලියන 184 කින්, එ.ජ. ඩොලර් මිලියන 271 කින් සහ එ.ජ. ඩොලර් මිලියන 173 කින් සමන්විත වූ අතර, 2017 වසරේදී රජය සතු වාණිජ ව්‍යවසායයන් එ.ජ. ඩොලර් මිලියන 4 ක ශුද්ධ ණය ගෙවීමක් වාර්තා කළේය.

## වෙළඳ ණය හා අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම්

**2017 වසරේදී අනේවාසිකයින්ගෙන් ලැබුණු වෙළඳ ණය හා අත්තිකාරම් සහ අනේවාසිකයන්ට ලබා දුන් වෙළඳ ණය හා අත්තිකාරම් ඉහළ ගියේය.** ප්‍රධාන වශයෙන් 2017 වසරේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කළ ගෙවීම්වලට සාපේක්ෂව ණය මත ඛනිජ තෙල් මිලදී ගැනීම් ඉහළ යෑම හේතුවෙන් අනේවාසිකයින්ගෙන් ලැබුණු වෙළඳ ණය සහ අත්තිකාරම් වැඩි විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හැර අනෙකුත් පෞද්ගලික සමාගම් සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වලට ලැබුණු වෙළඳ ණය, 2016 වසරේ වාර්තා කළ පහළ යෑමට සාපේක්ෂව, 2017 වසර තුළ වෙළඳ භාණ්ඩ ආනයනවල සිදු වූ සැලකිය යුතු ඉහළ යෑමට අනුරූපව ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, වෙළඳ ණය සහ අත්තිකාරම් වගකීම්වල ශුද්ධ වෙනස්වීම් 2016 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 84 ක ඉහළ යෑමක් වාර්තා කළ අතර, 2017 වසරේදී එය එ.ජ. ඩොලර් මිලියන 309 ක් විය. මේ අතර, ශ්‍රී ලාංකික සමාගම් සහ බැංකු අංශය විසින් අනේවාසිකයින්ට ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්ද 2016 වසරේදී වූ එ.ජ. ඩොලර් මිලියන 118 ක අඩුවීමට සාපේක්ෂව 2017

වසරේදී එ.ජ. ඩොලර් මිලියන 54 කින් වැඩි විය. 2017 වසර තුළ අනේවාසිකයින්ට දුන් වෙළඳ ණය ප්‍රධාන වශයෙන් ශ්‍රී ලාංකික ඇඟලුම් අංශයේ සමාගම් විසින් ලබා දී ඇත. මේ අතර, 2017 වසරේදී මූලික වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ (ACU) වගකීම් ඇතුළත් අනෙකුත් ගෙවිය යුතු ගිණුම් එ.ජ. ඩොලර් මිලියන 61 කින් ඉහළ ගිය අතර තැන්පතු භාර ගන්නා ආයතන වෙත වූ අනෙකුත් ලැබිය යුතු ගිණුම් එ.ජ. ඩොලර් මිලියන 31 කින් අඩු විය.

### 5.7.4 විදේශීය සංචිත වත්කම්

**2017 වසරේදී විදේශීය සංචිත වත්කම් තත්ත්වයෙහි ඉහළ යෑමට අනුකූලව, වසර තුළ දී විදේශීය සංචිත වත්කම් හා සම්බන්ධ ගනුදෙනු සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළේය.** සංචිත වත්කම් හා සම්බන්ධ ගනුදෙනු ලෙස 2016 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 472 ක ශුද්ධ අඩු වීම හා සැසඳීමේදී 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 2,771 ක ශුද්ධ වැඩි වීමක් දක්නට ලැබුණි. සංචිත වත්කම් හා සම්බන්ධ ගනුදෙනු ඉහළ යෑම තුළ ස්ථාවර ආදායම් සුරැකුම්පත් ගනුදෙනු එ.ජ. ඩොලර් මිලියන 2,375 කින් ඉහළ යෑම සහ මුදල් සහ තැන්පතු ගනුදෙනු එ.ජ. ඩොලර් මිලියන 393 කින් ඉහළ යෑම අන්තර්ගත වේ. දළ නිල සංචිත වෙත වූ ලැබීම් ඉහළ යෑම, වසර තුළ මහ බැංකුව විසින් එ.ජ. ඩොලර්වලින් නාමනය කරන ලද දිගුකාලීන ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජන වැඩි වශයෙන් සිදු කිරීමට හේතු විය. 2016 වසරේදී මෙන්ම 2017 වසරේදී ද මූල්‍ය රත්‍රන් ගනුදෙනු වාර්තා නොවීය.

## 5.8 සමස්ත ශේෂය

**අඛණ්ඩව වසර දෙකක් තුළ සමස්ත ශේෂයේ හිඟ තත්ත්වයන් වාර්තා කිරීමෙන් අනතුරුව, මූල්‍ය ගිණුමෙහි වූ වර්ධනය පිළිබිඹු කරමින්, 2017 වසරේදී සමස්ත ශේෂය අතිරික්තයක් වාර්තා කළේය.** ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමෙන් ලද ලැබීම්, රජය විසින් ලබා ගත් ශුද්ධ ව්‍යාපෘති සහ වැඩසටහන් ණය, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතු සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැලකිය යුතු ලෙස ශුද්ධ විදේශ විනිමය අවශෝෂණය කිරීම ඇතුළුව මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් හේතුවෙන් 2016 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 4,529 ක ශුද්ධ විදේශීය සංචිත ප්‍රමාණය 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 6,597 ක් දක්වා වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, එම කාලපරිච්ඡේද දෙක අතර වාර්තා වූ ශුද්ධ විදේශීය සංචිත අතර වෙනස දැක්වෙන සමස්ත ශේෂය 2016 වසරේදී පැවති එ.ජ. ඩොලර් මිලියන 500 ක හිඟයට සාපේක්ෂව 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 2,068 ක අතිරික්තයක් විය.

## 5.9 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

**අන්තර්ජාතික ආයෝජන තත්ත්වය මගින් රටක් වෙනත් රටවල් සමග පවත්වාගෙන යනු ලබන විදේශීය වත්කම් සහ වගකීම් තත්ත්වයෙහි වටිනාකම සහ සංයුතිය පිළිබිඹු කරන අතර, 2017 වසර අවසානය වනවිට ශ්‍රී ලංකාවේ විදේශීය වගකීම් සහ විදේශීය වත්කම් තත්ත්වය 2016 වසර අවසාන තත්ත්වය සමග සැසඳීමේදී ඉහළ ගියේය.** ප්‍රධාන වශයෙන් විදේශීය සංචිත වත්කම් තත්ත්වය ඉහළ යෑම හේතුවෙන් මුළු විදේශීය වත්කම් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 12,366 ක් දක්වා ඉහළ ගිය අතර, මේ සඳහා සෘජු ආයෝජන, වෙළඳ ණය හා අත්තිකාරම් සහ මුදල් හා තැන්පතු වත්කම් තත්ත්වය ඉහළ යෑමද දායක විය. මේ අතර, ප්‍රධාන වශයෙන් සෘජු ආයෝජන, විවිධ ආයෝජන සහ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය වගකීම් සහ වෙළඳ ණය තත්ත්වයන් ඉහළ යෑම හේතුවෙන් මුළු විදේශීය වගකීම් තත්ත්වය 2016 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 54,857 සිට 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 60,721 ක් දක්වා ඉහළ ගියේය. විදේශීය වත්කම් තත්ත්වයෙහි වැඩි වීමට වඩා වැඩියෙන් විදේශීය වගකීම් තත්ත්වය වැඩි වීම හේතුවෙන් අන්තර්ජාතික ආයෝජනවල ශුද්ධ වගකීම් තත්ත්වය 2016 වසර අවසානයේදී පැවති එ.ජ. ඩොලර් මිලියන 44,591 සිට 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 48,355 ක් දක්වා ඉහළ ගියේය. ශ්‍රී ලංකාවේ ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය අඛණ්ඩව සෘණ අගයක් වාර්තා කළද, වසර තුළ දී මූල්‍ය ගිණුම වෙත සෘජු ආයෝජන සහ අනෙකුත් ණය නොවන මූලාශ්‍ර වෙතින් වූ ලැබීම්වල වර්ධනයක් දක්නට ලැබුණි.

### 5.9.1 සෘජු ආයෝජන තත්ත්වය

**සැලකිය යුතු ඉහළ මට්ටමක සෘජු ආයෝජන ලැබීම හේතුවෙන් 2017 වසර අවසානය වන විට සෘජු ආයෝජන වගකීම් තත්ත්වය ඉහළ ගියේය.** ඒ අනුව, ඉතිහාසයේ වාර්තා වූ ඉහළම වාර්ෂික විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය මෙම වසරේදී වාර්තා වීම, සෘජු ආයෝජන හිමිකම් වගකීම් තත්ත්වය ඉහළ යෑම මෙන්ම නොපියවා ඉතිරිව ඇති අන්තර් සමාගම් ණය තත්ත්වය ඉහළ යෑම පිළිබිඹු කරමින් සෘජු ආයෝජන වගකීම් තත්ත්වය 2016 වසර අවසානයේදී පැවති එ.ජ. ඩොලර්

### 5.11 සංඛ්‍යා සටහන
### අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

එ.ජ. ඩොලර් මිලියන
*(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)*

| ශීර්ෂය | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | වත්කම් | වගකීම් |
| **සෘජු ආයෝජන (ඇ)** | **1,219** | **9,845** | **1,278** | **11,070** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | 1,214 | 7,020 | 1,268 | 7,406 |
| ණය උපකරණ | 5 | 2,825 | 9 | 3,664 |
| **විවිධ ආයෝජන** | **…** | **13,684** | **…** | **15,578** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | | 1,419 | | 1,491 |
| අනෙකුත් අංශ | | 1,419 | | 1,491 |
| ණය සුරැකුම්පත් (ඈ) | … | 12,265 | … | 14,087 |
| තැන්පතු භාරගන්නා ආයතන | … | 2,190 | … | 1,666 |
| දිගු කාලීන | … | 2,190 | … | 1,666 |
| රජය | | 9,903 | | 12,244 |
| කෙටි කාලීන | | 80 | | 167 |
| දිගු කාලීන | | 9,823 | | 12,077 |
| අනෙකුත් අංශ | | 172 | | 177 |
| දිගු කාලීන | | 172 | | 177 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන** | **3,028** | **31,329** | **3,130** | **34,073** |
| **මුදල් සහ තැන්පතු** | **706** | **2,442** | **784** | **2,213** |
| මහ බැංකුව | | 403 | | 1 |
| කෙටි කාලීන | | 3 | | 1 |
| දිගු කාලීන | | 400 | | - |
| තැන්පතු භාරගන්නා ආයතන | 706 | 2,039 | 784 | 2,212 |
| කෙටි කාලීන | 535 | 2,039 | 546 | 2,212 |
| දිගු කාලීන | 171 | | 238 | |
| **ණය** | | **26,342** | | **28,912** |
| මහ බැංකුව | | 554 | | 765 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | | 554 | | 765 |
| තැන්පතු භාරගන්නා ආයතන | | 4,562 | | 4,833 |
| කෙටි කාලීන | | 3,209 | | 2,929 |
| දිගු කාලීන | | 1,354 | | 1,904 |
| රජය | | 17,295 | | 19,201 |
| දිගු කාලීන | | 17,295 | | 19,201 |
| අනෙකුත් අංශ (ඉ) | | 3,931 | | 4,114 |
| දිගු කාලීන | | 3,931 | | 4,114 |
| **වෙළඳ ණය සහ අත්තිකාරම්** | **707** | **1,480** | **761** | **1,790** |
| තැන්පතු භාරගන්නා ආයතන | 93 | | 109 | |
| කෙටි කාලීන | 93 | | 109 | |
| අනෙකුත් අංශ (ඊ) | 614 | 1,480 | 652 | 1,790 |
| කෙටි කාලීන | 614 | 1,480 | 652 | 1,790 |
| **අනෙකුත් ගිණුම් ලැබිය යුතු/ගෙවිය යුතු** | **1,615** | **533** | **1,584** | **594** |
| මහ බැංකුව (උ) | | 533 | | 594 |
| කෙටි කාලීන | | 533 | | 594 |
| තැන්පතු භාරගන්නා ආයතන | 1,615 | | 1,584 | |
| කෙටි කාලීන | 1,615 | | 1,584 | |
| **විශේෂ ගැනුම් හිමිකම්** | | **532** | | **563** |
| **සංචිත වත්කම්** | **6,019** | | **7,959** | |
| මූල්‍ය රත්‍රන් | 830 | | 928 | |
| විශේෂ ගැනුම් හිමිකම් | 2 | | 4 | |
| ජා.මූ.අරමුදලේ සංචිත මට්ටම | 64 | | 68 | |
| අනෙකුත් සංචිත වත්කම් | 5,122 | | 6,958 | |
| මුදල් සහ තැන්පතු | 2,644 | | 3,037 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 802 | | 1,660 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | 1,842 | | 1,377 | |
| සුරැකුම්පත් | 2,478 | | 3,921 | |
| ණය සුරැකුම්පත් | 2,478 | | 3,921 | |
| **මුළු වත්කම්/වගකීම්** | **10,266** | **54,857** | **12,366** | **60,721** |
| **ශුද්ධ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය** | | **-44,591** | | **-48,355** |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| පරිණත කාලය අනුව ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය | 10,266 | 54,857 | 12,366 | 60,721 |
| කෙටි කාලීන | 6,395 | 8,763 | 6,925 | 9,184 |
| දිගු කාලීන | 3,871 | 46,095 | 5,441 | 51,537 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ, කොළඹ කොටස් හුවමාරුවේ සහ අනෙකුත් පෞද්ගලික සමාගම්වල පැවති සෘජු ආයෝජනද ඇතුළත් වේ.
(ඈ) විදේශ විනිමය ණය එකතුව වෙළඳපොළ වටිනාකම මත පදනම් වන අතර දේශීය විනිමය ණය නිකුතුව පොත් අගය මත පදනම් වේ.
(ඉ) රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබාගත් ව්‍යාපෘති ණය සම්බන්ධයෙන් වූ නොපියවා ඉතිරිව ඇති ණය ඇතුළත් වේ.
(ඊ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික සමාගම්වල නොපියවූ වෙළඳ ණය ඇතුළත් වේ.
(උ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය

මිලියන 9,845 සිට 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 11,070 ක් දක්වා ඉහළ ගියේය. 2016 වසරේදී කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම්වල ගනුදෙනු වන හිමිකම් කොටස්වල වාර්තා වූ සැලකිය යුතු තක්සේරු අලාභ සමඟ සැසඳීමේදී 2017 වසරේදී සෘජු ආයෝජන හිමිකම් කොටස්වල තක්සේරු අලාභ මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. 2017 වසර අවසානයේදී පැවති සෘජු ආයෝජන වගකීම් තත්ත්වයෙහි, සෘජු ආයෝජනයන් සිදු කළ ආසන්නතම රට අනුව සැලකූ විට, ප්‍රධාන රටවල් පහ වූයේ නෙදර්ලන්තය, ඉන්දියාව, චීනය, මැලේසියාව සහ සිංගප්පූරුවයි. මේ අතර, ශ්‍රී ලාංකික නේවාසිකයන්ගේ විදේශීය සෘජු ආයෝජන වත්කම් තත්ත්වය 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,278 ක් වූ අතර, එය පෙර වසර අවසානයේ පැවති තත්ත්වය සමඟ සැසඳීමේදී සියයට 4.8 ක ඉහළ යෑමකි.

### 5.9.2 විවිධ ආයෝජන තත්ත්වය

**එකොළොස්වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය නිකුත් කිරීමෙන් වූ ලැබීම් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති විදේශීය ආයෝජන තත්ත්වය ඉහළ යෑම හේතුවෙන් 2017 වසර අවසානය වන විට විවිධ ආයෝජන වගකීම් තත්ත්වය ඉහළ ගිය අතර බැංකු අංශයේ නොපියවා ඉතිරිව ඇති ණය සුරැකුම්පත් තත්ත්වය පහළ ගියේය.** ඒ අනුව, විවිධ ආයෝජන වගකීම් තත්ත්වය 2016 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 13,684 සිට 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 15,578 ක් දක්වා ඉහළ ගියේය. කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ විදේශීය ආයෝජන ලැබීම් වැඩි වීම හමුවේ වුවද, සැලකිය යුතු තක්සේරු අලාභ වාර්තා වීම හේතුවෙන් වසර අවසානය වන විට විවිධ ආයෝජන හිමිකම් වගකීම් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 1,491 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. මේ අතර, ලංකා බැංකුව එ.ජ. ඩොලර් මිලියන 500 ක ජාත්‍යන්තර බැඳුම්කරයක් පියවීම හේතුවෙන් තැන්පතු භාර ගන්නා ආයතනවල ණය සුරැකුම්පත් වගකීම් තත්ත්වය අඩු වුව ද, ප්‍රධාන වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 1,500 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් වූ ලැබීම් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති විදේශීය ආයෝජන තත්ත්වය ඉහළ යෑම හේතුවෙන් ණය සුරැකුම්පත් වගකීම් තත්ත්වය 2017 වසරේදී ඉහළ ගියේය. 2017 වසර අවසානය වන විට වෙළඳපොළ වටිනාකම් ඉහළ යෑම හේතුවෙන් මුහුණත වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 9,650

5

සමඟ සැසඳීමේදී නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 10,347 ක් විය.

### 5.9.3 අනෙකුත් ආයෝජන තත්ත්වය

#### මුදල් සහ තැන්පතු

**2017 වසර අවසානය වන විට මුදල් සහ තැන්පතු වත්කම් තත්ත්වය ඉහළ ගිය අතර, වගකීම් තත්ත්වය අඩු විය.** ප්‍රධාන වශයෙන් ඉන්දියානු සංචිත බැංකුව සමඟ ඇති කරගත් එ.ජ. ඩොලර් මිලියන 400 ක විදේශ විනිමය හුවමාරු ගිවිසුම 2017 වසරේ මාර්තු මාසයේදී පියවීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් සහ තැන්පතු වගකීම් තත්ත්වය පහළ ගියේය. 2017 වසර අවසානය වන විට තැන්පතු භාර ගන්නා ආයතනවල මුදල් සහ තැන්පතු වගකීම් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 2,212 ක් දක්වා ඉහළ ගිය අතර, 2017 වසරේදී බැංකු අංශයේ මුළු වත්කම් තත්ත්වයෙහි මධ්‍යස්ථ ඉහළ යෑමට අනුරූපව තැන්පතු භාර ගන්නා ආයතනවල වත්කම් තත්ත්වයද එ.ජ. ඩොලර් මිලියන 784 ක් දක්වා ඉහළ ගියේය.

#### විදේශීය ණය

**ප්‍රධාන වශයෙන් රජයේ, තැන්පතු භාර ගන්නා ආයතනවල සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය ණය වගකීම් තත්ත්වය වැඩි වීම හේතුවෙන් 2017 වසර අවසානය වන විට අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි විදේශීය ණය වගකීම් තත්ත්වය ඉහළ ගියේය.** ඒ අනුව, විදේශීය ණය වගකීම් තත්ත්වය 2016 වසර අවසානයේදී පැවති එ.ජ. ඩොලර් මිලියන 26,342 සිට 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 28,912 ක් දක්වා ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් රජය ලබා ගත් නව ව්‍යාපෘති ණය සහ එ.ජ. ඩොලර් බිලියන 1 ක් වූ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමේ වාරික දෙකෙහි ලැබීම් හේතුවෙන් රජයේ විදේශීය ණය තත්ත්වය 2016 වසර අවසානයේදී පැවති එ.ජ. ඩොලර් මිලියන 17,295 සිට 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 19,201 ක් දක්වා ඉහළ ගියේය. නොපියවා ඉතිරිව ඇති සමස්ත විදේශීය ණය තත්ත්වයෙන් සියයට 38 ක් පමණ වන එ.ජ. ඩොලර්වලින් හැර අනෙකුත් විදේශ විනිමයවලින් නාමනය කරන ලද නොපියවා ඉතිරිව ඇති රජයේ ණය, 2017 වසරේදී එ.ජ. ඩොලරය, වෙනත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් එ.ජ. ඩොලර්වලින් සැලකීමේදී ඉහළ ගියේය. තැන්පතු භාර ගන්නා ආයතනවල සහ පෞද්ගලික අංශයෙහි නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වයද වසර තුළ දී ඉහළ ගියේය. තවද, 2017 වසරේදී ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි තුන්වන සහ හතරවන වාරිකවලින් වූ ලැබීම් හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය වගකීම් තත්ත්වයෙහි ඉහළ යෑමක් වාර්තා වූ අතර, 2017 වසරේදී ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකම පියවන ලදී.

#### වෙළඳ ණය සහ අත්තිකාරම්

**2017 වසරේදී නොපියවා ඉතිරිව ඇති ලබා ගත් වෙළඳ ණය සහ අත්තිකාරම් වගකීම් තත්ත්වය මෙන්ම ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම් වත්කම් තත්ත්වය ඉහළ ගියේය.** ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඉහළ යෑම හේතුවෙන් පෞද්ගලික අංශයේ වෙළඳ ණය සහ අත්තිකාරම් වගකීම් තත්ත්වය 2016 වසර අවසානයේදී පැවති එ.ජ. ඩොලර් මිලියන 1,480 සිට 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,790 ක් දක්වා වැඩි විය. තැන්පතු භාර ගන්නා ආයතන සහ පෞද්ගලික අංශය ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්වලින් සමන්විත වෙළඳ ණය සහ අත්තිකාරම් වත්කම් තත්ත්වය 2016 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 707 සිට 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 761 ක් දක්වා ඉහළ ගියේය.

#### අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම් සහ විශේෂ ගැනුම් හිමිකම්

**2017 වසරේදී නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ලැබිය යුතු ගිණුම් තත්ත්වය පහළ ගිය අතර, අනෙකුත් ගෙවිය යුතු ගිණුම් තත්ත්වය ඉහළ ගියේය.** තැන්පතු භාර ගන්නා ආයතනවල කෙටිකාලීන ශේෂයන්ගෙන් සමන්විත වන නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ලැබිය යුතු ගිණුම් තත්ත්වය 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,584 ක් දක්වා අඩු විය. මේ අතර, ආසියානු නිෂ්කාශන සංගමය වෙතැති වගකීම්වලින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ගෙවිය යුතු ගිණුම් තත්ත්වය 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 594 ක් දක්වා ඉහළ ගියේය. තවද, නොපියවා ඉතිරිව ඇති විශේෂ ගැනුම් හිමිකම් තත්ත්වය 2016 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 532 සිට 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 563 ක් දක්වා ඉහළ ගියේය.

**5.12 සංඛ්‍යා සටහන**

**දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය**

*(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)*

| | එ.ජ. ඩොලර් මිලියන | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2017 (අ) |
| 1. රජයේ විදේශීය වත්කම් | 465 | 635 | 470 | 289 | 488 |
| 2. මහ බැංකුවේ විදේශීය වත්කම් | 7,030 | 7,573 | 6,834 | 5,730 | 7,470 |
| 3. දළ නිල සංචිත වත්කම් (1+2) | 7,495 | 8,208 | 7,304 | 6,019 | 7,959 |
| 4. තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය වත්කම් | 1,078 | 1,676 | 2,033 | 2,414 | 2,478 |
| 5. මුළු විදේශීය වත්කම් (3+4) (ආ) | 8,573 | 9,884 | 9,337 | 8,433 | 10,436 |
| 6. සංචිතවලට අදාළ වගකීම් (ඇ) | 2,347 | 1,691 | 2,275 | 1,490 | 1,361 |
| 7. ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6) | 5,148 | 6,517 | 5,029 | 4,529 | 6,597 |
| 8. සමස්ත ශේෂය (ඈ) | 985 | 1,369 | -1,489 | -500 | 2,068 |
| 9. දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | |
| 9.1 වෙළඳ භාණ්ඩ | 5.0 | 5.1 | 4.6 | 3.8 | 4.6 |
| 9.2 වෙළඳ භාණ්ඩ හා සේවා | 4.2 | 4.3 | 3.8 | 3.1 | 3.8 |
| 10. මුළු විදේශීය වත්කම් මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | |
| 10.1 වෙළඳ භාණ්ඩ | 5.7 | 6.1 | 5.9 | 5.3 | 6.0 |
| 10.2 වෙළඳ භාණ්ඩ හා සේවා | 4.8 | 5.1 | 4.9 | 4.3 | 4.9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 'විදේශයන්හි සිදුකරන ලද සෘජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.
(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)
(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස් වීම්


5

## 5.9.4 විදේශීය සංචිත වත්කම් තත්ත්වය

**ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත වත්කම් තත්ත්වය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වර්ධනයක් පිළිබිඹු කරමින් 2016 වසර අවසානයේදී පැවති එ.ජ. ඩොලර් බිලියන 6.0 සිට 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 8.0 ක් දක්වා ඉහළ ගියේය.** දළ නිල සංචිත වත්කම් තත්ත්වය ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය අවශෝෂණය කිරීම හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් වූ ලැබීම්, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමෙන් වූ ලැබීම්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි ලැබීම් සහ සීමාසහිත චයිනා මර්චන්ට් පෝ(ර්)ට් හෝල්ඩින්ග්ස් සමාගම (China Merchant Port Holding Company Ltd.) වෙත හම්බන්තොට වරාය මෙහෙයුම් කටයුතු පැවරීමේදී ලැබුණු පළමු ආයෝජන වාරිකයද යන අනෙකුත් විදේශ විනිමය ලැබීම්ද ආයක විය. 2017 වසර අවසානයේ පැවති දළ නිල සංචිත ප්‍රමාණය භාණ්ඩ ආනයනික මාස 4.6 කට සමාන විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 1,664 ක ශුද්ධ විදේශ විනිමය අවශෝෂණය කිරීමෙන් ණය නොවන සංචිත ප්‍රමාණයෙහි වර්ධනයක් වාර්තා වීම සහ දේශීය බැංකු සමඟ පවත්වාගෙන ගිය විදේශ විනිමය හුවමාරු ගිවිසුම්වලින් එ.ජ. ඩොලර් බිලියන 1 ක් පමණ පියවීම හේතුවෙන් වසර තුළ දී විදේශීය සංචිතවල ගුණාත්මක වර්ධනයක් ඇති විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය අවශෝෂණය කර ගැනීමෙන් දළ නිල සංචිත ඉහළ නැංවීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවට ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ශුද්ධ විදේශීය සංචිත ඉලක්ක සපුරා ගැනීමට හැකි විය. විදේශ විනිමය සංචිත තත්ත්වයෙහි ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනය පිළිබිඹු කරමින්, 2017 වසර අවසානය වන විට, විදේශීය සංචිත ප්‍රමාණය කෙටිකාලීන ණය සහ වගකීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 63.3 ක් විය. මේ අතර, දළ නිල සංචිත වත්කම් සහ තැන්පතු භාර ගන්නා ආයතනවල විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් තත්ත්වයද 2016 වසර අවසානයේදී එ.ජ. ඩොලර් බිලියන 8.4 සිට 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 10.4 ක් දක්වා ඉහළ ගිය අතර එය භාණ්ඩ ආනයනික මාස 6.0 කට සමාන විය. මෙම සැලකිය යුතු ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ දළ නිල සංචිත තත්ත්වය ඉහළ යෑම වූ

**5.12 රූප සටහන**

**කාර්තුමය දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

අතර, බැංකු අංශයේ විදේශීය වත්කම් තත්ත්වය 2016 වසර සමඟ සැසඳීමේදී 2017 වසරේදී සමාන මට්ටමක පැවතුණි.


## 5.10 විදේශීය ණය සහ ණය සේවාකරණය

### 5.10.1 විදේශීය ණය

**ප්‍රධාන වශයෙන් රජයේ විදේශීය ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් 2017 වසර තුළ දී රටෙහි මුළු විදේශීය ණය ප්‍රමාණය ඉහළ ගියේය.** 2017 වසර අවසන් වන විට රටෙහි මුළු විදේශීය ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 51,824 දක්වා ඉහළ ගිය අතර, එය පෙර වසර සමඟ සැසඳීමේදී බිලියන 5.4 ක ඉහළ යෑමකි. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් ලබා ගැනීම හා වැඩසටහන් සහ ව්‍යාපෘති ණය තුළින් එ.ජ. ඩොලර් බිලියන 4.0 ක ණය ප්‍රමාණයක් රජය විසින් 2017 වසර තුළ දී ලබා ගෙන ඇත. රජයේ විදේශීය ණය තත්ත්වය ඉහළ යෑම සඳහා රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළට වූ ශුද්ධ ලැබීම්ද තවදුරටත් දායක විය. වසර තුළ දී ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ඩොලර් මිලියන 419 ක ලැබීම් හමුවේ වුවද, ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකම සම්පූර්ණයෙන් පියවමින් එ.ජ. ඩොලර් මිලියන 235 ක් ගෙවීම සහ ඉන්දියානු සංචිත බැංකුව සමඟ වූ එ.ජ. ඩොලර් මිලියන 400 ක විදේශ විනිමය හුවමාරු ගිවිසුම පියවීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය 2016 වසර අවසානයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,022 සිට 2017 වසර අවසානය වනවිට එ.ජ. ඩොලර් මිලියන 1,924 ක් දක්වා අඩු විය. තැන්පතු භාර ගන්නා ආයතනයන්හි

5.13 රූප සටහන

විදේශීය ණය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.13 සංඛ්‍යා සටහන

නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

එ.ජ. ඩොලර් මිලියන
*(වසර අවසානයේදී තත්ත්වය)*

| ශීර්ෂය | 2016 (අ) | 2017 (ආ) |
|---|---|---|
| **රජය** | **27,197** | **31,444** |
| **කෙටි කාලීන** | **80** | **167** |
| ණය සුරැකුම්පත් | 80 | 167 |
| භාණ්ඩාගාර බිල්පත් (ඇ) | 80 | 167 |
| **දිගු කාලීන** | **27,118** | **31,277** |
| ණය සුරැකුම්පත් | 9,823 | 12,077 |
| භාණ්ඩාගාර බැඳුම්කර (ඇ) | 1,440 | 1,700 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඈ) | 58 | 31 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඉ) | 8,325 | 10,347 |
| ණය | 17,295 | 19,201 |
| **මහ බැංකුව** | **2,022** | **1,924** |
| **කෙටි කාලීන** | **536** | **596** |
| මුදල් සහ තැන්පතු | 3 | 1 |
| අනෙකුත් ගිණුම් ගෙවිය යුතු | 533 | 594 |
| ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් | 533 | 594 |
| **දිගු කාලීන** | **1,486** | **1,329** |
| විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම් | 532 | 563 |
| මුදල් සහ තැන්පතු | 400 | - |
| ණය | 554 | 765 |
| ජා.මූ. අරමුදලේ ණය | 554 | 765 |
| සමීපස්ථ ණය පහසුකම | 232 | - |
| විස්තීර්ණ ණය පහසුකම | 322 | 765 |
| **තැන්පතු භාරගන්නා ආයතන** | **8,790** | **8,711** |
| **කෙටි කාලීන** | **5,247** | **5,140** |
| මුදල් සහ තැන්පතු (ඊ) | 2,039 | 2,212 |
| වාණිජ බැංකු | 2,039 | 2,212 |
| ණය | 3,209 | 2,929 |
| වාණිජ බැංකු | 3,209 | 2,929 |
| **දිගු කාලීන** | **3,543** | **3,571** |
| ණය සුරැකුම්පත් (ඉ) | 2,190 | 1,666 |
| වාණිජ බැංකු | 1,128 | 613 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 1,062 | 1,053 |
| ණය | 1,354 | 1,904 |
| වාණිජ බැංකු | 1,339 | 1,886 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 14 | 19 |
| **අනෙකුත් අංශ (උ)** | **5,584** | **6,080** |
| **කෙටි කාලීන** | **1,480** | **1,790** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (ඌ) | 1,480 | 1,790 |
| **දිගු කාලීන** | **4,104** | **4,290** |
| ණය සුරැකුම්පත් (ඉ) | 172 | 177 |
| ණය | 3,931 | 4,114 |
| පෞද්ගලික අංශය | 1,689 | 1,871 |
| රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය සංස්ථා | 2,242 | 2,243 |
| **සෘජු ආයෝජන : අන්තර් සමාගම් ණය (එ)** | **2,825** | **3,664** |
| **දළ විදේශීය ණය තත්ත්වය** | **46,418** | **51,824** |
| **ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන්** | | |
| දළ විදේශීය ණය | 56.8 | 59.5 |
| කෙටි කාලීන ණය | 9.0 | 8.8 |
| දිගු කාලීන ණය | 47.8 | 50.6 |
| **දළ විදේශීය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන්** | | |
| කෙටි කාලීන ණය | 15.8 | 14.8 |
| දිගු කාලීන ණය | 84.2 | 85.2 |
| **විශේෂිත අයිතමයන්** | | |
| **ණය සුරැකුම්පත්හි මුහුණත වටිනාකම - ආංශික වර්ගීකරණය** | **12,219** | **13,566** |
| රජය | 9,944 | 11,791 |
| භාණ්ඩාගාර බිල්පත් | 86 | 180 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 1,650 | 1,930 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 58 | 31 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 8,150 | 9,650 |
| මහ බැංකුව හැර තැන්පතු භාරගන්නා ආයතන | 2,100 | 1,600 |
| වාණිජ බැංකු | 1,100 | 600 |
| ලියාපදිංචි විශේෂිත බැංකු | 1,000 | 1,000 |
| අනෙකුත් අංශ | 175 | 175 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පොත් අගය මත පදනම්ව
(ඈ) මුහුණත වටිනාකම මත පදනම්ව
(ඉ) වෙළඳපොළ මිල මත පදනම්ව
(ඊ) අනේවාසික විදේශ මුදල් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(උ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඌ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(එ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5

නොපියවා ඉතිරිව ඇති විදේශීය ණයද එ.ජ. ඩොලර් මිලියන 8,711 ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 79 කින් අඩු වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ වාණිජ බැංකු සතු ණය සුරැකුම්පත් තත්ත්වය පහළ යෑමයි. තවද, 2017 වසර තුළ දී පෞද්ගලික අංශයේ සමාගම්, රජය සතු වාණිජ ව්‍යවසායන් සහ සෘජු ආයෝජන සමාගම්හි අන්තර් සමාගම් ණය යනාදියෙහි නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**රජයේ විදේශීය ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් 2016 වසර අවසානයේදී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 56.8 ක් වූ නොපියවා ඉතිරිව ඇති රටෙහි විදේශීය ණය ප්‍රමාණය 2017 වසර අවසානයේදී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 59.5 ක් දක්වා වැඩි විය.** කෙසේ වෙතත්, හිතකර වෙනසක් පිළිබිඹු කරමින් සමස්ත විදේශීය ණයවලින් දිගුකාලීන ණය කොටස, 2016 අගදී පැවති සියයට 84.2 ට සාපේක්ෂව 2017 වසර අගදී සියයට 85.2 ක් දක්වා සුළු වශයෙන් වැඩි වූ අතර, දිගු කාලීන කල්පිරීම් සහිත ණය ලැබීම් කෙරෙහි වැඩි වශයෙන් යොමු වීම පිළිබිඹු කරමින් මෙයට සමගාමීව විදේශීය ණයවලින් කෙටි කාලීන ණය කොටසෙහි අඩු වීමක් දක්නට ලැබුණි. රජයේ විදේශීය ණය ප්‍රමාණය ඉහළ යෑමට අනුකූලව, 2016 වසර අවසානයේදී මුළු විදේශීය ණය

**5.14 සංඛ්‍යා සටහන**

**විදේශීය ණය සේවාකරණ ගෙවීම්**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් මිලියන | | | | | රුපියල් මිලියන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
| **1. ණය සේවාකරණ ගෙවීම්** | **4,044** | **3,635** | **4,772** | **4,461** | **4,560** | **522,155** | **474,527** | **648,541** | **648,315** | **694,127** |
| **1.1 ණය ආපසු ගෙවීම්** | **2,985** | **2,479** | **3,580** | **3,243** | **3,156** | **385,362** | **323,626** | **487,275** | **472,270** | **481,028** |
| රජය | 1,555 | 1,296 | 1,976 | 1,040 | 1,354 | 200,705 | 169,150 | 265,662 | 151,236 | 206,531 |
| ව්‍යාපෘති ණය | 836 | 793 | 798 | 876 | 1,320 | 107,906 | 103,540 | 107,536 | 127,396 | 201,430 |
| ණය සුරැකුම්පත් | 719 | 503 | 1,178 | 164 | 34 | 92,799 | 65,610 | 158,126 | 23,840 | 5,101 |
| මහ බැංකුව | 653 | 719 | 907 | 1,555 | 635 | 84,285 | 93,917 | 125,686 | 226,118 | 96,584 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 453 | 719 | 507 | 455 | 235 | 58,463 | 93,917 | 68,775 | 65,956 | 35,601 |
| විනිමය හුවමාරු ගිවිසුම් සහ වෙනත් ණය වගකීම් | 200 | - | 400 | 1,100 | 400 | 25,822 | - | 56,911 | 160,162 | 60,983 |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන | 777 | 464 | 698 | 648 | 1,167 | 100,372 | 60,559 | 95,928 | 94,916 | 177,913 |
| විදේශීය ණය | 774 | 309 | 553 | 559 | 548 | 99,952 | 40,280 | 76,199 | 81,944 | 83,520 |
| ණය සුරැකුම්පත් | - | - | - | - | 500 | - | - | - | - | 76,169 |
| සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය | 3 | 155 | 145 | 88 | 119 | 420 | 20,279 | 19,729 | 12,972 | 18,225 |
| **1.2 පොලී ගෙවීම්** | **1,060** | **1,156** | **1,192** | **1,219** | **1,405** | **136,793** | **150,901** | **161,266** | **176,045** | **213,099** |
| රජය | 832 | 876 | 870 | 862 | 1,064 | 107,357 | 114,368 | 117,496 | 124,042 | 161,898 |
| ව්‍යාපෘති ණය | 255 | 260 | 266 | 264 | 334 | 32,982 | 33,883 | 36,024 | 38,440 | 50,832 |
| ණය සුරැකුම්පත් | 576 | 616 | 604 | 597 | 731 | 74,376 | 80,485 | 81,472 | 85,602 | 111,065 |
| මහ බැංකුව | 35 | 20 | 13 | 10 | 16 | 4,507 | 2,546 | 1,693 | 1,436 | 2,378 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 33 | 20 | 10 | 8 | 12 | 4,313 | 2,546 | 1,395 | 1,179 | 1,897 |
| විනිමය හුවමාරු ගිවිසුම් සහ වෙනත් ණය වගකීම් | 2 | - | 2 | 2 | 3 | 194 | - | 298 | 257 | 482 |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන | 193 | 260 | 309 | 347 | 325 | 24,929 | 33,986 | 42,077 | 50,567 | 48,823 |
| විදේශීය ණය | 145 | 118 | 148 | 179 | 174 | 18,663 | 15,470 | 20,128 | 26,121 | 26,466 |
| ණය සුරැකුම්පත් | 48 | 142 | 159 | 159 | 142 | 6,157 | 18,517 | 21,779 | 23,186 | 20,948 |
| සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය | 1 | - | 1 | 9 | 9 | 109 | - | 170 | 1,260 | 1,409 |
| **2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්** | **15,079** | **16,735** | **16,943** | **17,448** | **19,120** | | | | | |
| **3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම** | **21,639** | **23,936** | **24,078** | **24,835** | **26,455** | | | | | |
| **4. ණය සේවාකරණ අනුපාතිකය** | | | | | | | | | | |
| 4.1 ඉහත 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 26.8 | 21.7 | 28.2 | 25.6 | 23.9 | | | | | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 23.6 | 17.3 | 25.1 | 22.9 | 22.6 | | | | | |
| 4.2 ඉහත 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 18.7 | 15.2 | 19.8 | 18.0 | 17.2 | | | | | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 16.4 | 12.1 | 17.7 | 16.1 | 16.3 | | | | | |
| **5. රජයේ ණය සේවාකරණ ගෙවීම්** | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඇ) | 2,386 | 2,172 | 2,846 | 1,901 | 2,418 | | | | | |
| 5.2 ඉහත 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 59.0 | 59.7 | 59.6 | 42.6 | 53.0 | | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගනුදෙනු හැර

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5

ප්‍රමාණයෙන් සියයට 58.6 ක් වූ රජයේ නොපියවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය 2017 වසර අවසානයේදී සියයට 60.7 ක් දක්වා ඉහළ ගියේය.

### 5.10.2 විදේශීය ණය සේවාකරණ ගෙවීම්

**2017 වසරේදී ණය වාරික සහ පොලී ගෙවීම් ඇතුළත් ණය සේවාකරණ ගෙවීම් තවදුරටත් ඉහළ ගියේය.** 2016 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 3,243 ක් වූ ණය වාරික ගෙවීම් 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 3,156 ක් දක්වා පහළ ගිය අතර එයින් එ.ජ. ඩොලර් මිලියන 1,354 ක් රජයේ ණය වාරික ගෙවීම් විය. වසර තුළ දී රජය විසින් සිදු කළ ණය ආපසු ගෙවීම් ඉහළ යෑම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට අදාළව එ.ජ. ඩොලර් මිලියන 1,320 ක දිගු කාලීන ණය ආපසු ගෙවීම් හේතු විය. කෙසේ වුවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය ණය වාරික ගෙවීම් 2016 දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,555 ට සාපේක්ෂව 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 635 ක් දක්වා අඩු විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කළ ණය ගෙවීම් තුළ ඉන්දියානු සංචිත බැංකුව සමග වූ විදේශ විනිමය හුවමාරු ගිවිසුම පියවීම සහ ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකමට අදාළ ණය වාරික ගෙවීම ඇතුළත් වේ. මීට ප්‍රතිවිරුද්ධව, පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන ලබා ගත් ණය ආපසු ගෙවීම් ඉහළ ගිය අතර, ඒ සඳහා ලංකා බැංකුව විසින් එ.ජ. ඩොලර් මිලියන 500 ක් වටිනා ජාත්‍යන්තර බැඳුම්කරයක් පියවීම හේතු විය. ණය මත වූ පොලී ගෙවීම් 2016 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,219 සිට 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 1,405 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන විසින් සිදු කරන ලද පොලී ගෙවීම් අඩු වීම අභිබවා රජය විසින් සිය ණය වගකීම් මත සිදු කරන ලද පොලී ගෙවීම් ඉහළ ගියේය. ණය සේවාකරණ ගෙවීම් වැඩි වීම, වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ආදායමෙහි වැඩිවීමට වඩා අඩු වූ බැවින් වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ආදායමෙහි ප්‍රතිශතයක් වශයෙන් ගත් විට සමස්ත විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2016 වසරේදී වාර්තා වූ සියයට 25.6 සිට 2017 වසරේදී සියයට 23.9 ක් දක්වා පහළ ගියේය. තවද, රාජ්‍ය ණය, මුළු විදේශීය ණයවලින් විශාල කොටසක් නිරූපනය කරන බැවින් 2017 වසරේ මුළු ණය සේවාකරණ ගෙවීම්වලින් සියයට 53.0 ක් රාජ්‍ය අංශයේ ණය සේවාකරණ ගෙවීම් විය.

**2019-2023 කාලපරිච්ඡේදය තුළ, විශේෂයෙන්ම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල්පිරීම නිසා, විදේශීය අංශයේ වගකීම් කල්පිරීම් ඒකරාශී වීම (Bunching of maturities) කෙටි හා මැදි කාලීනව විදේශීය අංශය මුහුණ දෙන ගැටලුවකි.** 2018 වසරේදී නීතිගත කළ සක්‍රීය වගකීම් කළමනාකරණ පනත විචක්ෂණශීලී ණය කළමනාකරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව සපයයි. මෙම පනත ණය වගකීම් කල්පිරීම් ඒකරාශී වීමේ ගැටලුවද ඇතුළුව රාජ්‍ය ණය කළමනාකරණයේ දැනට පවත්නා ගැටලු සඳහා විසඳුමක් ලෙස ගනු ලැබූ ප්‍රධානතම ක්‍රියාමාර්ගයක් වේ. රටෙහි නොපියවා ඇති විදේශීය ණය ප්‍රමාණයෙහි වැඩි වීම තුළින් පොලී ගෙවීම් ඉහළ ගොස් එමගින් විදේශීය ජංගම ගිණුම මතද බලපෑමක් ඇති විය හැකිය. එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව විසින් මෑත කාලයේදී නිවේදනය කරන ලද පරිදි පොලී අනුපාත ඉහළ දැමීම සමග අනෙකුත් ප්‍රධාන මහ බැංකු විසින් පොලී අනුපාත ඉහළ දමනු ඇතැයි යන අපේක්ෂාවන් මත ජාත්‍යන්තර පොලී අනුපාත වැඩි වෙමින් පවතී. පොලී අනුපාත ඉහළ යෑම සමග විදේශීය ණය සේවාකරණ ගෙවීම් ඉහළ යෑ හැකි බැවින් විදේශීය අංශය මත බලපෑමක් ඇති විය හැකිය.

## 5.11 විනිමය අනුපාතිකයේ හැසිරීම

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වසර තුළ දී ක්‍රියාවට නැංවූ වෙළඳපොළ මත වඩාත් පදනම් වූ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකා රුපියලේ විදේශීය අගය 2017 වසරේදී සාපේක්ෂව ස්ථාවරව පැවතුණු අතර, විදේශ විනිමය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීම විදේශීය සංචිත ගොඩනැගීමේ අරමුණින් පමණක් සිදු කෙරිණි.** ආනයන වියදම්, ණය සේවාකරණ ගෙවීම් සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම හේතුවෙන් අඛණ්ඩව විදේශ විනිමය රටින් පිටතට ඇදී යෑම 2017 වසරේ පළමු මාස දෙක තුළ දී රුපියල අවප්‍රමාණය වීම කෙරෙහි සැලකිය යුතු පීඩනයක් ඇති කළ අතර, රුපියලේ බාහිර අගය ආරක්ෂා කිරීම සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු විය. කෙසේ වෙතත්, 2017 මාර්තු මාසයේ සිට එම තත්ත්වය වෙනස් වී කොළඹ කොටස් වෙළඳපොළ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන ඉහළ යෑම සහ අපනයන ආදායම් වැඩි වීම හේතුවෙන් එතැන් සිට වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත විදේශ විනිමය ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට අවකාශ සැලසුණි. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම මගින් වූ ලැබීම් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් වූ ලැබීම් හේතුවෙන් ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ යෑමත්

5

### 5.15 සංඛ්‍යා සටහන
### විනිමය අනුපාතික වෙනස්වීම්

| මුදල් වර්ගය | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍යය අනුපාතිකය | | | වර්ෂය අග | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2015 | 2016 | 2017 | 2015 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 |
| යුරෝ | 157.37 | 157.87 | 182.49 | 150.84 | 161.16 | 171.73 | -0.32 | -13.49 | -6.40 | -6.16 |
| ඉන්දියානු රුපියල් | 2.17 | 2.21 | 2.39 | 2.12 | 2.17 | 2.34 | -1.72 | -7.54 | -2.25 | -7.48 |
| ජපන් යෙන් | 1.20 | 1.29 | 1.36 | 1.12 | 1.34 | 1.36 | -7.05 | -5.10 | -16.48 | -1.12 |
| බ්‍රිතාන්‍ය පවුම් | 213.57 | 184.04 | 205.54 | 207.99 | 197.15 | 196.47 | 16.04 | -10.46 | 5.50 | 0.35 |
| එක්සත් ජනපද ඩොලර් | 144.06 | 149.80 | 152.85 | 135.94 | 145.60 | 152.46 | -3.83 | -2.00 | -6.64 | -4.50 |
| විශේෂ ගැනුම් හිමිකම් | 199.63 | 201.38 | 217.69 | 190.16 | 202.39 | 211.49 | -0.87 | -7.49 | -6.04 | -4.31 |
| සඵල විනිමය අනුපාතික දර්ශක (ආ) (ඇ) (2010 = 100) | වර්ෂය අග දර්ශකය | | | වාර්ෂික සාමාන්‍යය දර්ශකය | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම | | | |
| | | | | | | | වර්ෂය අග දර්ශකය | | වාර්ෂික සාමාන්‍යය දර්ශකය | |
| | 2015 | 2016 | 2017 | 2015 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 |
| නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 93.53 | 92.64 | 85.46 | 96.61 | 92.46 | 88.07 | -0.95 | -7.75 | -4.29 | -4.75 |
| මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 107.28 | 110.18 | 104.83 | 109.50 | 106.94 | 106.10 | 2.70 | -4.85 | -2.34 | -0.78 |

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට එරෙහිව අඩු වීම පෙන්නුම් කරයි.

(ආ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරගකාරී රටවල් 24 ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමඟ සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. සෘණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ඇ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය වැඩිවීම හෝ අඩුවීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළයාම හෝ පහළයාම මගින් පිළිවෙළින් පිළිබිඹු කෙරෙයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව



සමඟ රුපියල මත පැවති අවප්‍රමාණය වීම සඳහා වූ පීඩනය මැයි මාසයේ සිට තවදුරටත් ක්‍රමයෙන් අඩු විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය ද්‍රවශීලතාවය සැලකිය යුතු ලෙස අවශෝෂණය කිරීම මධ්‍යයේ වුවද, රුපියල යම් කාලසීමාවක් තුළ අතිප්‍රමාණය වීම සඳහාත්, 2017 වසරේ මාර්තු සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලරය සහ රුපියල අතර හුවමාරු අගය සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතීම සඳහාත් මෙම තත්ත්වය හේතු විය. මෙම ප්‍රවණතා හේතුවෙන්, 2017 වසරේ පළමු කාර්තුව තුළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 1.28 කින් අවප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, සමස්තයක් ලෙස 2017 වසර අවසාන වන විට 2016 වසර අවසානයේ වාර්තා වූ රුපියල් 149.80 සිට රුපියල් 152.85 දක්වා සියයට 2.00 කින් අවප්‍රමාණය විය. මීට අමතරව, එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය 2017 වසරේදී රුපියල් 152.46 දක්වා සියයට 4.50 කින් අවප්‍රමාණය විය.


ජාත්‍යන්තර වෙළඳපොළ තුළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, පෙර වසර හා සැසඳීමේදී 2017 වසර තුළ දී අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. ඒ අනුව, ශ්‍රී ලංකා රුපියල යුරෝවලට සාපේක්ෂව සියයට 13.49 කින් ද, ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 7.54 කින් ද, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 5.10 කින් සහ ස්ටර්ලින් පවුමට සාපේක්ෂව සියයට 10.46 කින්ද අවප්‍රමාණය විය. ප්‍රධාන මුදල් වර්ගයන්ට සාපේක්ෂව අවප්‍රමාණය වීමේ සංයුක්ත ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රුපියල වසර තුළ විශේෂ ගැනුම් හිමිකම්වලට සාපේක්ෂව සියයට 7.49 කින් අවප්‍රමාණය විය.

### 5.11.1 නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික

මුදල් වර්ග කිහිපයකින් සැඳුම්ලත් පැසකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම ගණනය කරන සඵල විනිමය අනුපාතික දර්ශක (2010 = 100) වසර තුළ දී අවප්‍රමාණය විය. එ.ජ. ඩොලරයට සහ මුදල් පැස තුළ වූ වෙනත් ප්‍රධාන මුදල් වර්ග කීපයකට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි වූ නාමික අවප්‍රමාණය පිළිබිඹු කරමින් නාමික සඵල විනිමය අනුපාතික දර්ශක අවප්‍රමාණය විය. 2017 වසර තුළ දී මුදල් වර්ග 5 කින්

**5.14 රූප සටහන**

**විනිමය අනුපාතිකයේ වෙනස්වීම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතිකය සියයට 8.68 කින් අවප්‍රමාණය වූ අතර, මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතිකය සියයට 7.75 කින් අවප්‍රමාණය විය. මේ අතර, නාමික විනිමය අනුපාතිකවල වෙනස් වීමට අමතරව මුදල් පැසෙහි ඇතුළත් රටවල හා ශ්‍රී ලංකාවේ උද්ධමන වෙනසද සැලකිල්ලට ගෙන ගණනය කෙරෙන, එමෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය පිළිබිඹු කරන මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකද වසර තුළ දී අවප්‍රමාණය විය. මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක, පිළිවෙළින්, සියයට 4.83 කින් හා සියයට 4.85 කින් අවප්‍රමාණය වෙමින් දර්ශකාංක 100 සීමාවට ළඟා වෙමින් පැවතුණි. මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකවල හැසිරීම ශ්‍රී ලංකා රුපියලෙහි විදේශීය තරගකාරිත්වය ඉහළ යෑමක් පිළිබිඹු කළද, උද්ධමනය සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක, දර්ශකාංක 100 සීමාවට ඉහළින් පැවතුණි.

### 5.11.2 දේශීය විදේශ විනිමය වෙළඳපොළ වර්ධනයන්

**2016 වසරේදී මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ එතැන් වෙළඳපොළ, 2017 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාවට නැංවූ වෙළඳපොළ මත වඩාත් පදනම් වූ විනිමය අනුපාතික ප්‍රතිපත්තියට ප්‍රතිචාරයක් ලෙස නැවත සක්‍රීය වූ අතර, ඉදිරි වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය සුළු වශයෙන් අඩු විය.** එතැන් වෙළඳපොළ ගනුදෙනු වැඩිවීමත් සමඟ 2017 වසරේදී වූ දේශීය විදේශ විනිමය වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2016 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 14,780 සිට එ.ජ. ඩොලර් මිලියන 16,451 දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. 2016 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 6,072 ක් වූ එතැන් වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය, 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 8,426 ක් (මුළු ගනුදෙනුවලින් සියයට 51.2) දක්වා ඉහළ ගියේය. 2017 වසරේදී වූ ඉදිරි වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2016 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 8,709 ට සාපේක්ෂව

**5.15 රූප සටහන**

**කාර්තුමය අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු පරිමාවන්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

එ.ජ. ඩොලර් මිලියන 8,025 දක්වා අඩු විය. මේ අතර, වසර තුළ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද මැදිහත්වීම් මගින් එ.ජ. ඩොලර් මිලියන 1,664 ක් වෙළඳපොළෙන් ශුද්ධ පදනම මත අවශෝෂණය කර ගැනුණි. මෙම ශුද්ධ අවශෝෂණය, එ.ජ. ඩොලර් මිලියන 2,214 ක් අවශෝෂණය කර ගැනීමකින් සහ එ.ජ. ඩොලර් මිලියන 550 ක් වෙළඳපොළට සැපයීමකින් සමන්විත විය. 2017 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද මෙම මැදිහත්වීම, පෙර වසරේ එ.ජ. ඩොලර් මිලියන 1,900 ක් වෙළඳපොළ වෙත සැපයීමෙන් සහ එ.ජ. ඩොලර් මිලියන 1,132 ක් වෙළඳපොළෙන් අවශෝෂණය කර ගැනීමෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සිදු කළ මැදිහත්වීම සමඟ සලකා බැලීමේදී සම්පූර්ණ වෙනස් තත්ත්වයක් පෙන්නුම් කළේය. 2017 වසරේදී ශුද්ධ පදනම මත ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් අවශෝෂණය කර ගැනීම සඳහා වසරේ අවසාන කාර්තු තුන තුළ ඉහළ ගිය විදේශ විනිමය ලැබීම් හේතු වූ අතර, එමගින් ශ්‍රී ලංකා මහ බැංකුවට සිය මැදිහත්වීම් විදේශ විනිමය ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගනිමින් දළ නිල සංචිත ගොඩනැගීමේ අරමුණ පමණක් ඇතිව සිදු කිරීමට අවකාශ ලැබුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද මෙම විදේශ විනිමය අවශෝෂණය කිරීම් ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වූ ජාත්‍යන්තර සංචිත ඉලක්ක සපුරා ගැනීමටද උපකාරී විය.

**2017 වසර තුළ කෙටිකාලීනව විනිමය අනුපාතිකය අවප්‍රමාණය වනු ඇතැයි යන වෙළඳපොළ අපේක්ෂාව, මාසයක් සඳහා වන ඉදිරි විනිමය ගනුදෙනු අධිමිල වෙනස් වීම සහ වාණිජ බැංකුවල ශුද්ධ අනාවරණ තත්ත්වය මගින් පිළිබිඹු විය.** ඒ අනුව, 2017 වසරේදී මාසයක් සඳහා වන ඉදිරි විනිමය ගනුදෙනු අධි මිල සාමාන්‍ය පොලී අනුපාතික අන්තරයට වඩා ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර, වසර තුළ දී සමස්තයක් ලෙස ධන අගයක පවත්වා ගනු ලැබූ වාණිජ බැංකුවල ශුද්ධ අනාවරණ තත්ත්වය මගින්ද කෙටිකාලීනව එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වනු ඇතැයි යන අපේක්ෂාව පිළිබිඹු කෙරිණි. කෙසේ වුවත්, මෑත කාලයේදී දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත වන විදේශ විනිමය ලැබීම් ඉහළ යනු ඇතැයි යන අපේක්ෂාව පිළිබිඹු කරමින්, මාස තුන සහ මාස හය සඳහා වන ඉදිරි විනිමය ගනුදෙනු අධි මිල සාමාන්‍ය පොලී අනුපාතික අන්තරයට වඩා පහළ මට්ටමක පැවතුණි.

**විශේෂ සටහන 5**

## 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ විදේශ විනිමය ගනුදෙනු තවදුරටත් ලිහිල් කිරීම

### 1. හැඳින්වීම :

1977 වසරේ දී හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ සිදු කරනු ලැබූ පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ හා සමගාමීව, දැඩි පාලනයකට යටත් ව තිබූ ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ගනුදෙනු තරමක් දුරට ලිහිල් කරන ලදී. ගත වූ කාලය මුළුල්ලේ විදේශ විනිමය ගනුදෙනු ක්‍රමිකව ලිහිල් කිරීමේ පදනම ලෙස, විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීම සමග සිදුවූ වෙළඳ ලිහිල්කරණය සැලකිය හැකිය. 1994 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම් ව්‍යවස්ථාවලියේ VIII වන වගන්තිය පිළිගැනීමෙන් පසුව, ජංගම ගනුදෙනු සඳහා විදේශ විනිමය නිදහසේ ගලා යෑමට ඉඩ සලසා දෙමින්, ජංගම ගිණුම සම්බන්ධයෙන් වූ ගනුදෙනු ලිහිල් කරන ලදී. තවද, 1977 දී සිදු කරන ලද ආර්ථික ලිහිල්කරණය මත ප්‍රාග්ධන ගනුදෙනු, විශේෂයෙන්ම ප්‍රාග්ධන ප්‍රවාහයන් ගලාඒම් සැලකිය යුතු ප්‍රමාණයකට ලිහිල් කර තිබූ අතර, රටවල් අතර සිදුකරන ආයෝජනයන්ට ඉඩ සලසා දෙමින් ප්‍රාග්ධන ප්‍රවාහයන් ගලායෑම් තරමක් දුරට ලිහිල් කර තිබුණි. කෙසේ වෙතත්, අවසර දී තිබූ සීමාවන් හෝ අරමුණු ඉක්මවා යන ඕනෑම ප්‍රතිමුඛ ප්‍රාග්ධන ගනුදෙනුවක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු විය. එහෙත් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වාගෙන යන පුද්ගලයන් හට එම ගිණුම්වල පවත්නා අරමුදල්, ප්‍රාග්ධන ගනුදෙනු ද ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිටත ඕනෑම අරමුණක් වෙනුවෙන් භාවිතා කිරීමට ද අවසර ලබාදී තිබුණි.

2017 අංක 12 දරන විදේශ විනිමය පනත ක්‍රියාත්මක කිරීමත් සමග, 2017 නොවැම්බර් 20 දින සිට (නියමිත දින) විදේශ විනිමය ගනුදෙනු සඳහා නව නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුවක් හඳුන්වා දෙන ලදී. ප්‍රාග්ධන ප්‍රවාහයන් තවදුරටත් ලිහිල් කිරීම හා විදේශ විනිමය ගනුදෙනු හා සම්බන්ධ ක්‍රියාවලීන් සරල කිරීම හරහා, දේශීය ප්‍රාග්ධන වෙළඳපොළ ගෝලීය ප්‍රාග්ධන වෙළඳපොළ සමග ඒකාබද්ධ කිරීම අරමුණු කර ගනිමින් මෙම පනත නීතිගත කරන ලදී.

### 2. 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රධාන ලක්ෂණ

### 2.1 පනතේ පරිපාලනය

ශ්‍රී ලංකා මහ බැංකුව අයත් විෂය භාර ඇමතිවරයා (ඇමතිවරයා) විසින් නිකුත් කරනු ලබන විධානයන් ප්‍රකාරව, විදේශ විනිමය ප්‍රවර්ධනය හා නියාමනය කිරීමේ වගකීම, ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ විනිමය පනත මගින් පවරා දී ඇත. විදේශ විනිමය අධ්‍යක්ෂවරයා යටතේ ක්‍රියාත්මක වන, අලුතින් ස්ථාපිත කරන ලද විදේශ විනිමය දෙපාර්තමේන්තුව හරහා විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම විධිවිධානයන්, අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ කරනු ලැබූ බලතල පවරා දීමට බොහෝ සෙයින් සමානය.

### 2.2 ඇමතිවරයාගේ බලතල

විදේශ විනිමය පනත යටතේ පහත බලතල ඇමතිවරයා සතුව පවතී.

අ. පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම පිණිස, මුදල් මණ්ඩලය වෙත විධානයන් නිකුත් කිරීම.

ආ. ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය ගනුදෙනු කිරීම සඳහා, ඕනෑම තැනැත්තෙකු හට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශේෂ අවසරයන් ලබා දියහැකි අරමුණු කවරේදැයි නිර්දේශ කිරීම.

ඇ. මුදල් මණ්ඩලයේ උපදේශකත්වය යටතේ, ප්‍රාග්ධන ගනුදෙනු වර්ගය හෝ වර්ග සඳහා නියෝග මගින් අවසර ලබාදීම.

ඈ. මුදල් මණ්ඩලයේ උපදේශකත්වය යටතේ, විදේශ විනිමය පනත අනුව පවත්වාගෙන යනු ලබන ගිණුම් සඳහා නියෝග මගින් අවසර ලබාදීම.

ඉ. විදේශ ව්‍යවහාර මුදල් / ශ්‍රී ලංකා රුපියල් අපනයනය / ආනයනය හා විදේශ ව්‍යවහාර මුදල් සන්තකයේ රඳවා තබා ගැනීම සඳහා අදාළ අරමුණු, සීමා, නියමයන් හා කොන්දේසි ආදිය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් හරහා නියම කිරීම.

ඊ. 'ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු' යනු කවරෙක්දැයි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් හරහා තීරණය කිරීම.

උ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින්,

- ප්‍රාග්ධන ගනුදෙනු හා අනෙකුත් ගනුදෙනු පිළිබඳ බලයලත් / පරිසීමිත වෙළඳුන් හට,
- අනෙකුත් තැනැත්තන් හට සහ,
- පනතේ ප්‍රතිපාදනයන් සමග අනුකූලවීමට අසමත්වීම පිළිබඳ බලයලත් / පරිසීමිත වෙළඳුන් හට

නිකුත් කිරීම පිණිස මාර්ගෝපදේශයන් හා විධානයන් අනුමත කිරීම.

ඌ. අභියාචනා සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම, ඉවත් කිරීම හා ඔවුන් වෙත කරනු ලබන ගෙවීම් තීරණය කිරීම.

5

එ. මුදල් මණ්ඩලයේ උපදෙස් හා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සමග, ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථාවරත්වයට තර්ජනයක් එල්ල විය හැකි බවට මුදල් මණ්ඩලය විසින් අමාත්‍යවරයාට උපදෙස් දෙනු ලබන අවස්ථාවක, මාස 6 කට නොවැඩි කාලයක් සඳහා ශ්‍රී ලංකාව තුළට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට විදේශ විනිමය ප්‍රේෂණය කිරීම, සීමා කිරීම හෝ නියාමනය කිරීම සහ තවත් මාස 12 ක සමාහාර කාලසීමාවක් දක්වා එය දීර්ඝ කිරීම. වර්තමානයේදී මුදල් නීති පනත මගින් මෙම බලතල මුදල් මණ්ඩලයට පවරා ඇත.

**2.3 විදේශ විනිමය ගනුදෙනු කිරීම සඳහා බලයලත් පුද්ගලයින්**

විනිමය පාලන පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු බලයලත් වෙළඳුන් ලෙස විදේශ විනිමය ගනුදෙනුවල නියැලීම සඳහා වූ එකම නියෝජිතයා වූ අතර, විදේශ විනිමය පනත මගින් පහත පරිදි පුද්ගල කාණ්ඩ තුනක් හඳුනා ගනිමින් විදේශ විනිමය ගනුදෙනු කිරීම සඳහා වූ අවකාශය පුළුල් කරන ලදී.

අ. **බලයලත් වෙළෙඳුන්:** බලයලත් වෙළඳුන් යටතට බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු යන දෙකම ඇතුළත් වේ. නියමිත දින වන විට පැවති සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවලට, බලයලත් වෙළඳුන් ලෙස ක්‍රියා කිරීම පිණිස මහ බැංකුව විසින් බලය ලබා දෙනු ලැබූ ලෙස සලකනු ලබන අතර, අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා බැංකු බලපත්‍රය නිකුත් කළ දිනයේ සිට බලයලත් වෙළෙන්දකු ලෙස ක්‍රියාකිරීම පිණිස මහ බැංකුව විසින් බලය ලබා දිය හැකිය. නියමිත දින වන විට පැවති සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ මහ බැංකුව විසින් බලය ලබා දෙනු ලබන නව බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත, නිශ්චිතව සඳහන් කරන ලද කාර්යයන් සඳහා විදේශ විනිමය වෙළඳාම් කිරීමට බලයලත් වෙළෙන්දකු ලෙස ක්‍රියාකිරීම පිණිස, මහ බැංකුව විසින් බලය ලබා දියහැකිය.

ආ. **පරිසීමිත වෙළෙඳුන්:** බලයලත් වෙළෙඳුන්ට අමතරව, ඕනෑම වර්ගයකට හෝ වර්ගවලට අයත් තැනැත්තන්ට, අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කරන ලද කාර්යය සඳහා, ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය වෙළඳාම් කිරීම පිණිස, මහ බැංකුව විසින් අවසර දියහැකිය. පරිසීමිත වෙළඳුන් යන්නට, විදේශ විනිමය ගනුදෙනු කිරීම සඳහා බලය ලත්, නියමිත දිනයේ සිටි මුදල් හුවමාරු කරන්නන් සහ, බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු නොවන අනෙකුත් ඕනෑම පුද්ගලයෙක් ඇතුළත් වේ.

ඇ. **බලයලත් වෙළඳුන් සහ පරිසීමිත වෙළඳුන් නොවන අනෙකුත් පුද්ගලයන්:** බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන්නා වූ යම් තැනැත්තකුට, ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිර්දේශ කරනු ලබන අරමුණු සඳහා ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය වෙළඳාම් කිරීම පිණිස මහ බැංකුව විසින් විශේෂ අවසරයක් ලබා දිය හැකිය.

බලයලත් වෙළඳුන්, පරිසීමිත වෙළඳුන් සහ අනෙකුත් අනුමත පුද්ගලයින් විසින්, විදේශ විනිමය ගනුදෙනු සඳහා වන ඉල්ලීම්වල සද්භාවය තහවුරු කිරීමට අවශ්‍ය නිසි පරීක්ෂාවන් සිදු කිරීමෙන් අනතුරුව අදාළ ගනුදෙනු සිදු කළ යුතුය.

**2.4 අනුමත ගනුදෙනු**

විදේශ විනිමය ගනුදෙනු, ජංගම, ප්‍රාග්ධන සහ, අනාගතයේදී පැන නැගිය හැකි 'වෙනත්' ගනුදෙනු ලෙස ක්ෂේත්‍රයේ ගතිකත්වයන් සැලකිල්ලට ගනිමින් පුළුල් ලෙස වර්ගීකරණය කරන ලදී.

අ. **ජංගම ගනුදෙනු:** ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම් ව්‍යවස්ථාවලියේ XXX වන වගන්තියේ (ඈ) ඡේදය අනුව, ජංගම ගනුදෙනු පහත පරිදි වර්ගීකරණය කරන ලද අතර, බලයලත් වෙළඳුන් හා පරිසීමිත වෙළඳුන් හට ලබාදෙන ලද අවසරයන්ට යටත්ව මෙම ගනුදෙනු කරගෙන යා හැක.

(i) විදේශීය වෙළඳාමට, සේවා සහ සාමාන්‍ය කෙටිකාලීන බැංකු සහ ණය පහසුකම් ඇතුළුව ජංගම ව්‍යාපාර හා සම්බන්ධ ගෙවිය යුතු ගෙවීම්,

(ii) ණය මත වන පොලිය ලෙස සහ අනෙකුත් ආයෝජනයන්ගෙන් වන ශුද්ධ ආදායම් ලෙස ගෙවිය යුතු ගෙවීම්,

(iii) ණය හිලව් කිරීම සඳහා හෝ සෘජු ආයෝජන ක්ෂය වීම් සඳහා සීමිත මුදල් ප්‍රමාණයක් ගෙවීම, සහ

(v) පවුල් ජීවන වියදම් සඳහා සීමිත ප්‍රේෂණයන්.

ඉහත අයිතම (iii) හා (iv) විනිමය පාලන පනත යටතේ ජංගම ගනුදෙනු ලෙස සලකනු නොලැබූ අතර ජංගම ගනුදෙනුවල නියැලීම සඳහා බලයලත් වෙළෙඳුන්ට පමණක් අවසර ලබාදී තිබුණි.

ආ. **ප්‍රාග්ධන ගනුදෙනු:** රටවල් අතර සිදුවන ජංගම ගනුදෙනු නොවන ගනුදෙනු ප්‍රාග්ධන ගනුදෙනු ලෙස අර්ථ දක්වනු ලබයි. මුදල් මණ්ඩලයෙන් විමසා සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව, අමාත්‍යවරයා විසින්, ප්‍රාග්ධන ගනුදෙනු වර්ගය හෝ වර්ග සඳහා නියෝග මගින් බලය ලබාදෙයි. අවසරලත් ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධව විදේශ විනිමය වෙළඳාමේ

5

නිරතවීමට සුදුසුකම් ලබන පුද්ගලයන්ට, බලයලත් වෙළෙන්දකු මාර්ගයෙන් හෝ අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් ප්‍රමාණයට, පරිසීමිත වෙළෙන්දකු මාර්ගයෙන්, එම ගනුදෙනු කරගැනීමට හැකියාව ඇත.

ඇ. **අනෙකුත් ගනුදෙනු:** අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන විධාන සහ මාර්ගෝපදේශයන් අනුව සිදු කළහැකි, ජංගම සහ ප්‍රාග්ධන ගනුදෙනු නොවන අනෙකුත් ගනුදෙනු මෙයට ඇතුළත් වේ.

ඈ. පනතේ ප්‍රතිපාදන නොමැතිව බලයලත් වෙළඳුන් සහ පරිසීමිත වෙළඳුන් හරහා ශ්‍රී ලංකාවේ නේවාසික අනෙකුත් පුද්ගලයන්ට ශ්‍රී ලංකා රුපියල් හෝ ශ්‍රී ලංකාවේ ඇති වත්කම් විදේශ විනිමය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත විදේශ විනිමය ගනුදෙනු කිරීමේ හැකියාවක් නොමැත.

ඉ. ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික ඕනෑම පුද්ගලයෙක් විසින්, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර බැංකු ගිණුමක රඳවාගෙන සිටින විදේශ විනිමය/ විදේශ වත්කම් පහත සඳහන් වූ මූලාශ්‍රයන් මගින් ව්‍යුත්පන්න නොවූයේ නම් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත එම පුද්ගලයාගේ ජංගම හෝ ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන් ගෙවීමක් සිදු කිරීම සඳහා යොදා ගත හැක.

(i) රුපියල් බවට පරිවර්තනය කිරීමෙන් හෝ ශ්‍රී ලංකාව තුළ වූ මූල්‍ය හෝ මූර්ත වත්කමක් බැහැර කිරීම හෝ පරිවර්තනය කිරීම මගින් ලබාගත් විදේශ විනිමය/ විදේශ වත්කම් හෝ,

(ii) බලයලත් වෙළඳුන් හෝ පරිසීමිත වෙළඳුන් විසින් කරනු ලබන විදේශ විනිමය ගනුදෙනු ව්‍යාපාර මගින් ලබාගත් විදේශ විනිමය/ විදේශ වත්කම්

මෙවන් ගෙවීමක් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරන්නේ නම් එය බලයලත් වෙළඳුන් හෝ පරිසීමිත වෙළඳුන් හරහා සිදු කළයුතුය.

ඊ. ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකුට යම් විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම හෝ විදේශ විනිමය තම සන්තකයේ හෝ බැංකු ගිණුමක තබා ගැනීම, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් නිර්දේශ කරනු ලැබිය හැකි කාර්යයක් සඳහා පමණක්, එම සීමාවන් දක්වා සිදු කරනු ලැබිය යුතුය.

උ. ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙක් විසින් ශ්‍රී ලංකාවට පහත මූලාශ්‍ර මගින් විදේශ විනිමය ප්‍රේෂණය කිරීමේදී, ප්‍රේෂණය කරනු ලබන මුදල එ.ජ. ඩොලර් මිලියන 1 ක් ඉක්මවන්නේ නම් නියෝගයේ දක්වා ඇති පරිදි ඔහු විසින් ඇමතිවරයා නිර්දේශ කරන ලද ප්‍රේෂණ ගාස්තුවක් පමණක් ගෙවිය යුතුය.

(i) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් විදේශ විනිමය බවට පරිවර්තනය කිරීම මගින් හෝ ශ්‍රී ලංකාව තුළ ඇති වත්කමක් බැහැර කිරීම හෝ පරිවර්තනය කිරීම සිදු නොකිරීම මගින් ලබා ගත් විදේශ විනිමය.

(ii) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයට පත් නොකරන ලද විදේශ විනිමය.

(iii) මුදල් විශුද්ධිකරණය හෝ අල්ලස් හෝ දූෂණ යටතේ වරදක් සිදු කිරීම මගින් ලබා නොගත් දේපළක් සම්බන්ධයෙන් වූ විදේශ විනිමය.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල මෙම මුදල් ආයෝජනය කර ඇත්නම්, එවන් තැනැත්තෙකු ප්‍රේෂණ ගාස්තු ගෙවීමට අවශ්‍ය නොවන අතර, එම මුදල් ශ්‍රී ලංකාවෙන් බැහැර සියරට යැවීම සඳහා කිසිදු සීමාවක් නව පනත මගින් පනවා නොමැත.

### 2.5 දණ්ඩනයන් සහ අභියාචනා ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය

විනිමය පාලන පනත යටතේ, අනුකූල නොවන අවස්ථා අපරාධ නීතිය යටතේ ගැණුන ද, විදේශ විනිමය පනත යටතේ ඒවා සිවිල් නීතිය යටතට ගැනේ. විනිමය පාලන පනතෙහි දණ්ඩනයන් සහ ඒ සම්බන්ධයෙන් වන අභියාචනා ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියෙහි අඩංගු දෑ පහත පරිදි වේ.

අ. ශ්‍රී ලංකා මහ බැංකුවේ තීරණයක් මත අගතියට පත් බලයලත් වෙළෙන්දන්/පරිසීමිත වෙළෙන්දන්/වෙනත් පුද්ගලයන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව සලකා බැලීම සඳහා ඇමතිවරයා විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් ස්ථාපිත කිරීම ඇතුළු විමර්ශන ක්‍රියාවලියක් පැවතීම.

ආ. ඕනෑම බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකුට එරෙහිව ඕනෑම අවස්ථාවක විමර්ශනයක් පැවැත්වීමට සහ දණ්ඩනයන් පැනවීමට, මාස 6 ක් දක්වා ගනුදෙනු කිරීම සීමා කිරීමට/තාවකාලිකව අත්හිටුවීමට හෝ බලපත්‍රය අහෝසි කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ඇත.

ඇ. අදාළ විදේශ විනිමය ප්‍රමාණය හෝ විදේශ වත්කම්වල වටිනාකම නොඉක්මවන අගයක් දඩයක් වශයෙන්

5

ගෙවීමට බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු හට නියම කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ඇත.

ඈ. නීති උල්ලංඝනය කිරීම සිදු කර ඇත්තේ බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු නොවන වෙනත් පුද්ගලයෙකු නම්, රුපියල් මිලියන 1 ක් නොඉක්මවන මුදලක් දඩයක් වශයෙන් නියම කළ හැකිය.

ඉ. ඇමතිවරයාගේ අනුමැතිය සහිතව කාලය දීර්ඝ කිරීමක් සිදු කළහොත් මිස සියලු විමර්ශන සහ පරීක්ෂණ මාස 6 ක් ඇතුළත අවසන් කළයුතුය.

**2.6 සංක්‍රාන්ති විධිවිධාන**

අ. ඉවත් කරන ලද පනත යටතේ පවරන ලද සහ නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේදී අවසන් නොවී පවත්නා සියලු සිවිල් නඩු, අපරාධ නඩු සහ නීති කෘත්‍ය, නියමිත දිනයේ සිට ඉවත් කරන ලද පනත යටතේ වූ සියලු සිවිල් නඩු, අපරාධ නඩු සහ නීති කෘත්‍ය, ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී පනත යටතේ අසා නිම කළ යුතුය.

ආ. ඉවත් කරන ලද පනත යටතේ පවරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේදී අවසන් නොවී පවත්නා වූ සියලු විමර්ශන සහ පරීක්ෂණ නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි ඉවත් කරන ලද පනත යටතේ පවරන ලද විමර්ශන සහ පරීක්ෂණ ලෙස සලකනු ලැබිය යුතු අතර, නියමිත දින සිට මාස 6 ක් ඇතුළත එකී පනත යටතේ අසා සිට නිම කරනු ලැබිය යුතුය.

**3. විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්, නියමයන් සහ විධානයන්**

**3.1 විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද නියෝග**

විදේශ විනිමය පනතෙහි විධිවිධාන ප්‍රකාරව ඇමතිවරයා විසින් පහත සඳහන් පරිදි නියෝග 3 ක් හා නියමයන් 2 ක් නිකුත් කරන ලදී.

**අ) 2017 අංක 01 දරන විදේශ විනිමය (බලයලත් වෙළඳුන් විසින් සිදුකරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝග**

මුදල් රටින් පිටතට ගලායැම් සීමාකිරීම්වලින් තොර වූ සහ, පැහැදිලි ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන් ඇති රටවල්වල ආයෝජනය කිරීමට විදේශ ආයෝජකයෝ වැඩි ඇල්මක් දක්වති. සීමාරහිත මුදල් ගලාඒම් සහ ගලායැම් යන පුළුල් සංකල්පයෙන් නියාමනය කරනු ලබන නව නියෝගවලින් ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කර ඇත්තේ වඩා දැඩි පාලන රාමුවක සිට විදේශ විනිමය ගනුදෙනු සඳහා වන පහසුකම් සැලසීමේ තන්ත්‍රයක් කරා පරිවර්තනය වීම මගින්, ප්‍රාග්ධන ගිණුමට පනවා ඇති සීමා ආදිය තවදුරටත් ලිහිල් කිරීම කෙරෙහිය. නව ප්‍රතිපත්ති ක්‍රියාමර්ගවල ප්‍රධාන අරමුණු වන්නේ ප්‍රතිපත්තිවල පැහැදිලි බව, පාරදෘෂ්‍යභාවය, පාරිභෝගික පහසුව, ආර්ථික නියෝජිතයන් සඳහා ආයෝජන මාර්ග වැඩි කිරීම, ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනුවල සීමා පුළුල් කිරීම සහ පුළුල් සේවාවන් සැපයීම සහතික කිරීම හරහා, නව විදේශ ආයෝජන/ගලාඒම් ආකර්ෂණය කර ගැනීම වේ. මෙම ප්‍රතිපත්තිමය රාමුව යටතේ, මීට පෙර නියාමකයාගේ (මහ බැංකුවේ) ඍජු අනුමැතිය ගතයුතු වූ විදේශ විනිමය ගනුදෙනුවල නියැලීම සඳහා, මහ බැංකුව වෙත නොපැමිණ බලයලත් වෙළඳුන් හට පොදු අවසරයක් ප්‍රදානය කර ඇත. අවහිරතා මග හැරවීම තුළින් මෙවැනි පහසු ක්‍රියාපටිපාටියක් හඳුන්වාදීම, ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි තරඟකාරී ස්වරූපය වඩා ශක්තිමත් කරනු ඇති අතර ලොව අනෙකුත් පාර්ශවයන් සමග ව්‍යාපාර පවත්වා ගැනීමේ පහසුවද වැඩිදියුණු කරනු ලබනු ඇත. ප්‍රධාන වශයෙන් තාක්ෂණය, අලෙවිකරණය, ජාත්‍යන්තර ව්‍යාපාර සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, අදාළ ක්ෂේත්‍රවල ජාත්‍යන්තර විදග්ධතාව ලබා ගැනීම සහ ගෝලීය අගයදාමය සමග සම්බන්ධවීම සඳහා ව්‍යවසායකයන් හට විදේශයන්හි ආයෝජනය පිණිස අවස්ථාවන් නිර්මාණය කිරීමක් ලෙස නියෝග 1 මගින් ගෙවුම් ශේෂයෙහි ප්‍රාග්ධන ගිණුම මත පනවා ඇති සීමා තවදුරටත් ලිහිල් කර ඇත. ඒ අනුව, ප්‍රාග්ධන ගලාඒම් සහ ගලායැම් මත පනවා ඇති සීමාවල සිදු කරන ලද ප්‍රධාන ලිහිල් කිරීම් පහත පරිදි වේ.

**සංඛ්‍යා සටහන වි.ස. 5.1**
**ප්‍රතිමුඛ ආයෝජන සඳහා වන පර්යන්ත සීමාවන් සැසඳීම**

| ආයෝජක කාණ්ඩය | ආයෝජන වර්ගය | | සීමාවන් | |
|---|---|---|---|---|
| | විනිමය පාලන පනත | විදේශ විනිමය පනත | විනිමය පාලන පනත | විදේශ විනිමය පනත |
| කොළඹ කොටස් හුවමාරුවෙහි ලයිස්තුගත ඕනෑම සමාගමක් | • කොටස්<br>• ස්වෛරීත්ව බැඳුම්කර | • කොටස්<br>• ස්වෛරීත්ව බැඳුම්කර<br>• ඒකක<br>• ණය සුරැකුම් | වාර්ෂිකව එ.ජ.ඩොලර් 500,000 | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩොලර් මිලියන 2 |
| කොළඹ කොටස් හුවමාරුවෙහි ලයිස්තුගත නොකළ ඕනෑම සමාගමක් | | | වාර්ෂිකව එ.ජ.ඩොලර් 100,000 | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩොලර් 500,000 |
| ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි ඕනෑම හවුල් ව්‍යාපාරයක් | | | ජීවිත කාලයටම එ.ජ.ඩොලර් 100,000 | ජීවිත කාලයටම එ.ජ.ඩොලර් 300,000 |
| ඕනෑම තනි පුද්ගලයෙක් | | | ජීවිත කාලයටම එ.ජ.ඩොලර් 100,000 | ජීවිත කාලයටම එ.ජ.ඩොලර් 200,000 |
| ඕනෑම සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් | විදේශීය සමාගම් පිහිටුවීම | | වාර්ෂිකව එ.ජ.ඩොලර් 100,000 | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩොලර් 300,000 |

5

**(i) නේවාසිකයන් විසින් සිදුකරන විදේශීය ආයෝජන**

බලයලත් වෙළඳුන් විසින් සපයනු ලබන සේවාවන්ගෙන් ප්‍රතිමුඛ ආයෝජන සඳහා පහසුකම් සලසන අතර, ප්‍රතිමුඛ ප්‍රාග්ධන ගනුදෙනුවල පර්යන්ත සීමා වැඩි කිරීම සහ ප්‍රතිමුඛ ආයෝජන වර්ග පුළුල් කිරීම (සංඛ්‍යා සටහන වි.ස.5.1).

**(ii) අනේවාසිකයන් විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කරන ආයෝජන**

අනේවාසිකයන් සඳහා ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීම සඳහා පෙර අවසරදී තිබූ බලයලත් වෙළඳුන් (බලපත්‍රලාභී වාණිජ බැංකු) සමග කෙරුණු ස්ථාවර තැන්පතුවලට අමතරව, මහ බැංකුව මගින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී විශේෂිත බැංකු බලපත්‍රලාභී වාණිජ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සහ බලපත්‍රලාභී ලීසිං සමාගම්වල ස්ථාවර තැන්පතු ඇතුළත් වන පරිදි පුළුල් කෙරිණි. තවද, ආයෝජකයන් හට ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් ව්‍යවස්ථාපිත ආයතනයක් මගින් නිකුත් කරනු ලබන සුරැකුම්පත්වල, ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත නොකළ සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම්වල කොටස්වල ආයෝජනය කිරීමට දැන් අවස්ථාව හිමිවේ. ස්ථිර පදනමෙන් ශ්‍රී ලංකාව වෙත ප්‍රාග්ධන ප්‍රේෂණ ආකර්ෂණය කර ගැනීමේ දැක්මක් සහිතව, අනාගත ආයෝජකයන් සඳහා විවෘතව පවතින ආයෝජන අවස්ථා පුළුල් කිරීමට හා නව අවස්ථා නිර්මාණය කිරීම සඳහා මෙම පියවර ගනු ලැබිණි.

**(iii) විගාමිකයන්ගේ අරමුදල් මාරු කිරීම**

ශ්‍රී ලාංකික සම්භවයක් ඇති විගාමිකයන් වෙත තවදුරටත් පහසුකම් සැලසීමේ අරමුණින්, දශක ගණනක් පැරණි විගාමික දීමනා සීමාවන් (මූලික හා වාර්ෂික දීමනාවන්) තවදුරටත් වැඩි කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව, අදාළ ලිපිලේඛන බලයලත් වෙළඳුන් විසින් ලබා ගැනීමෙන් පසුව, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්වලට (CTRA) විගාමික අරමුදල් මාරු කිරීමේ අනුමැතිය බලයලත් වෙළඳුන් වෙත සංඛ්‍යා සටහන වි.ස.5.2 සඳහන් පරිදි ලබාදී ඇත.

**සංඛ්‍යා සටහන වි.ස. 5.2**
**විගාමික දීමනාවන්ගේ පර්යන්ත සීමාවන් සංසන්දනය**

| විගාමික දීමනාව පර්යන්ත සීමාවන් | විනිමය පාලන පනත | විදේශ විනිමය පනත |
|---|---|---|
| මූලික විගාමික දීමනාව | එක් පුද්ගලයෙකුට එ.ජ.ඩොලර් 150,000 | එක් පුද්ගලයෙකුට එ.ජ.ඩොලර් 200,000 |
| වාර්ෂික විගාමික දීමනාව | එක් පුද්ගලයෙකුට එ.ජ. ඩොලර් 20,000 | එක් පුද්ගලයෙකුට එ.ජ.ඩොලර් 30,000 |

**(iv) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට ලබා දෙන ණය**

පෙර පැවති ණය යෝජනා ක්‍රම තුනක් ඒකාබද්ධ කොට, විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට තනි ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. විදේශ විනිමය ඉපැයීම් මගින් විගාමික ශ්‍රමිකයන් විසින් ජාතික ආර්ථිකයට සිදු කරනු ලබන ඉහළ දායකත්වය ඇගයීමක් වශයෙන් සහ විදේශ විනිමය ඉපැයීම් ප්‍රවර්ධනය කිරීමට මෙම සරල නියෝග හඳුන්වා දෙන ලදී.

**ආ) 2017 අංක 02 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ගිණුම් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාමට අදාළ) නියෝග**

විනිමය පාලන පනත යටතේ විවෘත කර පවත්වාගෙන ගිය විදේශ මුදල් හා රුපියල් ගිණුම්වල පවතින සංකීර්ණ ව්‍යුහය සරල කිරීම නියෝග අංක 02 හා 03 හි මූලික අරමුණ වී ඇත. එමගින් විනිමය පාලන පනත යටතේ පැවති 17 කට ආසන්න විවිධ වර්ගයේ විදේශ මුදල් ගිණුම් වර්ග සරල බව හා මෙහෙයුම් පහසුව සඳහා නැවත වර්ගීකරණය කරනු ලැබීය.

ප්‍රාග්ධන ගනුදෙනු සඳහා විදේශ විනිමය ගිණුම් සහ රුපියල් ගිණුම් 5 ක් විවෘත කිරීම සහ පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් මෙම නියෝග මගින් ප්‍රතිපාදන සලසා ඇත (සංඛ්‍යා සටහන වි.ස.5.3).

**සංඛ්‍යා සටහන වි.ස. 5.3**
**ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ගිණුම් අතර සංසන්දනය**

| විනිමය පාලන පනත යටතේ වූ ගිණුම් | විදේශ විනිමය පනත යටතේ නැවත නම් කරන ලද ගිණුම් |
|---|---|
| • සුරැකුම්පත් ආයෝජන ගිණුම් (SIAs)<br>• විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් (SFIDAs) | ආමුඛ ආයෝජන ගිණුම් (IIAs) |
| • ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (OIAs) | වෙනසක් නොවී පවතියි |
| • අනේවාසික රුපියල් ගිණුම් (NRRAs)<br>• අනේවාසික අවහිර කළ ගිණුම් (NRBAs)<br>• සංක්‍රමික අවහිර කළ ගිණුම් (MBAs) | ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (CTRAs) |
| • රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFCAs)<br>• රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් (DRAs) | වෙනසක් නොවී පවතියි |

**ඇ) 2017 අංක 03 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගිණුම් ඇරඹීම හා පවත්වාගෙන යාම) නියෝග**

මෙම නියෝග මගින් විනිමය පාලන පනත යටතේ පැවති විදේශ මුදල් ගිණුම් 9 ක් පුළුල් වර්ග දෙකක් යටතට වර්ග කර ඇත (සංඛ්‍යා සටහන වි.ස.5.4).

**සංඛ්‍යා සටහන වි.ස. 5.4**
**විදේශ මුදල් ගිණුම් අතර සංසන්දනය**

| විනිමය පාලන පනත යටතේ වූ ගිණුම් | විදේශ විනිමය පනත යටතේ නැවත නම් කරන ලද ගිණුම් |
|---|---|
| • අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFCs)<br>• නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFCs)<br>• නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RNNFCs)<br>• අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRNNFCs)<br>• අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (FCAISPE)/සේවා නියුක්තීන් සඳහා. | පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCAs) |
| • විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEAs)<br>• විදේශ නැව් සේවා හෝ ගුවන් සේවා නියෝජිතයින් සඳහා වූ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (FCAASA)<br>• ආමුඛ ප්‍රේෂණ බෙදා හැරීමේ ගිණුම් (IRDA)<br>• අන්තර්ජාතික සේවා සැපයුම් කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා විදේශ ව්‍යහාර මුදල් ගිණුම් (FCAISPE) / සේවා යෝජකයන් සඳහා | ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCAs) |

- පශ්චාත් සුනාමි ආමුඛ ප්‍රේෂණ ගිණුම් (PTIRA) විවෘත කිරීම, නව පනත යටතේ අවලංගු කර ඇති අතර, ඒ සඳහා වන ඉල්ලීම් සාමාන්‍ය රුපියල් ගිණුම් යටතේ සලකා බලනු ලැබේ.
- රජය මගින් යෝජිත විශේෂ තැන්පතු පනත ක්‍රියාත්මක වන තුරු, නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RGFCAs), නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් (RGRCAs), ජ්‍යෙෂ්ඨ විදේශ පුරවැසි ස්ථාවර තැන්පතු ගිණුම් (SFNFDAs) සහ ජ්‍යෙෂ්ඨ විදේශ පුරවැසි රුපියල් ගිණුම් (SFNRAs) එපරිද්දෙන්ම පවත්වාගෙන යනු ලැබේ.
- විනිමය පාලන පනත යටතේ දැනටමත් විවෘත කර ඇති විදේශ වාණිජ ණය ගැනීම් ගිණුම්, එම ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගත් ණය සම්පූර්ණයෙන්ම පියවන තුරු පවත්වාගෙන යනු ලැබේ.

**සංඛ්‍යා සටහන වි.ස. 5.5**
**විදේශ ව්‍යවහාර මුදල් රේගුවට ප්‍රකාශ කිරීම සම්බන්ධ පර්යන්ත සීමාවන් සැසඳීම**

| අවස්ථාව | ප්‍රකාශන අවශ්‍යතාවය* | |
|---|---|---|
| | විනිමය පාලන පනත | විදේශ විනිමය පනත |
| පුද්ගලයෙක් ශ්‍රී ලංකාව තුළට ඕනෑම මාධ්‍යයකින් විදේශ විනිමය රැගෙන ඒමේදී | එ.ජ.ඩො. 15,000 ට වැඩි | එ.ජ.ඩො. 15,000 ට වැඩි |
| පුද්ගලයෙක් විදේශ මුදල් නෝට්ටු නැවත රැගෙන යෑමේ බලාපොරොත්තුවෙන් පැමිණීමේදී | එ.ජ.ඩො. 5,000 ට වැඩි | එ.ජ.ඩො. 10,000 ට වැඩි |
| පුද්ගලයෙක් විදේශ විනිමය නෝට්ටු සමග රටින් පිටවීමේදී | එ.ජ.ඩො. 5,000 ට වැඩි | එ.ජ.ඩො. 10,000 ට වැඩි |
| පුද්ගලයෙක් ඕනෑම මාධ්‍යයකින් විදේශ විනිමය රැගෙන යෑමේදී | එ.ජ.ඩො. 10,000 ට වැඩි | එ.ජ.ඩො. 15,000 ට වැඩි |

* ඇ.එ.ජ.ඩොලර් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක්

### 3.2 විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද විධානයන්

**(අ) විදේශ ව්‍යවහාර මුදල් හා ශ්‍රී ලංකා රුපියල් ආනයනය, අපනයනය සහ තමා සන්තකයේ විදේශ මුදල් තබා ගැනීම සම්බන්ධයෙන් වන අරමුණු, සීමාවන්, නියමයන් හා කොන්දේසි තීරණය කරනු ලබන්නා වූ නියමය.**

මෙම නියමයට අනුව, ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ පිටවන ඕනෑම පුද්ගලයෙකුට ඕනෑම ප්‍රමාණයක විදේශ මුදල් ප්‍රමාණයක් පහත සංඛ්‍යා සටහන වි.ස. 5.5 හි දැක්වෙන පරිදි ප්‍රකාශන අවශ්‍යතාවයන්ට යටත්ව රැගෙන යෑමට/ඒමට හැකිය.

**(ආ) පුද්ගලයෙකුගේ නේවාසික තත්ත්වය තීරණය කරනු ලබන්නා වූ නියමය**

විනිමය පාලන පනතට අනුව ස්ථිර නේවාසික ස්ථානය සලකා බැලීම වෙනුවට ශ්‍රී ලංකාව තුළ ගත කරන ලද සමාහාර දින ගණන මත පදනම්ව (එනම් දින 183 හෝ ඊට වැඩි) පුද්ගලයෙකුගේ නේවාසික තත්ත්වය තීරණය කිරීම සඳහා නව නිර්ණායකයක් හඳුන්වා දෙන ලදී. අන්තර්ජාතික ප්‍රමිතීන්ට සහ දේශීය ආදායම් පනත වැනි අදාළ ව්‍යවස්ථා සම්පාදනයන්ට අනුකූල වෙමින් ද පෙර පනත යටතේ නේවාසිකත්වය තීරණය කිරීමට තිබූ ව්‍යාකූලත්වයන් ඉවත් කිරීමේ අරමුණෙන් ද මෙය සිදු කරන ලදී.

5

### 3.3 බලයලත් වෙළඳුන් වෙත නිකුත් කළ විධාන

නියෝග හා නියමයන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව මෙහෙයුම් උපදෙස් ලෙස විධාන 15 ක් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලදී. විදේශ විනිමය පනත යටතේ නිකුත් කළ සියලු නියෝගයන්, නියමයන් සහ විධානයන් වෙත www.dfe.lk වෙබ් අඩවිය හරහා සාමාන්‍ය ජනතාවට පිවිසිය හැක.

## 4. සමාප්ති සටහන

ප්‍රතිපත්ති සම්පාදනය කළද, නීතිමය රාමුවක් පැවතියද, විදේශ විනිමය පනතේ අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම පිණිස ඒවා සඵලාදායීව ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය කෙරේ. නව පනත යටතේ හඳුන්වා දුන් ලිහිල්කරණ හා සරල කිරීමේ නිර්දේශවල අපේක්ෂිත ප්‍රතිඵල බොහෝදුරට රඳා පවතිනුයේ බලයලත් වෙළඳුන් හා පරිසීමිත වෙළඳුන් විසින් අදාළ විධිවිධාන සාර්ථකව ක්‍රියාත්මක කරලීම හා, උනන්දුවක් දක්වන පාර්ශවයන් සමග, කාර්යක්ෂමව හා සඵලදායීව කටයුතු කිරීමට ඔවුන්ට ඇති හැකියාව මතය.

ඊට අමතරව, මෙය නව ප්‍රතිපත්තිමය මුලපිරීමක් බැවින්, කර්මාන්තයේ සිදුවන නිරන්තර වෙනස්වීම් (ගතිකත්වයන්) මත පදනම්ව උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් ලැබෙන ප්‍රතිපෝෂණ කේන්ද්‍ර කර ගනිමින් අඛණ්ඩ සංශෝධන සිදු කිරීම අවශ්‍ය කෙරේ.

---

මූලාශ්‍ර:

ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා
1953 අංක 24 දරන විනිමය පාලන පනත
2017 අංක 12 දරන විදේශ විනිමය පනත
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම් ව්‍යවස්ථාවලිය

5